# බස්නාහිර පළාතේ පළාත් සභාව

## மேல் மாகாண மாகாண சபை

## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2015** මැයි **12** වන අඟහරුවාදා

2015 வைகாசி 12 செவ்வாய்க் கிழமை

Tuesday 12th May 2015

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.49 ට පළාත් සභාව රැස් විය.**

*மு.ப. 09.49 **க்கு சபை கூடியது***

*The Provincial Council met at 09.49 a.m.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.**

*திரு. **பிரதித் தவிசாளர்** [**யசபால கோரலகே** அவர்கள்] ] தலைமை வகித்தார்.*

*Mr. Deputy Chairman [Yasapala Koralage] in the Chair*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයට අනුව අද දින සභාවේ කටයුතු ආරම්භ කිරීමටයි සූදානම් වෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පටන් ගත්තු ගමන් වරප්‍රසාද ප්‍රශ්නයක්. දැන් වේලාව 09.50 යි. අපි තීන්දුවක් ගත්තා 09.30 ට පටන් ගන්න. සභාපතිතුමා නැත්නම් ඔබතුමා ඉන්නවා. ඒක ඔබතුමාගේ රාජකාරිය. ඒක මෙතැන ක්‍රියාත්මක වුණේ නැහැ. නියමිත වේලාවට පටන් ගැනීම අපි ඉදිරියේදී හරි බලාපොරොත්තු වෙනවා. ප්‍රතිපත්තිමය ක්‍රියාදාමයක් හරි කෙරෙන්න ඕනෑ. ඔබතුමන්ලාව ඔය තනතුරුවලට දාලා තියෙන්නේ ඒකටයි. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පෙළපාලිවලටයි, රැස්වීම්වලටයි යන්න නොවෙයි. අපි TV එකෙන් දකිනවා. අදාළ රාජකාරිය කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා දෙපැත්තේම මන්ත්‍රීතුමන්ලා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඒක අපට අවශ්‍ය නැහැ. ඔබතුමා සීට් එකට එන්න ඕනෑ. සභාපතිතුමා පෙරොන්දු වුණා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. අපි දැන් න්‍යාය පත්‍රයේ වැඩ කටයුතුවලට යමු.

# කාරක සභා වාර්තා

## COMMITTEE REPORTS

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

2015.04.29 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාව රැස්වීම් වාර්තාව මම පිළිගන්වනවා.

***අදාළ වාර්තාවේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***

*The Hon. Deputy Chairman declared that the copies of the relevant report are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්

## PETITIONS

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කළුතර දකුණ, නගර සභා නිවස, අංක ඩී 1/3 හි පදිංචි ඩබ්. අතුල සේනාරත්න සහ ඩබ්. මානෙල් සිරිමාවතී යන අයවලුන්ගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කැලණිය, පිලපිටිය, ගෝනගම්පල පාර, ග්‍රීන්විලා, අංක 44 හි පදිංචි නිශාන්ත අබේවික්‍රම යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හොරණ, පානදුර පාර, අංක 151/10 හි පදිංචි ඩබ්.එල්. ජයතිලක, හොරණ,

පානදුර පාර, අංක 151/06 හි පදිංචි එම්.ජේ. කීර්තිවංශ, හොරණ, පානදුර පාර, අංක 151/08 හි පදිංචි එස්. හෙන්දවිතාරන, හොරණ, පානදුර පාර, අංක 151/03 හි පදිංචි බී.ඩී. දිනූජා රූපශ්‍රී, හොරණ, පානදුර පාර, අංක 151/12 හි පදිංචි එන්.ඩී. ගමගේ, හොරණ, පානදුර පාර, අංක 151/25 හි පදිංචි එම්.ජී. කීර්තිවංශ, හොරණ, රත්නපුර පාර, අංක 101 හි පදිංචි රංජිත් ගමගේ යන අයවලුන්ගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා, ප්‍රවෘත්ති හා වෙළඳ අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services, Trade Affairs and Information)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කල් ඉල්ලා සිටිනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු ප්‍රධාන ඇමැතිතුමා කොපමණ කාලයක්ද ඉල්ලා සිටින්නේ? මේක ටිකක් හදිස්සියි. දැන් ඊළඟ එක දෙන්න යන්නේ. දැන් අලුත් තැනක් හදලා, ඒකත් බදු දෙන්න යන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයේ අංක 02 යටතේත මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Electricity and Power, Provincial Roads, Housing and Constructions, Water Supply and Drainage, Social Welfare, Urban and Estate Infractructure Facilities)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සති දෙක කාලයක් කල් ඉල්ලා සිටිනවා. මේ පාර හදන්න කියලා අපේ කණ්ඩායම් රැස්වීමේදී ගරු ප්‍රධාන ඇමැතිතුමා මට කිව්වා. අපේ කැබිනට් මණ්ඩලයේදීත් කිව්වා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේක කඩලා දාලා නම් ගොඩක් කල්. සති දෙක දෙක කල් යන කොට -

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක නවත්වන්න කියලා උපදෙස් දීලා තිබෙනවා. ඊට පස්සේ මම දැන් කථා කරලා තියෙන්නේ ඉක්මනට කරන්න කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කඩලා දාලා තියෙන්නේ. පාරේ යන්න බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

පාර හාරලා තියෙන්නේ. මම බලන්න ගියා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මම දැන් රීති අත්හිටුවලා යෝජනාවක් ගේනවා. මුදල් කොමිෂමෙන් එවලා - මේ අයට කියන්න ඕනෑ වෙලා තිබෙන ප්‍රශ්නය සම්බන්ධව.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

න්‍යාය පත්‍රයේ අංක 03 යටතේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කල් ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කෙටි ප්‍රශ්න ටිකක් තියෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු සපයන්න කල් ඉල්ලා සිටිනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කුරුණෑගල යන්නේ නැතුව හිටියා නම් ඔය උත්තර ටික දෙන්න තිබුණා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

නැහැ, ඔබතුමාත් එක්ක මම පොඩි සාකච්ඡාවක් කළා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොරු කියන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කළේ නැහැයි කිව්වාම ඉවරයි. ඇයි කලබල වෙන්නේ?

## නොපැමිණ සිටීමේ අවසරය
## LEAVE OF ABSENCE

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට මාස 03 ක කාලයක් රැස්වීම්වලට නොපැමිණ සිටීමට අවසර ලබා දිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් සඳහා අවස්ථාව. ඒ යටතේ මම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, තමන්ට නියමිත කාලයම පමණක් පාවිච්චි කරන්න කියලා. මහරගම නගර සභාවේ අකටයුතුකම් පිළිබඳව කරුණු දැක්වීමට රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

## පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා ජනමාධ්‍ය හරහා එතුමාගේ ප්‍රකාශයකදී එතුමා කියලා තිබුණා, ජෝන් අමරතුංග අමාත්‍යතුමා විසින් පළාත් පාලන ආයතන පිළිබඳ දූෂණ සම්බන්ධව සොයා බැලීමක් කරන්න අවශ්‍යතාවයක් නැහැ. මම ප්‍රධාන ඇමැතිවරයා. ඒ පිළිබඳව මම සොයා බැලීමක් කරන්නම්. ඒ නිසා මට

[ගරු රොඩ්නි රුඩොල්ෆ් **ෆ්‍රේසර්**]

කියන්න. මම ඒවා පිළිබඳ සොයා බැලීමක් කරන්නම් කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ සභාවටත් කිහිප අවස්ථාවකදීම ඉදිරිපත් කළා මහරගම නගර සභාව සහ ඒ ආශ්‍රිතව සිදු වන්නා වූ මූල්‍යමය අකටයුතුකම් සහ තමන්ගේ බලය ඉතාමත් අනිසි ආකාරයෙන් පාවිච්චි කරමින් කරන්නා වූ කටයුතු කිහිපයක් පිළිබඳව. ඒ පිළිබඳව මේ වනවිටත් කොමසාරිස්තුමියටත් මම දැනුම් දීමක් කළා. මේ වනවිටත් කිසිදු සොයා බැලීමක් කරලා නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වනවිට මහරගම නගර සභාව හරහා විශාල ආකාරයේ මූල්‍යමය කටයුතු නිසියාකාරයට සිදු නොවන අවස්ථාවක් තිබෙන්නේ. මම ලංකාදීප පුවත්පතේ දැක්කා. ගරු ප්‍රධාන ඇමැතිතුමා මේක දකින්න ඇති.

*"මහරගම නගර සභාවේ දේපළ තහනම් කිරීමේ නිලධාරීන් පත් කර ඇත්තේ නීති විරෝධීවයි."*

සභාපතිතුමිය කියනවා, ස්ථිර සේවකයෙක් නිසා ගැටළුවක් නැහැ. එතකොට මේ සෞඛ්‍ය, ඩෙංගු කටයුතු සඳහා මෙතුමියගේ ආයතනයට කම්කරුවන් ලෙස බඳවා ගන්නවා විශාල ප්‍රමාණයක්. තමන්ගේ අනිසි බලය පාවිච්චි කරලා. කම්කරුවන් හැටියට බඳවා ගත්තු අයව නිසි ව්‍යාපෘති සඳහා යොදවන්නේ නැතුව ඒ අයව කාර්යාලවලට දාගන්නවා. සමහර විට සේවකයින් අඩුකම නිසා ඇතැම් විට මේ දේ සිද්ධ වෙන්නත් පුළුවන්. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමිය ප්‍රකාශ කරලා තිබෙනවා එතුමියගේ ප්‍රකාශයේ,

*"මේ සමගම අදහස් දක්වමින් මහරගම නගර සභාවේ සභාපතිනී කාන්ති කොඩිකාර මහත්මිය කීවේ දේපළ තහනම් කිරීමේ නිලධාරීන් දැනට තිබෙන හිඟ වරිපනම් බදු එකතු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන නිසා අවශ්‍ය වේලාවට අවශ්‍ය වශයෙන් මුදල් එකතු නොවන බැවින් සභාපති ලෙස තමන්ට හිමි බලය පාවිච්චි කරලා එහෙම අය පත් කර ගත්තාය"* කියලා.

මේකේදී කියනවා, මෙම නිලධාරීන් නගර සභාවේ ස්ථිර සේවකයින් නිසා අත්තිකාරම් තැන්පත් තබා ගැනීම අවශ්‍ය නැහැයි කියලා. මම ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමක් කරනවා මගේ මතකය හරි නම් මුදල් සංග්‍රහයේ 288 වන වගන්තියේ තිබෙනවා, මූල්‍යමය කටයුතුවල කිසියම් ආකාරයකින් යම් තැනැත්තෙක්, රජයේ නිලධාරියෙක් නියැලෙනවා නම් ඒ නියැලෙන තැනැත්තා අනිවාර්යයෙන්ම අත්තිකාරම් මුදලක් තබා ඒ දේ කළ යුතුයි කියලා. ඇපකරයකට යට විය යුතුයි කියලා. නගර සභාව තුළ මම සභාගත කිරීමකුත් කළා. ඇතැම් අවස්ථාවල අයකැමියන් හැටියට වැඩ කටයුතු කරන්නේ කනතුවල වැඩ කරන සේවකයෝ. කැෂියර් කෙනෙක් නැති වුණාම කනත්තේ වැඩ කරන සේවකයා පඩි ගෙවන්න දානවා කැෂියර් කුඩුවට.

ඒ වාගේම තමයි මුදල් අවභාවිතය පිළිබඳව විශාල ගැටළුවක් තිබෙනවා. මේ වනවිට කිසිදු ප්‍රමිතියකින් තොරව පාරවල් හදාගෙන හදාගෙන යනවා. රීමික්ස්ද මොකක්ද කියලා එකක් තියෙනවා. එනවා, වාහනේ ගේනවා. වාහනේ ගෙනැල්ලා ඉවර වෙලා - පාර නැවත සකස් කිරීමක් නිසියාකාරව සිද්ධ කරන්නේ නැහැ. බවුසරය ගෙනැල්ලා ඔහේ හලාගෙන, හලාගෙන ගියා. පැය භාගයකින් පැයකින් පාරේ කටයුතු ඉවරයි. ඒවා නැවත සොයා බැලීමක් කරන්නේ නැහැ. ඒ නිසා මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කිරීමක් කරනවා. මීට පෙර මම කරුණු කිහිපයක් ඉදිරිපත් කළා. මේ මුදල් අවභාවිතයේදී - අපටත් ඕනෑ නම් පුළුවන් ෆයිල් එකක් අරගෙන යන්න. මොකද, මහරගම නගර සභාවේ සභාපතිවරයා හන්දියේ තිබෙන ඔරලෝසු කණුව කිසිදු මුදලක් අය කර ගැනීමකින් තොරව පුද්ගලික ආයතනයකට දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරන්නේ, මේ ඔරලෝසු කණුව ගත්තු පුද්ගලයෝ ලක්ෂ 30 කට පිටට දීලා තිබෙනවා. මම ගිය සැරේත් ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඒක ඉදිරිපත් කළා. නමුත් ඒ පිළිබඳව සොයා බැලීමක් කළේ නැහැ. හැබැයි කොමසාරිස්තුමියට ඉදිරිපත් කළා. කොමසාරිස්තුමිය හරහා මේ දේ සිදු වෙලා නැහැ.

මේ දවස්වල අපේ මහරගම පොළ තියෙනවා. මම හිතන්නේ මොකක් හරි හේතුවක් නිසා ඒක තාම විවෘත කරලා නැහැ. නමුත් මේ පොළේ යම් යම් කොටස් බෙදා

දීමේදී පවා නිසි කටයුත්තක් සිදු වෙනවා කියලා දැන ගන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම මේ සභාවේ අවධානය යොමු කිරීමක් කරනවා. පළාත් පාලන ආයතන තුළ සමහර විට 15 වැනිදා වනකොට මේවා විසුරුවා හැරීමක් කරන්නත් ඉඩ තිබෙනවා. ඊට පෙර ඇතැම් ආයතන, බලධාරීන් තමන්ගේ ආයතන තුළ තිබෙන මුදල් නිසි ප්‍රමිතියකින් තොරව ඕනෑ ඕනෑ ව්‍යාපෘති සඳහා වෙන් කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ මුදල් අවභාවිතය පිළිබඳව සොයා බලන්නය කියලා මෙම සභාවෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බස්නාහිර පළාත් සභාවේ රෝහල් ගොඩනැගිලිවල අවධානම් තත්ත්වය පිළිබඳව කරුණු දැක්වීමට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව තිබෙනවා. ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට මාස හය හතකට පෙර අපි විශේෂයෙන්ම විපක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරු ගිහිල්ලා මීගමු රෝහලේ අධීක්ෂණ කටයුත්තක් කළා. ඒ අවස්ථාවේදී දැන ගත්තු කරුණු ටික අපි මෙම පළාත් සභාවේ ඇමතිවරයාට ඉදිරිපත් කරලා තිබෙනවා. අද වනකොටත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට තවම මේකට විසඳුමක් ලැබිලා නැහැ. විශේෂයෙන්ම පසුගිය කාලය තුළ මාධ්‍ය තුළින් ඒ වාගේම විද්‍යුත් මාධ්‍ය, රූපවාහිනී තුළින් මේ රෝහල් ගැන අවධානය යොමු කරලා තිබුණා. අද වනකොට මීගමුව පමණක් නොවෙයි. ජා-ඇළ රෝහලේත් ගොඩනැගිල්ල සම්බන්ධයෙන් අවධානම් තත්ත්වයක් පවතිනවා. ඒ අවධානම් තත්ත්වයේ පවතින ගොඩනැගිලි රාශියක් තිබෙනවා. අද මේවා කඩාගෙන වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා මේකට විසඳුමක්, විකල්පයක් ඉතාමත් හදිසියේ අවශ්‍ය වෙලා තිබෙන මොහොතක - මම හිතන්නේ අද බස්නාහිර පළාතේ සෞඛ්‍ය ඇමැතිතුමා මෙතැන නැහැ. නමුත් එතුමාගේ අවධානයට යොමු වෙලා තිබෙනවා, මේ සියලුම කරුණු කාරණා ටික. අද වනකල් මේකට පිළියමක් ලැබිලා නැහැ. ඒක නිසා මේ ගොඩනැගිල්ලක් කඩාගෙන වැටුණොත් දහස් ගණනක් රෝගීන්, ඒ වාගේම රෝගීන් බලන්න එන අය, හෙදියන්, දොස්තරවරු මේ සියලු දෙනාගේම ජීවිත ඉතාමත් අවධානම් තත්ත්වයක තිබෙන්නේ. ඒක නිසා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම මීගමුව රෝහලටත්, ජා-ඇළ රෝහලටත් ගිහිල්ලා පොඩ්ඩක් නිරීක්ෂණයක් කරලා බලන්න කියලා. කොපමණ අවධානම් තත්ත්වයක් තිබෙනවාද කියලා. ජා-ඇළ රෝහලේ Toilet pit එක කැඩිලා වැටිලා මාස තුනක් වහලා තිබුණා. බබාලා හම්බ වෙන්න ඉන්න අම්මලාට යන්න බැරුව මාස තුනක් වහලා තිබුණා. ඉතින් මේ අවධානම් තත්ත්වය නිසා අද ඉතාමත් අපහසුතාවයට පත් වෙලා තිබෙනවා. සෞඛ්‍ය ඇමැතිතුමා නැහැ. මට කරන්න දෙයක් නැහැ. මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරනවා. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අමාත්‍ය මණ්ඩලයේ ඉන්න අමාත්‍යවරයෙක් හැටියට සෞඛ්‍ය ඇමැතිතුමාව දැනුවත් කරලා වහාම යම් මුදලක් මේ සඳහා වෙන් කරලා මෙම රෝහල් දෙක යථා තත්ත්වයට පත් කරන්න අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වන අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු පත්වීම් ලබා දීමේදී පළාත තුළ පදිංචි පත්වීම්ලාභීන් සඳහා පත්වීම් ලබා දීම සම්බන්ධව කරුණු දැක්වීමට ජෙමිල් මරික්කාර් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව තිබෙනවා. ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

බෙහොම ස්තුතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. පසුගිය 08 වැනිදාත්, 03 වැනිදාත් උපාධිධාරී ගුරු පත්වීම් ගණනාවක් ලබා දුන්නා. මම හිතන්නේ ප්‍රධාන ඇමැතිතුමාගෙන් නොවෙයි ඒවා ලැබුණේ. මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. දැන් බස්නාහිර පළාත් සභාවෙන් ගුරු පත්වීම් ලබා දීලා තිබෙනවා. ඒ පිළිබඳව ගරු ප්‍රධාන ඇමැතිතුමාටත්, අදාළ අමාත්‍යතුමාටත් මම මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. මේ වනකොට බස්නාහිර පළාත් සභාවේ උපාධිධාරීන්ගේ ගුරු පත්වීම් හිඟයක් තිබෙන නිසා පළාතෙන් පිට උපාධිධාරීන්ට පත්වීම් ලබා දීමට මේ අවස්ථාවේදී පිඹුරුපත් සකස් වෙමින් පවතිනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, දෙමළ විෂයයටද, අනෙක් විෂයන්ටද?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

දෙමළ මාධ්‍ය. ඒ නිසා ඔබතුමා හරහා ගරු ප්‍රධාන ඇමැතිතුමාගේත් මේ සභාවේත් අවධානයට යොමු කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. බස්නාහිර පළාතේ අභ්‍යාසලාභී ගුරුවරුන් මම හිතන්නේ දෙසියය ගණනක් දෙමළ මාධ්‍යයට ඉල්ලුම්පත් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම 2014 වසරේ නැත්නම් 2015 වසරේ උපාධිධාරීන් හැටියට සමත් වුණු Conver Cation අවසන් නොකරපු අයත් ඉල්ලුම්පත් දාලා තිබෙනවා. බස්නාහිර පළාතේ ජනතාවට විශාල පාඩුවක් වෙනවා, පිට පළාත්වලින් ගත්තාම. 2010, 2011, 2012 වසරවල පූර්වාදර්ශයක් හැටියට අපට ගන්න පුළුවන්. මේ ආකාරයෙන් පළාතේ ගුරුවරුන්ට පත්වීම් ලබා දෙන්නට අවස්ථාව ලැබුණා. ඒ පූර්වාදර්ශය ගරු ප්‍රධාන ඇමැතිතුමා දන්නවා ඇති. ඒ නිසා මේ සභාවේ අවධානය යොමු කරලා ආණ්ඩුකාරතුමාගේ අවධානයත් යොමු කරනවා. හිටපු ආණ්ඩුකාරතුමාටත් ස්තුතිවන්ත වෙනවා ඒ පූර්වාදර්ශය අපට ලබා දීම පිළිබඳව. ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළුව. මේ වතාවේදීත් ඒ පූර්වාදර්ශයටම බස්නාහිර පළාත් සභාව තුළ සිටින සියලුම උපාධිධාරී අපේක්ෂිත දරුවන්ටත්, අභ්‍යාසලාභී ගුරුවරුන්ටත්, ඒ වාගේම විභාගයට පෙනී සිටින අනෙකුත් දරුවන්ටත් - සමත් වුණු ඒ දරුවන් කොන් කරලා තිබෙනවා. ගුරු පත්වීම් ලබා නොදීම පිළිබඳව. ඒ නිසා ඒ අයගේ -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා කියන දේ පැහැදිලි නැහැ. සමත් වුණු අය කොන් කරලා තිබෙන එක.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

සමහර විෂයන් තිබෙන නිසා ඒ අයව -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

දෙමළ විෂයයද? අනෙක් විෂයන් එක්කද?

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

දෙමළ මාධ්‍ය. එය නිවැරැදි නම් ප්‍රශ්නයක් නැහැ ගරු ප්‍රධාන ඇමැතිතුමනි. නමුත් අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ, මේ බස්නාහිර පළාතේම දරුවන්ට ඒ අවස්ථාව ලබා දීම අවශ්‍යයි කියන එකයි. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දෙමළ මාධ්‍ය විද්‍යාල්පතිවරුන්ගේ අපට විශාල හිඟයක් තිබෙනවා. සහිරා විද්‍යාලයට නැහැ. ජීලාන් මහා විද්‍යාලයේ නැහැ. පාසියතුල් නස්ලියා මහා විද්‍යාලයට නැහැ. බේරුවල සිංහල මාධ්‍ය පාසල්වලටත් විදුහල්පතිවරුන්ගේ හිඟයක් තිබෙනවා. මේ පුරප්පාඩු ටිකත් පුරවා දෙන්න කියන ඉල්ලීම මම මේ සභාවේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම දෙමළ මාධ්‍යවල සිංහල මාධ්‍ය විෂයයන් උගන්වන පාසල්වල -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කෙටියෙන් ගැටළුව ඉදිරිපත් කරනවා නම් ගරු ප්‍රධාන ඇමැතිතුමගෙන් පිළිතුරු ලබා දෙන්න පුළුවන්.

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

සිංහල මාධ්‍ය විෂයය උගන්වන මුස්ලිම් පාසල්වල සිංහල භාෂාව ඇතුළුව සිංහල මාධ්‍ය ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනවා. ඒ නිසා දෙමළ, මුස්ලිම් විද්‍යාලවල සිංහල මාධ්‍ය උගන්වන්න සිංහල මාධ්‍ය ගුරුවරුන් පත් කරන්න කියන ආයාචනය මේ අවස්ථාවේදී ඔබතුමාට කරනවා. විදුහල්පතිවරුන්ගේ අඩුපාඩු තිබෙන ඒවා සපුරා දෙන්න කියන එක ඉල්ලමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා මගේ නම සහ අමාත්‍යාංශය ප්‍රකාශ කරලා ප්‍රකාශයක් කළ නිසා 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 2014 විභාගය තියන්න කලින් 2011 ගුරු විභාගය තිබුණා. ගුරු විභාගයේදී දෙමළ විෂයය සමත් වුණු සියලුම අයට අපි බස්නාහිර පළාත තුළ පත්වීම් දුන්නා. ඊට අමතරව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇති වුණු පුරප්පාඩු නිසා අපි විභාගය ඉල්ලන්නේ නැතුව නමුත් උපාධිය අරගෙන තිබුණු දෙමළ මාධ්‍ය ගුරුවරු අටසිය

ගණනක් එකපාර බඳවා ගත්තා. මම හිතන්නේ, මේ මන්ත්‍රීවරු සහභාගී වෙලා එකපාර බඳවා ගත්තා. ඊට පස්සේ අපට පුවත්පත්වල දැන්වීම් පළ කළත් බඳවා ගන්න දෙමළ ගුරුවරු හිටියේ නැහැ. ඊට පස්සේ අපි කරපු දේ තමයි පුරප්පාඩු තිබෙන ඉස්කෝල නම් කරලා පිට පළාත්වලින් ගුරුවරුන් බඳවා ගන්න කටයුතු කළා. හැබැයි 2014 විභාගය තිබ්බ දවසේ ඉඳලා මේ වනකල් ගුරුවරු බඳවා ගැනීමට කටයුතු කළේ නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ ගුරු විභාගයෙන් සමත් වුණු ගුරුවරු ඉන්නවා. උපාධිධාරී ළමයි ඉන්නවා. ඒ අයට ප්‍රමුඛතාව දෙනවා. අපි මේ වෙලාවේ පිට පළාත්වලින් බඳවා ගන්න කටයුතු කරන්නේ නැහැ. ඒ අයට ප්‍රමුඛතාවය දීලා මේ වනකොට අමාත්‍යාංශයෙන් ඒ පුරප්පාඩු ටික හඳුනාගෙන ඒ අයව දෙමළ පුරප්පාඩුවලට බඳවා ගන්න කටයුතු කරලා තිබෙනවා. ඊට පස්සේ ඒ පත්වීම් අවසන් වුණාට පස්සේ අපි නැවත - මොකද, එක පුවත්පත් දැන්වීමක් දාලා සියලු දෙනා බඳවා ගන්න පෙර අපට තවත් පුවත්පත් දැන්වීමක් දාලා කරන්න බැහැ. එතකොට ගැටළුවක් මතු වෙනවා. පරිපාලනමය සහ ප්‍රායෝගිකව. අනෙක් අයට නඩු මාර්ගයට වුණත් යන්න පුළුවන්. ඒ නිසා මේ දෙමළ ගුරුවරු සියලු දෙනා බඳවා ගත්තාට පසු පළාත් සභාව තුළ උපාධිය අරගෙන විභාගය නොලියපු හරි, පසුව උපාධිය ලැබුණු ළමයින්ටත් ඒ අවස්ථාව දෙනවා. එහෙමත් දීලා පුරප්පාඩු ඇති වුණොත් පමණයි අපි පිටින් ගන්නේ. ඒ නිසා මොනම හේතුවක් නිසාවත්, අපේ පළාත්වල අදාළ විෂයට ගුරුවරු ඉන්නවා නම්, පිට පළාත්වලින් බඳවා ගන්න අපි කටයුතු කරන්නේ නැහැයි කියන පණිවිඩය දෙනවා.

විදුහල්පතිවරු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා මට මැදිහත් වෙන්න බැරි, විදුහල්පති පත්වීම් දෙන්න වෙන්නේ මධ්‍යම රජයෙන්. අද අපේ විදුහල්පතිවරුන්ගේ විශාල ගුරු හිඟයක් තිබෙනවා. ඒ හිඟය පියවන්න කියලා - ඒක මේ ආණ්ඩුව ආවට පස්සේ නොවෙයි. අපේ කාලයේ ඉඳලාම ඒ හිඟය තියෙනවා. නමුත් ඒකට වැඩ පිළිවෙළක් සකස් කරලා පසුගිය කාලයේ විදුහල්පති පත්වීම් දුන්නා. නමුත් දෙමළ විෂයයට අදාළව එන ප්‍රමාණය අඩුයි. මම කනගාටු වෙනවා. ඒ කාලේ සම්මුඛ පරීක්ෂණ තියලා විදුහල්පති පත්වීම් දීපු අයව අපෙන් විමසීමක් නොකර රේඛීය අමාත්‍යාංශයෙන් ඒ අයව ජාතික පාසල්වලට බඳවාගෙන තිබුණා. ඒකට අපි අපේ විරුද්ධතාවය ප්‍රකාශය කළා. මොකද, අපේ ඉන්න අයව මධ්‍යම රජයේ පුරප්පාඩුවලට අරගෙන අපේ පාසල් කඩා වට්ටන වැඩ පිළිවෙළකට යනවා. ඒ නිසා අපි ඒකට විරෝධය පළ කරලා තිබෙනවා. මේ වනකොට ජාතික පාසල්වලට ගුරුවරු නිදහස් කිරීම පවා නවත්වලා තිබෙනවා. ගුරු පුරප්පාඩු තිබෙන විෂයයන්වලට. ඒ නිසා පිට පළාත්වලින් ගන්නේ නැහැයි කියන සාක්ෂිය දෙන ගමන්, විදුහල්පති ප්‍රශ්නය මධ්‍යම රජයෙන් විසඳාගත යුතුයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මුල්ලේරියාව සන්ෆලවර් විලේජ් ආයතනය පිළිබඳව මතු වී ඇති ගැටළු සහගත තත්ත්වය සම්බන්ධව කරුණු දැක්වීමට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 04 ක කලායක් ලබා දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ස්තූතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. සන්ෆලවර් විලේජ් කියලා ආයතනයක් මුල්ලේරියාව ප්‍රදේශයේ තිබෙනවා. මේ ආයතනය 1990 දී එවකට කොලොන්නාවේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසිංහ මල්ලිමාරච්චි මහතාගේ මැදිහත්වීමෙන්, ඒ වාගේම ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා විසින් ගැසට් කරලා පසුව 1995 දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජනාධිපතිතුමිය ඔප්පුවකින් පවරනවා අවුරුදු 30 ක බද්දට සන්ෆලවර් විලේජ් කියන ආයතනය. මේ ආයතනයේ අරමුණ වෙන්නේ ආබාධිත දරුවන් පුනරුත්ථාපනය කිරීම. ඇත්ත වශයෙන්ම මේ පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙන් පසුගිය කාලය පුරාම ළමුන් විශාල ප්‍රමාණයක් පුනරුත්ථාපනය කරලා තිබෙනවා. විශේෂයෙන්ම මේක ගම්මානයක් ලෙසයි පවත්වාගෙන යන්නේ. පසුගිය කාලයේ මෙහි නඩත්තු කටයුතු කෙරුණේ විදේශ ආධාරවලින්. නමුත් විදේශ ආධාර නතර වුණාට පස්සේ මේ ආයතනයේ පරිපාලනය සහ මේකේ පුහුණුවන දරුවන් එකතු වෙලා විධිමත් ක්‍රමයකට මේකට ආදායම් ලැබෙන වැඩ පිළිවෙළක් සකස් කරගෙන මේක පවත්වාගෙන යනවා. විශේෂයෙන් කියන්න ඕනෑ, මේ වනකොට මේකේ 25 දෙනෙක් වැඩ කරනවා. ළමයින් 18 දෙනෙක් ඉන්නවා. දෙමව්පියොත් යනවා එනවා. ඇතැම් වෙලාවට පවුල් පිටින් මෙතැන නැවතිලා ළමයින්ගේ පුනරුත්ථාපන කටයුතු කරනවා. මේක විශාල

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

සේවයක් කරන ආයතනයක්. නමුත් පසුගිය කාලයේ අලුතෙන් තීරණයක් අරගෙන තිබෙනවා මෙත් සෙවණ කියන ආයතනයේ භූමිය ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට ලබා දෙන්න ඕනෑ නිසා මෙත් සෙවණ ආයතනයේ ඉන්න අය මෙම ස්ථානයට ගෙනැල්ලා දාන්න. එතකොට මෙතැන ප්‍රශ්නය මතු වෙන්නේ, එක පැත්තකින් මෙත් සෙවණට ඇතුළත් කරන අයත් මේකේ පුනරුත්ථාපනය වන අයත් අතර විශාල වෙනසක් තිබෙනවා. පළාත් රාජ්‍ය ශිෂුම් කාරක සභාවේ සාමාජිකයෙක් විධියට මම මෙත් සෙවණට ගිහිල්ලා තියෙනවා. මම දැකලා තිබෙනවා, ඒ නිවර්ථන නිවාසයේ ඉන්න අය පිළිබඳව. ඔවුන්ගේ දුර්වලකම් පිළිබඳව. විශේෂයෙන්ම මේ වාගේ පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට - ගංගොඩවිල තිබෙන මෙත් සෙවණ ආයතනය එතැනින් ඉවත් කරලා ඒ භූමිය විශ්ව විද්‍යාලයට දුන්නාට අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි විශ්ව විද්‍යාලයට ඒ භූමිය දෙනවා කියලා මෙත් සෙවණේ ඉන්න මේ ලෙඩ ටික ඔක්කෝම ගෙනැල්ලා මුල්ලේරියාවේ සන්ෆලවර් මධ්‍යස්ථානයට දාන්න හදනවා නම් ඒක බරපතළ අසාධාරණයක්.

මොකද, අවුරුදු 30 කට මේ ඉඩම බද්දට පවරලා තිබෙන්නේ. හදිසියේ මේ පවරා ගැනීම සිද්ධ කිරීම සඳහා යම් ස්ථානීය විශ්ලේෂණයක්, ඇගයීමක් කරලා තිබෙනවා සමාජ සේවා අධ්‍යක්ෂවරිය, ශිරෝමාලී මහත්මිය. එතුමිය මේ ආයතනය පිළිබඳව ඉහළට දීලා තියෙන්නේ වැරැදි චිත්‍රයක්. ඒ නිසා මම ඔබතුමා මාර්ගයෙන් ගරු ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේකට මැදිහත් වෙන්න. මේ අසාධාරණය කරන්න දෙන්න එපා. දරුවන් පුනරුත්ථාපන කටයුතු කරන මේ ආයතනය විනාශ කරන්න දෙන්න එපා. එහි ආරක්ෂාව සඳහා ගත හැකි පියවර ගන්න. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමාටත් මේ පිළිබඳව ලිපියක් ලියලා තිබෙනවා. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා ඉඩම් අමාත්‍යාංශයට ලියලා තිබෙනවා මේ පිළිබඳව සොයා බලන්න කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔක්කෝම කුණු බේරුවල් බොක්කට වාගේ හැම කුණු ගොඩම කොලොන්නාවට ගෙනැල්ලා දාන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒක නිසා කරුණාකරලා ගරු ඇමැතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, මේ අසාධාරණය නවත්වන්න. මෙත් සෙවණ පුළුවන් නම් වෙනත් තැනකට ගෙන යන්න. කොලොන්නාවේ සන්ෆලවර් විලේජ් එකට ගෙනැල්ලා දාලා මේ පරිසරය, මේ නිවස, මේ පවුල, මේ කුටුම්බය විනාශ කරන්න ඉඩ දෙන්න එපා කියලා මම මේ සභාවෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ වෙලාව ලබා දීම පිළිබඳව. විශේෂයෙන්ම අපේ රටේ මහත් ආන්දෝලනයකට තුඩු දීපු, ඒ වාගේම පසුගිය වකවානුව තුළ රට පුරා කථාබහට ලක් වුණු හංවැල්ල, තුන්නාන රබර් ප්‍රඩක්ට්ස් ආයතනය පිළිබඳව තමයි මගේ ප්‍රකාශය මම මේ කරන්නේ. ඔබතුමා දන්නවා තුන්නාන, රබර් ප්‍රඩක්ට්ස් ආයතනයේ ප්‍රශ්නය රතුපස්වල සිද්ධිය වාගේම රටේ මහා කථාබහට ලක් වුණු සිද්ධියක්. ජනතාව දශක එකහාමාරකට ආසන්න කාලයක් තමන්ගේ ජීවත් වීමේ අයිතිය වෙනුවෙන් සටන් කරමින් ඉදිරියට ගෙන ගිය අරගලයක් තමයි තුන්නාන රබර් ප්‍රඩක්ට්ස් ආයතනයේ අරගලය අපට සඳහන් කළ යුතු වෙන්නේ. විශේෂයෙන් මම මේ ප්‍රකාශය කරන්නේ ඔවුන් මේ අරගලය පටන් ගත්ත දවස්වල ඉඳලා පසුගිය ඉරිදා ඒ කියන්නේ 10 වැනිදා ඒ අය තුන්නාන රබර් ප්‍රඩක්ට්ස් ආයතනය ඉස්සරහා තුන්නාන ජනතාව කරපු සාමකාමී උද්ඝෝෂණය දක්වාම ඒ ජනතාවත් එක්ක රැඳුනු, දේශපාලන වාසි, භේදවලින් තොරව මනුෂ්‍යත්වයේ නාමයෙන් ඒ ජනතාවත් එක්ක හිටපු කෙනෙක් විධියට ඉතාමත්ම සන්තෝෂයකින් යුතුව තමයි අද මේ ප්‍රකාශය කරන්නේ. විශේෂයෙන් ඒ සන්තෝෂයට කාරණාව තමයි, ඔබතුමා දන්නවා මේ ප්‍රශ්නය දිගින් දිගට ඇදී යද්දී ඒකේ විශාල ප්‍රශ්න ගැටළු ඇති වුණා. විශේෂයෙන් අවසාන අරගලයක් සිද්ධ වුණු වෙලාවේ ජනතාව කරපු උද්ඝෝෂණයක් වෙලාවේ බොරැල්ලේ පොලීසියේ ස්ථානාධිපතිතුමා - ප්‍රධාන පොලිස් පරීක්ෂක ප්‍රසාද් සිරිවර්ධන මහත්මයාගේ ජීවිතය නැති වුණා. අපි ඒ පිළිබඳව ඉතාම කනගාටු වෙනවා. ඒ වාගේම ජනතාව විශාල හිරිහැරවලට භාජනය වුනා. පොලීසිය සහ විවිධ ආයතනවල. ඒ සියල්ල මත තමයි මේ අරගලය ඉස්සරහාට අරගෙන ගියේ. අද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතාව විශාල ජයග්‍රහණයක් ලබලා තිබෙනවා. විශේෂයෙන් මේ රටේ අධිකරණය ඉතාම සාධාරණ සහ යුක්ති සහගත තීන්දුවක් ලබලා දීලා තිබෙනවා. ඒ තීන්දුව නිසා අද ඒ ප්‍රදේශයේ ජනතාවට නිදහසේ ජීවත් වීමේ අයිතිය ලැබෙමින් තිබෙනවා.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රබර් කර්මාන්ත ශාලාව නිසා ජනතාව ප්‍රශ්න ගණනාවක් කිව්වා. එකක් තමයි ඔවුන්ගේ ළිං ජලය සහ ප්‍රජා ජල ව්‍යාපෘති හරහා ඔවුන් පාවිච්චි කරන ජලය අපිරිසිදු වෙලා තිබෙන නිසා ඔවුන්ට පිරිසිදු පානීය ජලය ලැබෙන්නේ නැහැයි කියන කාරණය. ඒ වාගේම ප්‍රදේශයේ ළිං ජලය, මතුපිට ජලය භාවිතයෙන් සාර්ථක ලෙස කෘෂිකාර්මික කටයුතු කර ගෙන යන්න බැහැයි කියන කාරණය. ඒ වාගේම ජනතාව විවිධ රෝග තත්ත්වයන්ට පත් වෙනවා කියන කාරණය. විශේෂයෙන්ම ශ්වසන ආබාධ, හුස්ම ගැනීමේ අපහසුතා, හිම්දිරියේ දැස්වල ඇති වන වේදනාව, විෂ නිසා හතිය, කැස්ස ආදී රෝග හට ගැනීම. ඒ වාගේම වකුගඩු ආශ්‍රිත රෝගවලට, උදරය ආශ්‍රිත රෝගවලට, අක්මා ආශ්‍රිත රෝගවලට භාජනය වීම. ඒ වාගේම කර්මාන්ත ශාලාව ආසන්නයේ වෙසෙන ජනතාවට දෛනික කටයුතු සිදු කර ගන්න බැරි තැන මේ ශබ්ද දූෂණයක් ඇති වීම කියන කාරණාව මත මේ නඩුව ගොනු කරනු ලැබුවා පාදුක්ක පොලිසියේ ස්ථානාධිපතිවරයා විසින්. අද අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ 68984 දරන නඩුව මාස ගණනාවක් තිස්සේ විභාග වෙලා. අද තීන්දුවක් දීලා තිබෙනවා. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 98(1) වගන්තිය යටතේ මහජන පීඩාවක් සිද්ධ වන නිසා මේ කර්මාන්ත ශාලාව දින 14 ක් ඇතුළත වසා දැමීම හෝ මේ ස්ථානයෙන් ඉවත් කිරීම සිද්ධ කළ යුතුයි කියන තීන්දුවට අද ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මේ තීන්දුවත් එක්ක ජනතාව විශාල සහනයක් ලබලා තිබෙනවා.

ඒ නිසා ලාංකීය අධිකරණ ක්ෂේත්‍රයට අපි හිස නමා ආචාර කරනවා, ජනතාව වෙනුවෙන් ඉතාම වැදගත් තීන්දුවක් ලබා දීම පිළිබඳව. විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ කාරණයේදී කියන්නට තිබෙන්නේ, විශේෂයෙන්ම මේ නඩු තීන්දුව කියන, මේ නඩු තීන්දුව සොයා බලන සමාජ පර්යේෂකයන්ට හොඳ අවස්ථාවක් ලැබිලා තිබෙනවා, මේ රටේ සමාජය පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් සිද්ධ කරන්න. විශේෂයෙන් රාජ්‍ය නිලධාරීන් තමන්ගේ රාජකාරීමය වගකීම නිසි ලෙස ඉෂ්ට කරනවාද? තමන්ගේ මහජන සම්බන්ධතාවය නිසි ලෙස පවත්වාගෙන යනවාද? ඒ වාගේම ධනය, බලය සහ දේශපාලන බලපෑම් මත රාජ්‍ය නිලධාරීන්ගේ රාජකාරී ස්වභාවය හැසිරෙන්නේ කොහොමද කියන කාරණාව පිළිබඳ ඉතාම පැහැදිලි පර්යේෂණයක්, සමාජ පර්යේෂණයක් කරන්න අවස්ථාව, ඉඩකඩ මේ නඩු තීන්දුව හරහා ලැබිලා තිබෙනවා. ඒ නිසා මේ නඩු තීන්දුව කියවා බැලීම තුළ මම හිතන්නේ සමාජ පර්යේෂකයන්ට විශාල ඉඩක් ලැබිලා තිබෙනවා තමන්ගේ සමාජ පර්යේෂණ කටයුතු නිසි ලෙස කරන්නත්, ලාංකීය සමාජ පරිසරය නිවැරදි ලෙස විග්‍රහ කර ගැනීමේ අවස්ථාවකුත් ලැබිලා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ සභාවෙන් ඉල්ලා සිටින්නේ, මේ සභාවේ අවධානය යොමු කරලා, අධිකරණයේ දුන් තීන්දුව ක්‍රියාත්මක වෙලා, දින 14 ක් ඇතුළත මේ කර්මාන්ත ශාලාව, කර්මාන්ත කර ගෙන යන්න සුළුවන් පරිසරයකට ගෙනිහිල්ලා, මේ මහජන පීඩාව වළක්වලා ජනතාවට නිදහසේ ජීවත් වෙන්න තිබෙන අයිතිය තහවුරු කරලා දෙන්න. මේ සභාවේ මැදිහත් වීමක් සිද්ධ කරන්න කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට පළාත් පාලන ආයතන කාලය දීර්ඝ කිරීමක් කරන්නේ නම්, විසුරුවා හැර මාස දෙකක් ඇතුළත මැතිවරණයක් පැවැත්විය යුතු යැයි කියලා පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා පැහැදිලි කිරීමක් ඉල්ලනවා. ඒ සඳහා අවස්ථාව.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම රීති අත්හිටුවීමේ යෝජනාවකුත් ඉදිරිපත් කළා. ඒක ගන්නවාද දන්නේ නැහැ. මේ සම්බන්ධව තමයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි ඒක ගන්න බලාපොරොත්තු වෙනවා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒක ගන්න බලාපොරොත්තු වෙනවා නම්, මම ඒ අවස්ථාවේදී කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳයි. මීළඟට සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ ඔබතුමන්ලාත් මෙය දැන ගන්නට ඕනෑ. කිරිබත්ගොඩ පංචකර්ම මධ්‍යස්ථානයේ ඉන්න වෛද්‍යවරිය. එතුමිය ගැන ඔබතුමන්ලා දන්නවාද දන්නේ නැහැ. මම දන්න ටික කියනවා. එතැන කම්කරු සේවිකාවක් ඉන්නවා. සෞඛ්‍ය හේතූන් මත මාරු වීමක් ඉල්ලලා දැන් මාස දහයක් පමණ වෙනවා. මාරු වීම දීලා මාස දහයක් වෙනවා. එයාව නිදහස් කරන්නේ නැතිව එයා කට්ටි පනිමින් ඉන්නවා. අපේ ගරු ඇමතිතුමාවත් මම කිහිප ගමනක් දැනුවත් කළා. ඇමතිතුමා කිව්වත් ගණන් ගත්තේ නැහැ. එතුමිය කියන්නේ, මහ ඇමතිතුමා කිව්වොත් මාරු කරනවා කියලා. නමුත් මහ ඇමතිතුමා නියෝගයක් දුන්නා කෙනෙක්ව පත් කරලා එයාව ගන්නය කියලා. නමුත් ඒ නිදහස් කරන්නේත් නැහැ. දැන් මාස දහයක් වෙනවා. මේ අහිංසක ළමයෙක්. මම කියන්නේ, එතුමියගේ වැරදි පිළිබඳව මම දැන් ඇමතිතුමාට ලිපියක් දුන්නා. ඒ ලිපියේ තිබෙනවා. මම ඒක සභාගත කරනවා.[1] එතුමිය කරන වංචාවන්. එතුමිය විදේශිකයන් ඒ පංචකර්ම මධ්‍යස්ථානයට ආවාට පස්සේ ඒකට හොර රිසිට් දීලා මුදල් අය කරන විධියක් මට දැනුම් දීලා තිබෙනවා. කොලයක ලියලා එවලා තිබෙනවා එතැන ඉන්න සේවකයෙක්. ඒ නිසා මේවා ගැන පරීක්ෂණයක් කරන්න. මේ වාගේ අහිංසක සේවිකාවන්ගෙන් පළි ගන්න එක බොහොම වැරදියි. ඒ සේවිකාව කළුතර ඉඳලා යන සේවිකාවක්. එයාව මොල්ලිගොඩ රෝහලට මාරු කරලා තිබෙනවා. ඒ මාරුව ක්‍රියාත්මක කර ගන්න එයාව නිදහස් කරන්නේ නැතිව තවම තියාගෙන ඉන්නවා. ඒ නිසා තමයි මම ගරු ඇමතිතුමාව දැනුවත් කළා. මේ මාරු වීම කරන්න කියලා දැන් මාස දහයක් වෙනවා. මම අහන්නේ කාගේ බලයක් උපයෝගී කර ගෙන ද මෙතුමිය මේ විධියට වැඩ කරන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මෙතුමිය කියන්නේ කවුද?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

එතැන ඉන්න වෛද්‍යවරිය මේක කරන්නේ. ඒ නිසා ඔබතුමන්ලාත් දැන ගන්නට ඕනෑ. එතුමිය වංචා ගණනාවක් කරලා තිබෙනවා. ඒ පිළිබඳව මම ගරු ඇමතිතුමාව දැනුවත් කරලා තිබෙනවා. අද මම මේ කාරණය සභාගත කරනවා. බොහොම ස්තුතියි.

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු සිසිර ජයකොඩි** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වන විට උසස් පෙළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ තාක්ෂණවේදය හදාරන ශිෂ්‍යයින් වෙනුවෙන් බරපතළ ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා. ඒ තමයි තාක්ෂණවේදය දෙවන වර පෙනී සිටීම සඳහා අනෙකුත් විෂය ධාරාවන්ගෙන් අධ්‍යාපනය ලබන සිසු දරු දැරියන්ටත් අවස්ථාව සැලසීම නිසා උසස් පෙළ තාක්ෂණවේදය හදාරපු ශිෂ්‍යයින්ට බරපතළ අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මා සාකච්ඡා කරන විෂය කරුණ මේ සභාවට මම දන්නේ නැහැ කොතෙක් දුරට ගෝචර වෙනවාද කියලා. නමුත් මේ රටේ උසස් පෙළ හදාරන, තාක්ෂණවේදය හදාරන ශිෂ්‍යයන් දහ දොළොස්දාහකට බලපාන මූලික ප්‍රශ්නයක් බවට මේ කාරණය අද වන විට අධ්‍යාපන ක්ෂේත්‍රයේ, පළාත් සභාව සහ අධ්‍යාපන ක්ෂේත්‍රයේ සාකච්ඡා කළ යුතු මූලික කාරණයක් කියලා අපි විශ්වාස කරනවා. ඒ තමයි, විභාග දෙපාර්තමේන්තුව මගින් චක්‍රලේඛයක් මගින් ගණිත අංශය හදාරන ශිෂ්‍යයින්ට පවා දෙවන වර තාක්ෂණවේදය හැදෑරීම සඳහා අවස්ථාව සලසා තිබීම. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු ඒ කිසි කෙනෙක් දැනුවත් නොකර, විශේෂයෙන්ම පළාත් තාක්ෂණවේදයේ විෂය අධ්‍යක්ෂවරුන්ගේ හා තාක්ෂණික විෂය උගන්වන ගුරුවරුන්ගේ බරපතළ අකමැත්ත ඇතිව උසස් පෙළ විෂය ධාරාවේ දෙවන වර පෙනී සිටින්න අනෙකුත් විෂය ධාරා, අවුරුදු දෙකක් විශ්ව විද්‍යාල වරම් ලබා ගැනීමේ අරමුණින් විෂය හදාරපු දරුවෝ වෙනුවට වෙනත් ශිෂ්‍යයින්ට, වෙනත් පාඨමාලා කරපු තාක්ෂණික පාඨමාලා කරපු අයටත් උසස් පෙළ විභාගයට පෙනී සිට, විශ්ව විද්‍යාල වරම් ලබා ගෙන තාක්ෂණවේදය සඳහා වෙන් වුණු විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට තිබෙන උරුමය විනාශ කිරීම සඳහා කටයුතු කරනවා.

ඒ වාගේම අපි දන්නවා. මහින්දෝදය විද්‍යාගාර අපේ රටේ ඇති කළේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල පරිවර්තනයක් සිද්ධ කරන්න. ඒ වෙනුවෙන් රජය මහා පරිමාණ ආයෝජනයක් සිද්ධ කළා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ අලුත් ප්‍රගතියක් ඇති වුණා. ලෝකයේ අධ්‍යාපන ක්ෂේත්‍රය

සම්බන්ධයෙන් ඇති වී තිබුණු පුළුල්ම කරීකාව. ඒ තමයි ශාස්ත්‍රීය සහ ප්‍රායෝගික දැනීම් ඒකාබද්ධ කිරීමේ ක්‍රමය. ශාස්ත්‍රීය ඥානයත්, ශිල්පීය ඥානයත් ඒකාබද්ධ කළ යුතුය කියන ෆ්‍රැන්සිස් බේකන්ගේ කියමන සනාථ කරමින් තමයි මේ තාක්ෂණවේදී විෂය ලෝකයේ අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දී තිබෙන්නේ. අද වන විට මේ තාක්ෂණවේදය විනාශ කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග අපේ රටේ අධ්‍යාපන බලධාරීන් පසුගිය සතියේ අරගෙන තිබෙනවා. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ටවත්, ලේකම්වරුන්ටවත්, අධ්‍යාපන බලධාරීන්ටවත් නොදන්වා විභාග දෙපාර්තමේන්තුව හිතුමතේ ක්‍රියාමාර්ග ගන්නවා. ඒ නිසා මේ අධ්‍යාපනික ප්‍රශ්නය අපේ රටේ විද්වතුන්, බුද්ධිමතුන්, අධ්‍යාපනවේදීන් සාකච්ඡා නොකිරීම බරපතළ කනගාටුදායක තත්ත්වයක්. ඒ නිසා ගරු ඔබතුමා මඟින් මේ සභාවේ අවධානය යොමු කරනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයට මේ ඇති කරන විනාශය අකුලා ගන්න, වළක්වන්න කියන ඉල්ලීම, තාක්ෂණවේදය මුල සිට අධ්‍යාපනය ලබන ළමයින්ගේ අයිතිවාසිකම් සුරකලා දෙන්න කියන ඉල්ලීම අපි කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පානදුර පරණ ගාලුපාර, එහෙම නැත්නම් පානදුර දිගරෝල්ල පාලම අසළ ඉඳලා පානදුර, වළාන බුදු පිළිමය දක්වා ඇති පරණ ගාලු පාර, දැනට පානදුර - නුගේගොඩ බස් රථ මාර්ගය, 2014 වර්ෂයේ ජූනි මාසයේ 09 වැනිදා මේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැඩ ආරම්භ කළා. ඒ එක්කම දිගරොල්ල පාලම අතිශයින්ම අබලන් තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මේ පාලම කඩා වැටුණොත් විශාල ප්‍රදේශයකට මඟී ප්‍රවාහන පහසුකම් බාධා ඇති වෙනවා. ඒ නිසා මේ ව්‍යාපෘතිය දැන් ආරම්භ වෙලා අවුරුද්දකට ආසන්නයි. පසුගිය දවස්වල ජනතාව අති දැවැන්ත උද්ඝෝෂණයක් කළා. ඒ දවස ඇතුළත මේ මාර්ගයේ කිසිම වාහනයක් ගමන් කරන්න ජනතාව ඉඩ තිබ්බේ නැහැ. සම්පූර්ණයෙන්ම මාර්ගය බාධා වන ආකාරයට මේ උද්ඝෝෂණ කටයුත්ත ක්‍රියාත්මක වුණා. මගේ සහෝදර ගරු පළාත් සභා මන්ත්‍රී විජිත් ප්‍රියන්ත ගරු මන්ත්‍රීතුමා එදා ඒ ප්‍රාදේශීය මහා මාර්ග ඉංජිනේරුවරිය සමඟ ඇවිල්ලා ජනතාවට පොරොන්දුවක් දුන්නා, මේ පාරේ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු නැවත ආරම්භ කරනවා. ඒ නිසා ඒ අයට විසිර යන්නය කියලා. ජනතාව මේ ඉල්ලීම, මේ ප්‍රකාශය විශ්වාස කරලා එදා ඒ උද්ඝෝෂණය නතර කළා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය දවස්වල අර වර්ෂාව අධික දිනයක මේ මාර්ගයේ මේ තත්ත්වය නිසාම ඒ ප්‍රදේශයේ ජනතාවට ජීවිතයක් අහිමි වෙනවා. අද අතිශයින්ම භයානක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. වර්ෂා කාලයේදී සමහර ගෙවල්වල ඉඳලා පාරට ඇතුළු වෙන්න අඩි දෙකහමාරක් විතර පල්ලෙහාට බහින්න ඕනෑ. පාර දිගටම කොන්ක්‍රීට් ආවරණ යොදලා තිබෙනවා. ඒ මාර්ගයේ වාහනයක්වත් ධාවනය කරන්න අපහසු තත්ත්වයක් තමයි අද දවස වන කොට පවතින්නේ. නමුත් මම මහා මාර්ග අධිකාරියේ සභාපතිතුමාට කථා කළාම, එතුමා කිව්වේ, මේ කොන්ත්‍රාත්කරුවා වැඩ කරන්නේ නැතිව මේ මාර්ගය අතරමග දමා ගොස් තිබෙන බවයි. මම පසුව කොන්ත්‍රාත්කරු සොයා ගෙන කථා කළාම එතුමා කියනවා, කලට වේලාවට අවශ්‍ය විදියට ඒ අයගේ මුදල් ගෙවන්නේ නැති නිසා මේක කර ගෙන යාමේ අපහසුතාවයක් තිබුණා. ඒ නිසා එයාට මෙය කර ගෙන යාමේ බැරි තත්ත්වයක් ඇති වුණාය කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණු කෙසේ වෙතත් මේ නිසා ඇති වෙලා තිබෙන මහජන පීඩාවට විරුද්ධව, වත්මන් මහජන පීඩා ප්‍රඥප්තිය යටතේ නඩු පැවරීමට මේ පළාත් සභාවට බලය තිබෙනවා. ගරු ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරනවා. ජනතාවට සිදු වන මේ දැවැන්ත පීඩාවට විරුද්ධව ඒ අදාළ ආයතනවලට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ගයකට ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය කටයුතු ඉෂ්ට කරලා දෙන විධියට. එසේ නොමැති නම් මේ කටයුත්ත කෙරෙන්නේ නැහැ. කවුද පුද්ගලයා කියන කාරණාව අපට වැඩක් නැහැ. මේ ව්‍යාපෘතියට කලින් මිලියන 500 ක් වෙන් කරලා තිබුණා. පසුකාලීනව ඒ මුදල් අහිමි වුණා. පසුව දෙවැනි වර තමයි පසුගිය 2014 වර්ෂයේ ජූනි මාසේ 09 වැනිදා මේ ව්‍යාපෘතිය ආරම්භ වුණේ. දැන් පාරේ දෙපැත්තේ සමහර තැන්වල අඩි දෙකක් විතර උසට අර පාර උස්සන ප්‍රමාණයට කොන්ක්‍රීට් ආවරණය යොදලා. පාර තනිකරම මඩ වළක්. වැස්ස දවස්වලට ගමන් කරන්නම බැහැ. මෙවැනි විධියට මේ සංවර්ධන ව්‍යාපෘති නතර වීම නිසා ජනතාවට සිදු වී තිබෙන අනේකවිධ දුක් පීඩා වළක්වාලීම සඳහා රජයක් හැටියට මැදිහත්ව ක්‍රියා කිරීම මධ්‍යම රජයේ මහා මාර්ග අමාත්‍යවරයාගේ සුවිශේෂ වගකීමක්. ඔහු මේ පිළිබඳව හිතන්නේ නැත්නම්, විධිමත්

[ගරු ජගත් අංගගේ]

ක්‍රියාමාර්ගයක් ගන්නේ නැත්නම්, ඍජු ශ්‍රමික ක්‍රමයට හෝ මේ මහජන පීඩාව වැළැක්වීමට ක්‍රියාමාර්ගයක් නොගන්නවා නම්, මේ සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ගයක් ගැනීම සඳහා ගරු ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරනවා. මොකද, මේක පළාත් සභා බල ප්‍රදේශයට අදාළ පාරක්. පාර මහා මාර්ග දෙපාර්තමේන්තුවේ වුණාට ඒ ප්‍රදේශයේ ජීවත් වෙන්නේ බස්නාහිර පළාතේ මිනිස්සු. පනස්දාහකට, හැට දහසකට අධික ජනගහනයක් මේ ප්‍රදේශයේ ජීවත් වෙනවා. පාසල් දරුවන්ට පාසලකට යන්න විධියක් නැහැ. නිශ්චිත වෙලාවට. තමන්ගේ රාජකාරිවල යෙදෙන රැකියා නියුක්තිකයින්ට තමන්ගේ රාජකාරී ස්ථානවලට නියමිත වෙලාවට යන්න විධියක් නැහැ. මේ තිබෙන මාර්ග අපහසුතාවය නිසා. සම්පූර්ණයෙන්ම ජන ජීවිතය කඩාකප්පල් වෙලා. කොපමණ ඝෝෂා කළත් මේ පිළිබඳව හැඟීමකින් තොරව, සත පහකට ගණන් ගන්නේ නැතිව ක්‍රියාත්මක වන නිසා නැවත වතාවක් මේ පිළිබඳව කාරුණික අවධානය යොමු කර නෛතික ක්‍රියාමාර්ගයකට ප්‍රවේශ වන ලෙස ආයාචනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යහපාලන ආණ්ඩුව බලයට පත් වෙලා දැන් දින 100 අවසන්. මේ කාල පරිච්ඡේදය එන්න ඉස්සෙල්ලා මෙතුමන්ලා ප්‍රකාශ කළේ අධ්‍යාපනය සඳහා 6% ක මුදලක් වෙන් කරනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලයේ අධ්‍යාපනය සඳහා වියදම් කරපු මුදල් ප්‍රමාණවත් නැහැ. ඒ නිසා අධ්‍යාපනය කඩා වැටිලා කියලා. ශිෂ්‍යයන්, විශ්ව විද්‍යාල ආචාර්යවරු, දේශපාලඥයෝ, විවිධ බුද්ධිමතුන් මේ පිළිබඳව හඬ නැගුවා. ඒ වාගේම එහෙම කියලා මේ අය බලයට පත් වුණා. හැබැයි, අද බලයට පත් වෙලා එදා කිඹුල් කඳුළු හෙලපු අකිල විරාජ් වාගේ මන්ත්‍රීවරු අද ඇමතිවරුන් බවට පත් වෙලා සම්පූර්ණයෙන්ම මේ රටේ අධ්‍යාපනය කඩා වැටීමට ලක් වෙලා තිබෙනවාය කියලා අපි කනගාටුවෙන් යුතුව වුණත් කියන්න ඕනෑ. මොකද, විශේෂයෙන්ම තමුන්නාන්සේලා දැන ගන්න ඕනෑ. (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමන්ගේ ආසනයේ නොවෙයි ඉන්නේ. වෙනත් ආසනයක ඉඳගෙන බාධා කරන්නේ. (බාධා කිරීම්) මගේ ගියවර කථාවත් සම්පූර්ණයෙන්ම මේගොල්ලන්ට ඕනෑ විධියට කළේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා බාධා කිරීම් කරන්න එපා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ ආණ්ඩුව බලයට එන කොට අපි පාසල් රාශියක විශාල සංවර්ධන කටයුතු රාශියක් කර ගෙන ගියා. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් විතරක් නොවෙයි. අපි පළාත් සභාවෙන්, ඒ වාගේම අධ්‍යාපන අමාත්‍යාංශයට අමතරව ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් පාසල්වල ගුරුවරුන්ගේ දැනුම වර්ධනය කරන්න, පාසල්වල දරුවන්ගේ දැනුම වර්ධනය කරන්න වාගේම භෞතික සම්පත් දෙන්න, ගොඩනැගිලි සංවර්ධනය සඳහා අපි විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කළා. හැබැයි, අපි ඒ වෙන් කරපු සියලු මුදල් අපි දරුවන්ගේ අධ්‍යාපනය, රටේ අභිවෘද්ධිය කියලා විශ්වාස කරලා තමයි වෙන් කළේ. හැබැයි, ඒක ප්‍රමාණවත් නැහැයි කියලා තමයි මේ ආණ්ඩුවේ අය බලයට පත් වුණේ. හැබැයි, අද වන කොට ඒ අපි වෙන් කරපු සියලු මුදල් පවා ලබා දීම නවත්වලා තිබෙනවා. ඒ වාගේම විශ්ව විද්‍යාලවල, ඒ වාගේම පාසල්වල විවිධ ක්ෂේත්‍රවල අද විශාල බිඳ වැටීමකට ලක් වෙලා. අද සෑම විශ්ව විද්‍යාලයකම උද්ඝෝෂණයක්, උපවාසයක් ආරම්භ කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද ශිෂ්‍යයන් එළියට බැහැලා අරගල කරන කොට ඔවුන්ව අත්අඩංගුවට ගන්නවා විතරක් නොවෙයි, පහර දීලා, කඳුළු ගෑස් ගහලා, අවසානයේ ඔවුන්ව විශාල මර්දනයකට ලක් කරනවා. එදා කිව්වේ අපේ ආණ්ඩුව මර්දනයට ලක් කරනවා කියලා. හැබැයි, අද ඒ ශිෂ්‍යයින්ම කියනවා, මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව සාකච්ඡා කළා. අඩුම ගණනේ යම් ප්‍රශ්නයකට ඇහුම් කන් දීලා අවසානයේ තමයි යම් සිද්ධියකට මුහුණ දුන්නේ. හැබැයි, මේ ආණ්ඩුව ඇවිල්ලා දින කිහිපයක් ඇතුළේ ශිෂ්‍යයින් මර්දනය කරලා හිර ගෙදරටත් යවන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ආණ්ඩුව ආපු ගමන්ම අද මේ සියලුම දෙනාට බරපතළ විධියට මේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාලය තුළ අපේ

විශ්ව විද්‍යාලවලට භික්ෂූන් වහන්සේලා ඇතුළු කර ගැනීම තිබුණු ප්‍රමාණය අද සම්පූර්ණයෙන්ම අඩු වෙලා. ඒ නිසා විශ්ව විද්‍යාලවලට භික්ෂූන් වහන්සේලා ඇතුළු කර ගන්න ප්‍රමාණය අඩුම ගණනේ තිබුණු ප්‍රමාණයවත් ලබා දෙන්නය කියලා පසුගිය දිනවල භික්ෂූන් වහන්සේලා විශාල උද්ඝෝෂණ, උපවාස කළා. ඒ වාගේම ඒ භික්ෂූන් වහන්සේලා පසුගිය කාල පරිච්ඡේදය තුළ මේ ආණ්ඩුවේ කටයුතුවලට යම් සහයෝගයක් දුන්න අය පවා අද මේ වන විට බරපතළ කළකිරීමකට පත්ව තිබෙනවා. ඔවුන් අහනවා, ඇයි විශ්ව විද්‍යාලයට යන ප්‍රමාණය අඩු කරන්නේ කියලා. එතකොට කියලා තිබෙන්නේ භික්ෂූන් වහන්සේලා මේ රටේ උගතුන් බවට පත්වීම අවශ්‍ය නැහැයි කියලා. අපි සෝභිත හාමුදුරුවන්ගෙන්, රතන හාමුදුරුවන්ගෙන් අහනවා, භික්ෂූන් වහන්සේලා නූගතුන් බවට පත් කරන්නද උන්වහන්සේලා මේ ආණ්ඩුවට කඩේ ගියේ. ඒ වාගේම අපි අහනවා, මේ රටේ අධ්‍යාපන අමැතිතුමාගෙන්, අගමැතිතුමාගෙන්, ජනාධිපතිතුමාගෙන්, භික්ෂූන් වහන්සේලා වාගේම මේ රටේ අනෙකුත් අය දැනුම වර්ධනය කර ගත්තේ නැත්නම් මේ රට ලෝකයත් එක්ක ගනුදෙනු කරන්නේ කොහොමද කියලා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ. අපි කොළඹ දිස්ත්‍රික්කයේ පවා පාසල්වලට කෝටි ගණන්, බිලියන ගණන් මුදල් පසුගිය කාලයේ වෙන් කළා. ගොඩනැගිලි හැදුවා. ඒ සියලු ගොඩනැගිලිවල අද ගමන් මග නතර වෙලා තිබෙනවා. එහෙම නැත්නම් ඒ ආරම්භ කරපු තැනින් නවත්වලා තිබෙන්නේ. පසුගිය කාලයේ අපේ රජය ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් පවා ලබා දුන් මුදල් අද ලබා දීම නවත්වලා නිසා විශේෂයෙන් මම කියන්න ඕනෑ, (බාධා කිරීම්) කඩුවෙල ආසනයේ මාලබේ රාහුල විද්‍යාලය ළමයි 6000 ක් විතර ඉන්න පාසලක්. මේ පාසලේ දරුවන්ට අද අව්වට පිච්චෙන්න, ඒ වාගේම වැස්සට තෙමෙන්න සිද්ධ වෙලා. ඒ පාසලේ හදා ගෙන ආපු - අපි කෝටි තුනහමාරක් විතර මුදල් දුන්නා. අද ඒ මුදල් දීලා ඉදිරි වැඩ කටයුතු කරන්න මේ ආණ්ඩුවේ අය මුදල් ලබා දෙන්නේ නැති තත්ත්වයකට පත් වෙලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ අනාගතය (බාධා කිරීම්) කොයිබට යන්න හදනවාද? යහපාලන ආණ්ඩුවක් කියලා විශ්වාස කරන ආණ්ඩුවක් කොහොමද රටක අධ්‍යාපනයට මෙතරම් පසුගාමී තත්ත්වයට ගෙනියන්නේ. ඒ වාගේම මේ රටේ විශ්ව විද්‍යාල ආචාර්යවරු පසුගිය කාලයේ කෑ ගැහුවා. දැන් ඒ අයගේ අවශ්‍යතා ඉෂ්ට වෙලාද? ඒ නිසා පැහැදිලියි. ඒ අය කඩේ ගියේ දේශපාලන අවශ්‍යතා සඳහා. ඒ නිසා අපි කියනවා, විශ්ව විද්‍යාලයට, ඒ වාගේම පාසලට වෙන් කළ යුතු මුදල අඩුම ගණනේ ඔවුන්ට 6% ක් වෙන් කරන්න බැරි නම්, අපේ කාලයේ වෙන් කරපු මුදල් ප්‍රමාණය හරි දීලා, ඒ පාසල් ගොඩනැගිලි ටික හදන්න. ඒ අධ්‍යාපනය සංවර්ධනය කරන්න. දරුවන්ගේ අභිවෘද්ධිය හදන්න.

ඒ වාගේම අවසාන වශයෙන් අපි පෙර පාසල් සංවර්ධනයට පසුගිය අයවැයෙන් මිලියන 300 ක් වෙන් කළා. පෙර පාසල් ගුරුවරුන්ගේ දැනුම වර්ධනය කරන්න. ඒ වාගේම පෙර පාසල් ගුරුවරුන්ට මාසයකට 2500 ක් දෙන්න අපි කටයුතු කළා. හැබැයි, මේ ආණ්ඩුව 250 දක්වා 90% කින් කප්පාදු කරලා තිබෙනවා ගුරුවරුන්ගේ. මෙන්න මෙහෙමයි මේ ආණ්ඩුව යහපාලන ආණ්ඩුව අධ්‍යාපනයට සලකන්නේ. ඒ නිසා අපි කියනවා, මේ ආණ්ඩුවේ ඉහළ බලවතුන්ට. ජනාධිපතිතුමා, අගමැතිතුමා, අධ්‍යාපන ඇමතිතුමා ඇතුළු අයට. මේ රටේ ජනතාවගේ අභිවෘද්ධිය සඳහා තීන්දු ගන්නවා නම් ඒ දරුවන්ගේ අධ්‍යාපනය, ඔවුන්ගේ නැණස පැදීම අත්‍යාවශ්‍යයි. ඔවුන්ගේ නැණස පාදන්න මේ නායකයන්ගේ නැණස, බුද්ධිය පහළ වේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේ මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා තාවකාලිකව අත්හිටුවනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.28 ට යළිත් රැස් විය.***
*Sitting, accordingly suspened untill 11.28 a.m. and then resumed.*

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම 36(1) යටතේ බරපතළ වරප්‍රසාද අහිමි වීමක් පිළිබඳව කථා කරන්නයි යන්නේ. මට විතරක් නොවෙයි. මගේ සියලුම සහෘද මන්ත්‍රීවරුන්ටත් එක්ක. පසුගිය 29 වැනිදා ප.ව. 2.30 ට බත්තරමුල්ල සෙත්සිරිපායේදී අපේ සභා කටයුතු කාරක සභා රැස්වීම පැවැත් වුණා. ඒ සභා කටයුතු කාරක සභාවට ගරු සභාපති

[ගරු හෙක්ටර් බෙත්මගේ]

සුනිල් විජේරත්න මැතිතුමා, සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, හර්ෂණ රාජකරුණා ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, හෙක්ටර් බෙත්මගේ වන මම, සුනිල් ජයමිණි ගරු මන්ත්‍රීතුමා, සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමා සහ රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය සහභාගී වුණා. අපි එදා නොයෙකුත් දේවල් කථා කරලා, අපි සියලු දෙනාටම අහිමි වෙලා තිබෙන වරප්‍රසාදයක් තමයි අපේ කාර්යක්ෂම කාර්ය මණ්ඩලය. හැම මන්ත්‍රීවරයකුටම තිදෙනෙකුගෙන් සමන්විත කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ඉන්නවා. ඒ කාර්ය මණ්ඩලයට, අනෙකුත් රාජ්‍ය සේවකයන්ට මීට ඉහතදී රජයෙන් පඩි වැඩි වුණා නම්, දීමනා දුන්නා නම් ඔවුන්ටත් ඒවා හිමි වුණා. ඒවා දුන්නා. ඒවා දෙන්න ප්‍රධාන අමාත්‍ය ලේකම්, ප්‍රධාන ලේකම්, ආණ්ඩුකාරතුමා, කැබිනට් මණ්ඩලය මේ සියලු දෙනාම අනුගත වෙලා තමයි ඒවා වුවමනාවෙන් සිද්ධ කළේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජය හැටියට අපේ රජය රුපියල් 3000 ක් වැඩි කළා. ඊට පසුව මේ රජය හැටියට යහ පාලනය තුළ රුපියල් 5000 ක් වැඩි කළා. තව රුපියල් 2000 ක් වැඩි වෙන්න තිබෙනවා. මේ එකක්වත් තවම මේ අපේ කාර්ය මණ්ඩලයට ලැබිලා නැහැ. මේ කාර්ය මණ්ඩලය ඉතාම කනස්සල්ලෙන් ඉන්නේ. ඒ නිසා අපේ දේවල්, අපේ රාජකාරී වැඩ කටයුතු ඔවුන්ගෙන් නිරායාසයෙන්ම අතපසු වෙමින් තිබෙනවා. ඒ නිසා අපට විශාල කනස්සල්ලක් තිබෙනවා. ඒක අපේ වරප්‍රසාදයක් අහිමි වීමක්.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා සභාපතිතුමාත් එක්කත් කථා කරලා, අපි එදා සාකච්ඡා කළා මේ ගැන ගරු ආණ්ඩුකාරතුමා සමඟ කථා කරමුයි කියලා. ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට මම බල කරනවා, කැබිනට් මණ්ඩලයට බල කරනවා, ගරු ආණ්ඩුකාරතුමාත් එක්ක කථා කරලා මේක අපට ලබා දෙන්නය කියලා. ආණ්ඩුකාරතුමාත් එක්ක කථා කරන්නේ ඇයි? මීට ඉස්සෙල්ලා වැඩිවීම්වලදී හිටපු ගරු ආණ්ඩුකාර අලවි මවුලානා මැතිතුමා ඒකට මැදිහත් වෙලා එතුමාගේ තිබෙන නිශේද බලය තුළ එතුමා ඒකට අනුමැතිය දුන්නා. දැන් අපේ ඉන්නේ අලුත් ආණ්ඩුකාරවරයෙක්. මම හිතනවා, ඒ අලුත් ආණ්ඩුකාරතුමා මේ කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි කියලා. ඒ නිසා මේක කඩිනම් කරලා, ඒ ආණ්ඩුකාරතුමාත් එක්ක සාකච්ඡා කරලා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු කැබිනට් මණ්ඩලය, ගරු සභාපතිතුමා සමඟ සාකච්ඡා කරලා එතුමාගේ අනුමැතිය අරගෙන මේ අසාධාරණයට ලක් වෙලා ඉන්න සේවකයින්ගේ ඒ දීමනා ලබා දෙන්නය කියලා මම ගරු ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ චක්‍රලේඛය 2014 අංක 24 දරන හා 2015 අංක 05 දරන මේ චක්‍රලේඛ දෙකට අනුව තමයි මුදල් ගෙවන්න තිබෙන්නේ. ඒ නිසා ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඔබතුමා මේකට නායකත්වය අරගෙන අපි සියලු දෙනාගේම, පක්ෂ විපක්ෂ සියලු දෙනාගේම සේවකයින්ගේ ඒ දීමනා ලබා දීලා ඔවුන්ගේ කාර්යක්ෂම සේවය අපි හරහා ජනතාවට ලබා දෙන්න කටයුතු කරන්න. ඒක අපට අහිමි වෙලා තිබෙන බරපතළ වරප්‍රසාද ප්‍රශ්නයක්. බොහොම ස්තූතියි.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාරණාව අපි හැමෝටම බලපාන කාරණාවක් නිසා මීළඟ පළාත් සභාවට ප්‍රථමයෙන් ගරු ආණ්ඩුකාරතුමාත් එක්ක සාකච්ඡා කරලා මේ ගැන විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හොඳයි. අවශ්‍ය කටයුතු සූදානම් කරනවා.

මීළඟට කාර්ය පටිපාටි රීති අත්හිටුවමින් යෝජනා 03 ක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව, උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමා, පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා සහ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන යෝජනා පිළිබඳව. අපි මේ සියල්ලම අරගන්න බලාපොරොත්තු වෙනවා. හැබැයි, හැම ගරු මන්ත්‍රීවරයෙක්ම කාලය පිරිමහලා ක්‍රියා කරන්නය කියලා ඉල්ලනවා. මුලින්ම ඉදිරිපත් කරලා තිබෙන්නේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාගේ යෝජනාව. ඒ යෝජනාව සඳහා අවස්ථාව ලබා දෙන ගමන්, ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාගෙන් සහ විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමාගෙන් මම ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධව කථික ලැයිස්තු මා වෙත ඉදිරිපත් කරන මෙන්.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම රීති අත්හිටුවමින් ගෙනාපු යෝජනාවේ තවත් කරුණු රාශියක් මේකට ඇතුළත් කර ගන්න තිබෙන නිසා, මම ඊළඟ සභාවට ඒක ඉදිරිපත් කරන්න කටයුතු කරනවා. ඒ නිසා මේ අවස්ථාවේදී මම ඒ යෝජනාව ඉල්ලා අස් කර ගන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට දෙවැනි යෝජනාව වන පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දෙනවා.

# රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද, මතු සඳහන් වන යෝජනාවන් සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනාව සම්බන්ධව කවුරුත් කථා කරන්නේ නැද්ද? යෝජනාව සම්මත කළා. ස්ථිර කළා නේ? ගරු මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I
PRIVATE MEMBERS MOTION: I

# පළාත් පාලන මැතිවරණය
LOCAL GOVERNMENT ELECTION

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,*"ජනතා ඡන්දයෙන් තේරීපත් වන මහජන නියෝජිතයන් අතරින් ජනතාවට වඩාත් සමීපව කටයුතු කළ හැකි ජනතා නියෝජිතයන් පත්වන්නේ පළාත් පාලන ආයතන සඳහා වේ. එම පළාත් පාලන ආයතනයන්ට ජනතාවට අවශ්‍ය සේවාවන් වඩාත් සාර්ථකව ඉටු කළ හැකි වන්නේ ජනතාවගේ නියෝජිතයන්ගේ ක්‍රියාකාරී දායකත්වය මත වන බැවින්ද, ජනතා අපේක්ෂාව වනුයේ තම නියෝජිතයන්ගෙන් සමන්විත පළාත් පාලන ආයතනයෙන් සේවය ලබා ගැනීම වන බැවින්ද,*

*(අ) දැනට නිල කාලය අවසන්ව කාලය දීර්ඝ කරනු ලැබ ඇති පළාත් පාලන ආයතනයන් සඳහා මැතිවරණයක් ප්‍රකාශයට පත් කරන තෙක් එම පළාත් පාලන ආයතන විසුරුවා නොහරින මෙන්ද,*

*(ආ) ඉදිරියේදී නිල කාලය අවසන්වීමට නියමිතව ඇති පළාත් පාලන ආයතනයන් සඳහා මැතිවරණයක් ප්‍රකාශයට පත් කරන තෙක් එම පළාත් පාලන ආයතන විසුරුවා නොහරින මෙන්ද,*

*(ඇ) යම් ලෙසකින් පළාත් පාලන ආයතන විසුරුවා හැරීමක් සිදු කරනු ලබන්නේ නම්, එසේ විසුරුවා හැරීමෙන් පසුව මාස 02 ක් ඇතුළත මැතිවරණයක් පවත්වන මෙන්ද,*

*මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අතිගරු ජනාධිපතිතුමාගෙන්ද, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන්ද, රජයේ පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමාගෙන්ද, බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන්ද ඉල්ලා සිටින්නීය."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි යෝජනා දෙකක් ගේන්න අවශ්‍යතාවයක් නැහැ. අපේ යෝජනාවේත් අඩංගු කාරණයක්ම තමයි මේ යෝජනාවේත් තියෙන්නේ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි යෝජනා කරනවා මේකට පසුගිය ජනාධිපතිවරණයේ අතිගරු ජනාධිපතිතුමා දුන් පොරොන්දුව අනුව පාර්ලිමේන්තුවද විසුරුවා නැවත ජනතාව අතරට ගිහිල්ලා ජනතාවගේ වරමක් ගැනීම සඳහා මැතිවරණයක් පවත්වන ලෙසත්, ඒත් එක්කම අපි මේ යෝජනාවේ 'ඇ' කොටසට එකඟයි. ඒක නිසා අපිත් කියන්නේ දැන් කල් ඉක්මවා ගිහිල්ලා තිබෙන පළාත් පාලන ආයතනත් මේ වනකොට නැවත ජනවරමකට යන්න ඕනෑ කියන අදහස තමයි අපෙත් තියෙන්නේ. ඒක නිසා අපිත් කියන්නේ මේ පළාත් පාලන ආයතනත් විසුරුවා නැවත ඡන්දයකට යන්න ජනවරමක් ගන්න කියන යෝජනාව ඉදිරිපත් කරනවා. ඒක අපි විවාද කරමු. ඒක අපට විවාදයට ගන්න පුළුවන් නේ? ඔබතුමන්ලා කියන්නේ විසුරුවන්න එපා කියලා. අපි කියන්නේ විසුරුවලා ඡන්දයකට යන්න කියලා. මේකේ දෙකම අඩංගුයි.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉදිරිපත් කළේ ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්. මේ වනවිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එහෙම නැත්නම් සන්ධානයට විතරක් නොවෙයි. එක්සත් ජාතික පක්ෂය ඇතුළු අනෙක් පක්ෂවල ඉන්න අපේ පල්ලෙහා මට්ටමේ අපේ ජනතාවට සේවය කරන පළාත් පාලන නියෝජිතයෝ සියලු දෙනාටම වැදගත් වන යෝජනාවක්. ඒක නිසා මේ යෝජනාව කිසිදු වෙනසක් නැතුව මේ සභාවේ සාකච්ඡා කරනවා නම් හොඳයි කියන එකයි මගේ අදහස.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ, ගරු මන්ත්‍රීතුමා ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියන්නේත් ඒකම තමයි. එතුමන්ලාත් එකඟ වෙලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි මේක විවාදයට ගමු.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල**
Hon. Udaya Prabhath Gammanpila

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කවුරු හරි එක්කෙනෙක් පැහැදිලි කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල**
Hon. Udaya Prabhath Gammanpila

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාවට එක්සත් ජාතික පක්ෂය ඉදිරිපත් කරන සංශෝධනය තුළ ඒකට එකඟ වෙනවා. ඒ යෝජනාවට අපි එකඟයි. පාර්ලිමේන්තු මැතිවරණයක් පොරොන්දු වූ පරිදි පවත්වන්න කියන එක අපි විවාද කළ යුතු කාරණයක්. හැබැයි මේ පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ගය එක යෝජනාවක්. පාර්ලිමේන්තු කාරණය තව යෝජනාවක්. ඔබතුමන්ලා ඒ යෝජනාව ගෙන එන්න. අපි විවාද කරමු. හැබැයි, මේ යෝජනා දෙක එකට පටලවා ගන්න හදන්නේ ඇයි?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේකේම කොටසක් තමයි අපේ එකෙත් තියෙන්නේ.

[සභාවේ ඝෝෂා]

අපේ යෝජනාවෙත් තියෙනවා, මේ කල් ඉක්මවා ගිය පළාත් පාලන ආයතන - අපි කියන්නේ පාර්ලිමේන්තුව හා පළාත් පාලන ආයතන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වෙන වෙනම ගන්නම්. ගරු මන්ත්‍රීතුමා අවස්ථාව ලබා දෙන්නම්. වාඩි වෙන්න. කථික ලැයිස්තු ලබා දෙන්න විපක්ෂයේ සංවිධායකතුමා.

**ගරු නිමල් ලාන්සා** (ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමූපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Nimal Lansa (Minister of Transport, Sports and Youth Affairs, Women's Affairs, Food Supplies and Distribution Affairs, Cooperative Development, Domestic Economic Promotion, Fisheries, Rural Development, Tourism, Investment Promotion Coordination and Animal Production and Development)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අපි වෙනම සාකච්ඡාවට ගමු. මොකද, දැනට කාලීන අවශ්‍යතාවයක් විධියට සිදු වෙලා තිබෙන්නේ පළාත් පාලන ආයතන. අපි දකිනවා, ලේකම් යටතට පත් කරන්න යනවා. එම නිසා තමයි අපි යෝජනාව ගෙනල්ලා තියෙන්නේ. ඊළඟ, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉතාමත් වැදගත් යෝජනාවක් ගෙන එනවා. පාර්ලිමේන්තුව ඉතා ඉක්මණින් විසුරුවා හරින්න කියලා. මම හිතනවා අපට මේක ගෙන එන්න දෙයක් නැහැ. එතුමන්ලා හදපු දින 100 වැඩ සටහනේ බොහොම පැහැදිලිව කියලා තිබෙනවා අප්‍රේල් 23 වැනිදාට පාර්ලිමේන්තුව විසුරුවා හරින්න ඕනෑ කියලා. ඉතින් මට තේරෙන්නේ නැහැ එහෙම කියලා මෙතැන යෝජනාවක් ගේන්නේ මෙතුමන්ලාගේ ආණ්ඩුව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා යෝජනා දෙකම ගේමු. කථික ලැයිස්තු ලබා දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි පාර්ලිමේන්තුව කියන කෑල්ල මේකට එකතු කරමුද?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

හැබැයි, මෙතුමාගේ යෝජනාව මේකට ගාව ගන්න එපා. මොකද, මෙතුමා කියන්නේ පාර්ලිමේන්තුව විසුරුවා හරින්න කියලා. අපේ යෝජනාව තියෙන්නේ පාර්ලිමේන්තුවට තව කල් තියෙනවා. එහෙම ගියාම තමයි මේක කුරුවල් වෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපට විසුරුවන්න බැහැ නේ? ජනාධිපතිතුමාට නේ විසුරුවන්න ඕනෑ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

චන්ද්‍රිකා නෝනාත් කිව්වා නේ? අපි කියන්නේ තව ටික කාලයක් කරගෙන යන්න දෙන්න. ඒ නිසා මත දෙකක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව විවාදයට අරගන්නවා. සාකච්ඡාවට භාජනය කරනවා. ඊට අදාළ කථික ලැයිස්තු ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ සංවිධායකතුමන්ලාගෙන් මට ලැබුණේ නැහැ. පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමාට විනාඩි 07 ක කාලයක් ලබා දෙනවා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, -

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. සභාවේ පොදු එකඟතාවයක් යටතේ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය කාලයක් වෙන් කරගෙන ඒ කාලය තුළ විවාද කරනවා නම් විනා මෙම රීතිය අනුව මෙම රීති අත්හිටුවීම යටතේ කාලය සීමා කිරීමට මූලාසනයට අවසර නැහැ. ඒ නිසා කරුණාකරලා පොදු එකඟතාවයකට එනවා නම් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එකඟතාවයකට එන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විනාඩි 15, 15.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විනාඩි 15, 15 දෙපැත්තටම තීන්දු කරලා ඒ අනුව කථික ලැයිස්තු ලබා දෙන්න. පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.45]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා මේ ගෞරවනීය බස්නාහිර පළාත් සභාවට එන්න ඉස්සෙල්ලා මම පළාත් පාලන ආයතනයක් වන බේරුවල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට ඒ වාගේම විපක්ෂ නායකවරයා හැටියට -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව ස්ථිර කළාද? යෝජනාව ස්ථිර කළේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සිසිර ජයකොඩි ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට වසර 10 ක් කටයුතු කරපු කෙනෙක්. ඒ නිසා අපි පැහැදිලිවම දන්නවා ඒ කාලය තුළ අපේ බේරුවල ආසනයේ ප්‍රාදේශීය සභාවේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා සමාවෙන්න. මේ යෝජනාව ස්ථිර කළේ කවුද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි ඔබතුමා කථා කරන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉන්න විශේෂයෙන්ම අහිංසක ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහාත්, ඒ වාගේම භෞතික සහ මානව සංවර්ධනය සඳහාත් ඉතා විශාල සේවාවක් ක්‍රියාත්මක කරන්න මට හැකියාව ලැබුණා. ඉතින් ඒ නිසා අපි පැහැදිලිවම දන්නවා මේ පළාත් පාලන ආයතන තුළින් මොනතරම් සේවාවක් ජනතාවට සිදු වෙනවාද කියලා. ඒ නිසා තමයි මේ පළාත් පාලන ආයතන අපේ මහජන නියෝජිතයින්ගේ අතේම තිබියදී ඒ සංවර්ධන කටයුතු සහ අනෙකුත් සියලු කටයුතු කරන්න කියලා කියන්නේ. අද වනකොට මේ පළාත් පාලන ආයතන විසුරුවා හැරලා කොමසාරිස් පාලනයට සම්බන්ධ කරන්න අදහස් කරගෙන ඉන්නවා. මේ පිළිබඳ විවිධ මහජන නියෝජිතයෝ, ඉහළ සිටින දේශපාලඥයෝ මේ මස 15 වැනිදා විසුරුවා හැරීමට තීරණය කරලා තිබෙනවා. ඉතින් ඒ නිසා මම ඉතාමත්ම කනගාටු වෙනවා මේ මහජන නියෝජිතයෝ පිළිබඳව. පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍යවරයා එහෙම නැත්නම් මැති ඇමැතිවරු විශේෂයෙන්ම රාජිත සේනාරත්න, ජෝන් අමරතුංග වැනි අය පිළිබඳව අපි අපේ අප්‍රසාදය පළ කරනවා. මොකද, පුංචිම දේශපාලඥයෙක් හැටියට ඉහළ දේශපාලඥයින්ට ඒ තැනට ඒමට ජනාධිපති වීමට, අග්‍රාමාත්‍යවරයා බවට පත් වීමට ඒ වාගේම මැති ඇමැතිවරු බවට පත් වීමට අපට පළාත් සභාව නියෝජනය කරන්න අවස්ථාව ලබා දීමට මේ පළාත් පාලන නියෝජිතයෝ මොනතරම් කැපවීමක් කළාද? ඒ නිසා මේ කැපවීම පිළිබඳවත් තකන්නේ නැතුව අද මේ අය විවිධ කථා කියමින් මේ 15 වෙනිදා විසුරුවා හරිනවා කියන එක අපට මාධ්‍ය තුළින් දකින්නට ලැබුණා.

ඒ නිසා අපි විශේෂයෙන්ම කියනවා, නායකයින් පිළිබඳව අපේ ලොකු කනගාටුවක් තිබෙනවා. ඒ නිසා තමයි මේ යෝජනාව මේ සභාවට ගෙනාවේ. ඒ නිසා අපි විශේෂයෙන්ම මේ යෝජනාව තුළින් අතිගරු ජනාධිපතිතුමා, ඒ වාගේම අග්‍රාමාත්‍යතුමා, පළාත් පාලන විෂයය භාරව කටයුතු කරන ගරු අමාත්‍යතුමා, අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරන්න තමයි මේ යෝජනාව අපි ගෙනාවේ. අද සමහර නායකයින්ට මේ පළාත් පාලන නියෝජිතයින්ගේ කාර්ය භාරය අමතක වුණාට පළාත් සභාවක් නියෝජනය කරන අපට එය එසේ අමතක කරන්නට පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි විශේෂයෙන්ම අද දිනයේදී මේ කර්තව්‍යයේදී පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඔබ සියලු දෙනාම මෙයට සහයෝගය ලබා දෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම තමයි අද මේ වනවිට එක්සත් ජාතික පක්ෂයේ

කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළක් අනුව තමයි මෙයි ක්‍රියාත්මක කරන්න උත්සාහ ගන්නේ. මේ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සමහර නායකයිනුත් සම්බන්ධ වෙන්න පටන් අරගෙන තිබෙනවාද?

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

කවුද ඒ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

නම කියන්න.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

සමහර නායකයින් තමන්ගේ පක්ෂය පිළිබඳව බොහොම උනන්දුවෙන් කථා කළාට ශ්‍රීලංකා නිදහස් පක්ෂය දිය කරන්න, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැති කරන්නට හදන උත්සාහයක් ක්‍රමන්ත්‍රණයක් හැටියටයි අපි මේ වැඩ පිළිවෙළ දකින්නේ. ඒ නිසා තමයි මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වැඩි බලයක් තිබෙන එක්සත් ජනතා නිදහස් සන්ධානයට වැඩි බලයක් තිබෙන මේ පළාත් පාලන ආයතන විසුරුවන්න තීරණය කරලා තිබෙන්නේ. ඒ නිසා අපි විශේෂයෙන්ම මේ රටේ නායකත්වය දරන අතිගරු ජනාධිපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, මේ කුමන්ත්‍රණකාරී වැඩ පිළිවෙළට සම්බන්ධ වෙන්න එපා. මොකද, මේ දෙපැත්තේම ඉන්න පළාත් පාලන නියෝජිතයෝ යම්කිසි අහිංසක දීමනාවක් ලබනවා නම් ඒ දීමනාවට වඩා වැඩි ප්‍රමාණයකින් අපේ ආදරණීය ජනතාව වෙනුවෙන් සේවය කරලා තිබෙනවා. ඒ අතර එක්කෙනෙක් දෙන්නෙක් ඉන්න පුළුවන්. තමන්ගේ බඩ වඩා ගන්න. ඒ වාගේම මේ පළාත් පාලන ආයතනයේ බලය යොදාගෙන තමන්ගේ පෞද්ගලික කාල සටහන් ක්‍රියාත්මක කරන. නමුත් අපි දන්නවා පැහැදිලිවම ඉතාමත්ම අහිංසක විධියට තමන්ගේ ජනතාවට දෙන්න තිබෙන උපරිම සහයෝගය ලබා දෙමින් කටයුතු කරන මහජන නියෝජිතයෝ පළාත් පාලන ආයතන තුළ ඉන්නවා. ඒ නිසා ඒ සියලු දෙනාට දක්වන ගරුත්වයක් හැටියට මම විශේෂයෙන්ම කියනවා මේ පළාත් පාලන ආයතන දීර්ඝ කරලා දෙන්න. එසේ කරන්න බැරි නම් අනිවාර්යයෙන්ම එය විසුරුවා හරිනවා නම්, එහෙම නැත්නම් පළාත් පාලන ආයතන කොමසාරිස්වරයෙක් යටතට පත් කරන්න සූදානම් වෙනවා නම් මාස දෙකක් ඇතුළත මැතිවරණය තියලා ඒ මැතිවරණයේ කටයුතු ඉටු කරන්න මේ රජයට බල කරන්න කියන එක තමයි අපි විශේෂයෙන්ම කියන්නේ. ඒ නිසා අපි පැහැදිලිවම දන්නවා මේ යහපාලන ආණ්ඩුව මොකටද මේ අරඅදින්නේ කියලා. මේ යහපාලන ආණ්ඩුව මොකටද මේ අරඅදින්නේ? ඒ අරඅදින්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එහෙම නැත්නම් එක්සත් ජනතා නිදහස් සන්ධානය දිය කරන්න. ඒක කවදාවත් හරි යන්නේ නැහැ. අපි පැහැදිලිවම කියනවා හෙට පළාත් පාලන ආයතනවල ඡන්දය තිබ්බත් අපේ පළාත් පාලන නියෝජිතයෝ සභාපතිවරු, උප සභාපතිවරු, මන්ත්‍රීවරු ඉතාමත්ම හොඳින් ජනතාවට වැඩ කරපු නිසා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මෙහෙම තමයි මහින්ද රාජපක්ෂ මහත්මයා කිව්වේ.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

අපි මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නේ විශේෂයෙන්ම මේ කුමන්ත්‍රණකාරී -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දැනුත් වෙන්නේ ඒක තමයි.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

වැඩ පිළිවෙළට -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

දින 100 වනකොට ඔයගොල්ලෝ ඉවරයි.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ජෝන් අමරතුංග, රාජිත සේනාරත්න වැනි අයට අපේ අප්‍රසාදය ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.51]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතන පිළිබඳව අද විසුරුවා හැරීම කල් දාන්න කියලා රීති අත්හිටුවලා ගෙනාපු යෝජනාව පිළිබඳව අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න බලාපොරොත්තු වෙනවා. මම හිතන්නේ පළාත් පාලන ආයතනවල නියමිත කාල සීමාව මේ වනකොට අවසන් වෙලා තියෙන්නේ. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව එහෙම නැත්නම් තමුන්නාන්සේලාගේ වචනයෙන් කියන යහපාලන ආණ්ඩුව එක අවස්ථාවක් දුන්නා පළාත් පාලන ආයතන කල් දාලා තව ටිකක් දුරට හොකරම් කරගෙන මේක ගෙනියන්න. ඒ නිසා අපි එකක් කියන්න කැමැතියි.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හොරකම් කරන්නද දුන්නේ?

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

එහෙම නම් මැතිවරණය තියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මොකද, අපි නොවෙයි හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයා කිව්වා. හොරුන්ට දඬුවම් නොදී, වංචාකාරයන්ට දඬුවම් නොදී ඒ අය ආරක්ෂා කර ගැනීම තමයි අද මට පළ දීලා තියෙන්නේ කියලා පසුගිය දවසක කිව්වා. එහෙම නම් තමුන්නාන්සේලා -

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හිටපු ජනාධිපතිතුමා එහෙම ප්‍රකාශයක් කරලා නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

කිසිම මාධ්‍යයක එහෙම ප්‍රකාශයක් කරලා නැහැ. ඒ නිසා මම ඒ වචනය ඉල්ලා අස්කර ගන්න කියලා විපක්ෂ නායකතුමාට කියනවා.

[සභාවේ ඝෝෂා]

හිටපු ජනාධිපතිතුමා කිසිම මාධ්‍යයක ප්‍රකාශයක් කරලා නැහැ හොරුන්ට දඬුවම් කළේ නැහැයි කියලා. වැරැදි කරපු අයට -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇමැතිතුමා වාඩි වෙන්න. මෙතුමාගේ කථාවට බාධා කරන්න එපා. ඔබතුමා කථා කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් එතුමා කළේ. මම දන්නේ නැහැ මොකක්ද හේතුව කියලා. එතුමාට කන් ඇහෙන්නේත් නැහැ. ඇස් පේන්නේත් නැහැ වාගේ. ඒ නිසා කන් ඇහෙන්නේ නැති එක පිළිබඳව අපට කරන්න දෙයක් නැහැ. ඒ නිසා අපි මතක් කරන්නේ පසුගිය කාලයේ දිගින් දිගටම කිව්වා, මේ පළාත් පාලන ආයතනවල තිබෙන දූෂිත වැඩ. මහ ඇමැතිතුමාට අපි දිගින් දිගටම කිව්වා, මේ පළාත් පාලන ආයතනවල දූෂණ වැඩ සිද්ධ වෙනවා, මේ පිළිබඳව හොඳට ඇස් කන් ඇරලා බලාගෙන ඉඳලා ඔබතුමා ඔබතුමාගේ පක්ෂයේ වුණාට කමක් නැහැ, වැරැදි කරන මිනිස්සුන්ට දඬුවම් දුන්නොත් විතරයි මම හිතන්නේ පළාත් සභාව කීර්තිමත් තැනකට ගෙනියන්නේ. කීර්තිමත් තැනකට යන්නේ. මහ ඇමැතිවරයා හැටියට කීර්තිමත් පුද්ගලයෙක් බවට පත් වෙන්නේ තමන්ට මැතිවරණ කාලයේදී දේශපාලන කටයුතු කරපු සභාපතිවරු ආරක්ෂා කිරීම නිසා නොව ඔවුන් වැරැද්දක් කළාම වරැද්දට දඬුවම් දීලා කටයුතු කළා නම් ඊට වඩා කීර්තියක් අත්පත් වෙනවා. ඒ නිසා අපි දන්නවා අද මේ හැමෝම කැමැතියි පාර්ලිමේන්තුව විසුරුවා හරින්න. අපිත් කැමැතියි. ඒකේ කිසි ප්‍රශ්නයක් නැහැ. පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා නම්, විසුරුවා හැරීමට නියමිතව තිබෙන, කල් පහු වෙලා තිබෙන පළාත් පාලන ආයතන විසුරුවන්න එපා කියන

ඉල්ලීම මොකටද කරන්නේ? හරි නම් තමුන්නාන්සේලා කරන්න ඕනෑ පළාත් පාලන ආයතනත් විසුරුවලා වහාම ඡන්දයකට යන්න කියන එකයි. ඇයි ඒකට හය?

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

යෝජනාව කියවන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඡන්දයක් ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තුන්වැනි ඡේදය කියවන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපි 'ඇ' කොටසට එකඟයි. මේ ආණ්ඩුවකට පළාත් පාලන ආයතන විසුරුවන්න තිබුණාම කොන්දේසි දාලා ඒක කරන්න බැහැ. අපි අවශ්‍ය නම් පළාත් පාලන ආයතන විසුරුවනවා. පළාත් පාලන ආයතන විසුරුවනවා. කවුරුවත් කිව්වාද එදා විසුරුවන්න එපා කියලා. මතක තියා ගන්න මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා වර්තමාන ජනාධිපතිතුමා ළඟ ගිහිල්ලා කරපු කන්කෙඳිරි ගෑමේ එක ඉල්ලීමක් තමයි අනේ, පළාත් පාලන ආයතන විසුරුවන්න එපා කියලා. ඒ නිසා මතක තියා ගන්න, මේ රාජ්‍ය අනුග්‍රහය තවදුරටත් තියාගන්න තමයි - ඔබතුමන්ලා දන්නවාද දන්නේ නැහැ පසුගිය කුරුණෑගල රැස්වීමට පළාත් පාලන ආයතන ගණනාවක සේවකයෝ අත්සන් කරලා ඒ රැස්වීමට අරගෙන ගියා.

[සභාවේ ඝෝෂා]

පළාත් පාලන ආයතනවල. අපි දන්නවා මේ පිළිබඳව -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ පිළිබඳව ප්‍රධාන ඇමැතිතුමනි, මම කොමසාරිස්වරියට දුරකථනයෙන් කථා කරලා කිව්වා, ඔබතුමිය අහවල් පළාත් පාලන ආයතනයට යන්න. ගිහිල්ලා පරීක්ෂා කරන්න. 32 දෙනෙක් අත්සන් කරලා අද කුරුණෑගල රැස්වීමට ගිහිල්ලා ඉන්නවා කියලා. ඒපාර මට එතුමිය කිව්වා, එතුමියටත් ආරංචි වෙලා තිබෙනවා කියලා. ඒ නිසා අද මහින්ද රාජපක්ෂ මහත්මයාට ජැක් එක ගහන්න ආණ්ඩු බලය තිබෙන පළාත් පාලන ආයතන විසුරුවන්න එපා කියන්නේ, කැබ් පාවිච්චි කරන්න, සේවකයෝ පාවිච්චි කරන්න, මේ හයිය පාවිච්චි කරන්න තමයි අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. ඒ නිසා -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒකට බය වෙලා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අද සමහර පළාත් පාලන ආයතනවල අලුත් සංස්කෘතියක් බිහි වෙලා. ඒක තමයි දැනට අවුරුදු දෙකකට විතර ඉස්සෙල්ලා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රූපය තියෙන ඡායාරූපශාලා වාගේ තිබෙන අර පාරවල්වලට දාපු අලුත් බෝඩ්. ආයිත් ඒවා ගලවලා පාරවල්වල අලුතින් හයි කරගෙන යනවා. පළාත් පාලන ආයතනවල -

[සභාවේ ඝෝෂා]

ඒවා පරණ වෙන්න නොදී -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔයගොල්ලොත් හදලා බෝඩ් ගහගන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ප්‍රචාරාත්මක වැඩ සටහන් විධියට. ඒ නිසා මම කියන්නේ මතක තියාගන්න පාර්ලිමේන්තුව විසුරුවා හරිනවා නම්,

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

මේ පළාත් පාලන ආයතනත් විසුරුවා හැරලා, ඊට එහා වගකීම තියෙන්නේ අපේ ආණ්ඩුව අතේ. ආණ්ඩුව තීන්දුවක් ගන්නවා. ආණ්ඩුවට දොස් පවරන්න එන්න එපා කියන එක තමයි අපි තමුන්නාන්සේලාට කියන්නේ.

[පූ.භා. 11.59]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල**
Hon. Udaya Prabhath Gammanpila

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන වගන්තිය යටතේ අපේ රටේ පරමාධිපත්‍ය තියෙන්නේ ජනතාවට. ජනතාව තමන්ට පරමාධිපත්‍ය තිබෙනවා කියලා මේ මිලියන 21 ක්වූ ජනතාවට රට පාලනය කරන්න බැහැ. ඒ නිසා මේ අය මැතිවරණ හතරකදී තල හතරක නියෝජිතයන් පත් කර ගන්නවා. ජනාධිපතිවරයා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රීවරු, අවසාන වශයෙන් පළාත් පාලන නියෝජිතයන්. මේ අය රජයේ නිලධාරීන්. මහජනතාවට අවශ්‍ය ආකාරයට රටේ පරිපාලනය ගෙන යනවාද කියන එක මහජන වෙනුවෙන් පරීක්ෂාවෙන් ඉන්නයි පත් කරන්නේ. ජනතාව වෙනුවෙන් තමයි ඒ මහජන නියෝජිතයා පෙනී සිටින්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතන ඉතාම වැදගත්. පළාත් පාලන ආයතන නියෝජිතයා ඉන්නේ තමන්ගේ ගමේ. ප්‍රශ්නේ අත්විඳිනවා. ගමේ ප්‍රශ්නය ආයතනයට අරගෙන ගිහිල්ලා නිලධාරීන් හරහා විසඳනවා. මොකද, හවස ආපහු ගමට එන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ වාගේ, සමහර වෙලාවට පළාත් සභාවේ වාගේ ගමෙන් බැහැර වෙලා නොවෙයි පළාත් පාලන මන්ත්‍රීවරයා ජීවත් වෙන්නේ. ඒ නිසා පළාත් පාලන නියෝජිතයන් ජනතාවගේ හඬයි නියෝජනය කරන්නේ. පළාත් පාලන ආයතන නියෝජිතයා අකර්මන්‍ය කරනවා කියන්නේ ජනතාවගේ හඬ අකර්මන්‍ය කිරීමක්. ජනතාවගේ පරමාධිපත්‍යයට පහර ගැසීමක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වර්තමාන ආණ්ඩුව ජනතා පරමාධිපත්‍ය පිහිටුවීම තමන්ගේ අධිෂ්ඨානය කියලා ජනවරමක් පැතූ ආණ්ඩුවක්. එහෙම නම් මේ ආණ්ඩුවට තමන්ගේ ජනවරමට පටහැනිව ගිහිල්ලා මේ ජනතා නියෝජිත ආයතන නිලධාරීවාදයට යට කරන්න බැහැ. ජනාධිපතිතුමාගේ ධූරය හිස් වුණොත් ඒක නිලධාරියෙකුට භාර දෙන්න බැහැ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ කාර්ය භාරය නිලධාරියෙකුට භාර දෙන්න බැහැ. පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ කාර්ය භාරය නිලධාරීන්ට භාර දෙන්න බැහැ. ඇයි එහෙම නම් පළාත් පාලන ආයතනවල විතරක් මෙහෙම නීතියක් තියෙන්නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නීතියේ අරමුණ තමයි පාර්ලිමේන්තුවේ ඇමැති මණ්ඩලය ඉන්නවා. පළාත් සභාවේත් ඇමැති මණ්ඩලය ඉන්නවා. පළාත් පාලන ආයතනවල විධායක තීන්දුව ගන්නේ සමස්ත සභාවම එකතු වෙලා. සෑම තීන්දුවක්ම සභාව අනුමත කළ යුතුයි. විධායක තීන්දුව වැරදුණාම ඇමැති මණ්ඩලය විසුරුවා හරිනවා වාගේ මෙතැන විසුරුවා හරින්න වෙන්නේ සමස්ත සභාවයි. මූල්‍ය වරදක් කළා නම් කළා වෙන්නේ සමස්ත සභාවමයි. ඒ නිසා එවැනි අවස්ථාවල තමයි මේ නිලධාරී පාලනයක් - වෙන විකල්පයක් නැහැ ප්‍රශ්නයක විසඳගන්න තුරු. විමර්ශනය සිදු වනතුරු තමයි නිලධාරී පාලනයක් ඇති කරීමේ අවශ්‍යතාවය තියෙන්නේ. ඒක වැරැදියට කොහේ හරි පාවිච්චි කරන්නවා නම් අපි ඒකට ඉඩ නොදිය යුතුයි. මම හිතන්නේ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා පසුගිය කාලයේ ජනතාවට යහපාලනයක් පොරොන්දු වූ මන්ත්‍රීතුමන්ලා විධියට මේ අවස්ථාවේ අපේ පළමුවැනි විකල්පය, අපි වඩාම කැමැති විකල්පය මැතිවරණයකට යමු. ජනතාවට අවස්ථාව දෙමු තමන්ගේ මහජන නියෝජිතයා තෝරා ගන්න. හැබැයි මට ආරංචි විධියට අද ආණ්ඩුවෙන් කියනවාලු කඩලා තිබෙන කොට්ඨාශ නිර්ණය කරලා තිබෙනවා. වර්තමාන නීතිය යටතේ කොට්ඨාශ ක්‍රමයටයි තියන්න ඕනෑ. මේ කොට්ඨාශ කඩලා තිබෙන ආකාරය පිළිබඳව, සීමා නිර්ණය පිළිබඳව සෑහීමකට පත් වෙන්නේ නැහැයි කියලා. විකල්ප දෙකක් තියෙනවා. (බාධා කිරීම්) පළමුවැනි විකල්පය තමයි මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් නියෝජ්‍ය සභාපතිතුමාගෙන් වෙලාවක් ඉල්ලා ගන්න. මට තියෙන්නේ විනාඩි 05 යි. ඒකෙන් නම් විනාඩියක්වත් දෙන්න බැහැ.

ඉතින් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සීමා නිර්ණය ගැන සෑහීමට පත් වෙන්නේ නැත්නම් විකල්ප දෙකක් තිබෙනවා. පළමුවැනි විකල්පය තමයි මේ මැතිවරණ ක්‍රමය අහෝසි කරලා පරණ ක්‍රමයට මේ ඡන්දය විතරක් තියන්න පුළුවන්. හැබැයි ඒක තියන එක වර්තමාන ආණ්ඩුවේ ජනවරමට පටහැනියි. මෙතුමන්ලා ජනවරමක් ගත්තේ කොට්ඨාශ ක්‍රමය පළාත් සභාවට සහ පාර්ලිමේන්තුවටත් ගේනවා කියලා. එහෙම ජනවරමක් ගත්තු අයට තිබෙන

කොට්ඨාශ ක්‍රමයත් අහෝසි කිරීමේ හැකියාවක් නැහැ. එහෙම නම් අපට ඉතුරු වෙලා තියෙන්නේ එකම එක විකල්පයයි. තමුන්නාන්සේලා සෑහීමට පත් වන ආකාරයෙන් කොට්ඨාශ නිර්ණය කර ගන්නා තුරු කාලය දික් කිරීමයි. ඇයි ඒ කාලය දික් කිරීමට අදාළ පනත් තුනේම මහ නගර සභා, නගර සභා 10 (2) වගන්තිය යටතේ, ප්‍රාදේශීය සභා පනතේ 5 (2) වගන්තියෙනුත් විෂයය භාර අමාත්‍යවරයාට බලතල ලබා දීලා තිබෙනවා. එයින් මාස 1 ½ ක් දැනට දිගු කරලා තිබෙනවා. එයින් මාස 1 ½ දිගු කළේ ඇයි? ඒ මාස 1 ½ තුළ කොට්ඨාශ ක්‍රමය බිහි කිරීමට අමාත්‍යවරයා කරපු කාර්ය භාරය මොකක්ද? මේ කිසි දෙයක් රටට කියන්නේ නැතුව හදිසියේම නිලධාරී පාලනයක් ගෙන එනවා නම් ඒක ප්‍රජාතන්ත්‍ර විරෝධීයි. ජනතා පරමාධිපත්‍යයට පටහැනියි. මහජන නියෝජිතයන් විධියට මේ සභාව අනිවාර්යයෙන් විරුද්ධ විය යුතුයි කියන කාරණය සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 12.05]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ස්තුතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම පළාත් පාලන ආයතන විසුරුවා හැරීම සහ ඡන්දය පැවැත්වීම ගැන අපේ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව - මම පුදුම වෙනවා. එදා මේ සභාවේ කථා කරපු මන්ත්‍රීවරු කොළඹ නගර සභා මැතිවරණය, 2006 පවත්වපු නගර සභා මැතිවරණය 2008 දී ඒ නගර සභාව විසුරුවා හැරියා. ඒ නගර සභාවට චෝදනා රාශියක් දාලා ඒ නගර සභාව විසුරුවා හැරලා 2012 වනකල් නගර සභා මැතිවරණය පැවැත්වූයේ නැහැ. කවුද? මේ රාජපක්ෂ පාලනය. තමුන්නාන්සේලා එදා ආණ්ඩු පක්ෂයේ ඉඳගෙන එදා කොළඹ නගරයේ ජීවත් වන ජනතාවගේ ඡන්ද අයිතිය උල්ලංඝණය කරන කොට තමුන්නාන්සේලා නිශ්ශබ්දව බලාගෙන හිටියා. අද එහෙම නිශ්ශබ්දව බලාගෙන හිටපු තමුන්නාන්සේලා කථා කරනවා ජනතාවගේ ඡන්ද අයිතිය සහ (බාධා කිරීම්) නැහැ නැහැ විසුරුවා හැරලා ඡන්දය තිබ්බේ නැහැ.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඒකට පරීක්ෂණයක් කළා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

විශේෂ කොමසාරිස්වරයෙක් යටතේ කොළඹ නගර සභාව අරගෙන ගියා. එදා තමුන්නාන්සේලා -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මෛත්‍රීපාල පක්ෂයේ මහ ලේකම්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කිව්වාද ඡන්දය තියන්න කියලා. එදා කිව්වේ නැහැ. ඇයි කොළඹ දිනන්න බැහැ. ඒ නිසා ඡන්දය තිබ්බේ නැහැ. එදා එක්සත් ජාතික පක්ෂයේ බලකොටුව කොළඹ නගරය ජයග්‍රහණය කරන්න බැරි නිසා විශේෂ කොමසාරිස්වරයෙක් දාලා මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ලා එදා කොළඹ නගරයේ ජනතාවගේ ඡන්ද අයිතිය පාගලා, එදා අපේ තිබුණු ඡන්ද අයිතියට තමුන්නාන්සේලා ගරු කළේ නැහැ. එහෙම ගරු කරන්නේ නැතුව අද ඇවිල්ලා තමුන්නාන්සේලා කථා කරනවා මේ පළාත් පාලන ආයතන නියෝජිතයාගේ අයිතිය ගැන. මොකක්ද මේ? තමුන්නාන්සේලාට කෙල වෙනකොට හොඳ නැහැ. අපට කෙල වෙනකොට මේක විසුරුවන්න හොඳයි. විශේෂ කොමසාරිස් කෙනෙක් ගන්නකොට හොඳයි.

[සභාවේ ඝෝෂා]

ඡන්දය තියන්නේ නැතුව ඉන්නකොට හොඳයි. ගෝඨාභය එදා කොළඹ පාලනය කරන කොට හොඳයි. අද අපි මේක විසුරුවා හරිනවා කියලා කිව්වාම -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ගෝඨාභයට පිං සිද්ධ වෙන්න තමයි කොළඹක් තියෙන්නේ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

දඟලනවා. හුම්තෙල් ගෑවුණු ගැරඬියෝ වාගේ ඇයි? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් අපේ උදය ගම්මන්පිල

[ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්]

ගරු මන්ත්‍රීතුමා කිව්වා මේ කොට්ඨාශ ක්‍රමය ගැන. ඔබතුමාට මතක නැහැ. මේ කොට්ඨාශ හැදුවේ කොහොමද? බැසිල් රාජපක්ෂගේ අමාත්‍යාංශයට මේ සීමා නිර්ණය, මේ සීමා සිතියම් ගෙනැල්ලා පළාත් පාලන ආයතනවල ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඕනෑ විධියට තමයි මේවා නිර්ණය කළේ. ඇයි ඒවා මතක නැද්ද? එහෙමයි කළේ. මතක තියාගන්න. පක්ෂ මුකුත් නැහැ. බැසිල් රාජපක්ෂ තමයි සිතියම ඇන්දේ. සිතියම ඇන්දේ බැසිල් රාජපක්ෂ. අද මේගොල්ලන්ට ඒවා මතක නැහැ. අද ඕනෑ නම් ගිහිල්ලා බැසිල් රාජපක්ෂ මහත්තයාගෙන් අහන්න එයා තමයි සිතියම ඇන්දේ. ඒ නිසා මේවා ගැන ගැටළු තියෙනවා. අපට කැඳවීම් කළේ නැහැ. (බාධා කිරීමක්) ඒක තමයි. කැඳෙව්වේ නැත්තේ ඇයි? බැසිල්ගේ අමාත්‍යාංශය කළේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බොරු කියන්න එපා. අමාත්‍යාංශය කළේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ පළාත් පාලන ආයතන (බාධා කිරීම්) ඒවා විශේෂ කොමසාරිස්වරයෙක් හරි ඒ බලතල ආයතනයට දීලා ඡන්දය නිසි වෙලාවට තියයි. ඒ ඡන්දය ගැන තමුන්නාන්සේලා කලබල වෙන්න එපා. මොකද, තමුන්නාන්සේලා එදා කොළඹ නගර සභාවේ ඡන්දය තියන්න එදා මෙතැන ඇවිල්ලා කෑගැහුවේ නැහැ. අපි එදා කොළඹ නගර සභාවේ ඡන්දය තියන්න කියලා කෑගහනකොට තමුන්නාන්සේලා එදා ගල් බිල්ලෝ වාගේ බිම බලාගෙන හිටියා. අද ඇවිල්ලා පළාත් පාලන මන්ත්‍රීවරුන්ගේ අයිතිය ගැන කථා කරනවා. අද පළාත් පාලන ජනතාවගේ අයිතිය ගැන කථා කරනවා. බොහොම හොඳයි. කථා කරන්න. මම එපා කියන්නේ නැහැ. එහෙම නම් එදා ඒ කොළඹට වුණු දේ ගැනත් කථා කරන්න. ඇයි එදා ඡන්දය තියන්නේ නැතුව -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කොළඹ නාම යෝජනා හදාගන්න බැරි වුණා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

කොහොමද පත් කළේ? ඒකට උත්තර දෙන්න. අවුරුදු හතරක් කොළඹ නගර සභාවේ ඡන්දය තිබ්බේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ බලය, එක්සත් ජාතික පක්ෂය ජයග්‍රහණය කරයි කියලා ඡන්දය තියන්න බය වුණා. ඒ විපාක තමයි මේ කැරකිලා එන්නේ. සංශෝධනය නොවෙයි. ඇයි ඡන්දය තිබ්බේ නැත්තේ? එදා පළාත් පාලන ආයතන - කොළඹ නගර සභාවේ ඡන්දය තියන්න බය වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතන ඔය කියලා තිබෙන දිනයට විසුරුවා හරිනවා. ඒ වාගේම මේ යහපාලනය කිසිම දවසක ඡන්ද කල් දාලා හෝ එහෙම නැත්නම් ඡන්ද නොතියා හෝ එහෙම යන්න උවමනාවක් නැහැ. මොකද, මේ රටේ ලක්ෂ 64 ක ජනතාවගේ ඡන්දවලින් පත් වුණු ආණ්ඩුවක්, ජනාධිපතිතුමෙක් අපට මේ ඉන්නේ. ඒ නිසා අපට ඡන්ද කල් දාලා, මේ අය වාගේ ඡන්ද තියන්නේ නැතුව යන්න උවමනාවක් නැහැ. ඒ නිසා ආණ්ඩුව නිසි වෙලාවට, නිසි ක්‍රියා මාර්ග ගන්නවා කියන එක කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.10]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාම වැදගත් යෝජනාවක් සාකච්ඡා වන වෙලාවේ මම මතක් කරන්න කැමැතියි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මමත් පළාත් පාලන ආයතනයක හිටපු සභාපතිවරයෙක් හැටියට අද මේ යහපාලන ආණ්ඩුව ක්‍රියාත්මක වන ආකාරයත් එක්ක ගත්තාම අපට විශාල ගැටළුවක්, සැකයක් මතු වෙමින් පවතිනවා. මේ පළාත් පාලන ආයතන විසුරුවා හැරලා ඡන්දයක් නොතියා කොමසාරිස්වරයෙක් යටතට පත් කළොත් ජනතාවගේ පරමාධිපත්‍ය, ජනතාවගේ සිතුම් පැතුම් ඒ ආකාරයෙන් ඉෂ්ට වෙයිද කියන කාරණාව පිළිබඳව ලොකු ගැටළුවක් පවතිනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපි එහෙම කරන්නේ නැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

එහෙම කරන්නේ නැහැ කිව්වාට ගරු විපක්ෂ නායකතුමනි, අද මතු වෙලා තිබෙන තත්ත්වය තමයි මේ යහපාලන ආණ්ඩුව තුළ පසුගිය ආණ්ඩුවේ රාජ්‍ය ප්‍රතිපත්තිත් එක්ක ක්‍රියාත්මක වුණු ජනාධිපති ලේකම් ඉඳලා සෑම අමාත්‍යාංශයකම ලේකම්වරු අද උසාවි ගෙන්නලා හිර කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේ තත්ත්වය තුළ රාජ්‍ය නිලධාරීන් කිසියම් විධියක සුළු හෝ අභියෝගාත්මක කරුණක්, යම් අවධානම් කරුණකට යම් තීරණයක් ගන්න මැලි වන තත්ත්වයක් මතු වෙමින් පවතිනවා මේ යහපාලන ආණ්ඩුව තුළ. ඒ නිසා අපට බරපතළ අවිශ්වාසයක් තිබෙනවා මේ පළාත් පාලන ආයතන විසුරුවා හැරලා කොමසාරිස්වරයෙක් යටතට පත් කළාම ජනතාවගේ සිතුම් පැතුම්, අවශ්‍යතා ඉෂ්ට වෙන්න තිබෙන ඉඩකඩ ප්‍රමාණය ඉතාම බහුල ලෙස අවහිරතා මතු වීම තුළ ජනතාව අපේක්ෂාභංග තත්ත්වයට පත් වෙනවා කියලා. මේකද අපි බලාපොරොත්තු වෙන්නේ? මහජන නියෝජිතයෝ හිටියාම ජනතා අවශ්‍යතා පිළිබඳව හඳුනගෙන ක්ෂණිකව යම් යම් අවධානම් අරගෙන තීන්දු තීරණ අරගෙන ක්‍රියාත්මක වන තත්ත්වයක් අපට දකින්න පුළුවන්.

විශේෂයෙන්ම මේ රටේ හිටපු කීර්තිමත් රාජ්‍ය නිලධාරියෙකු වුණු දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාව අද උසාවි ගෙනිහිල්ලා හිර කරලා තිබෙනවා. එතුමා හොරකම් කරලා නොවෙයි. මේ පට්ටපල් බොරු. පාර්ලිමේන්තුවේ කැබිනට් මණ්ඩලයේ තීන්දු තීරණ එක්ක ක්‍රියාත්මක වුණු දිවි නැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වන රණවක මැතිතුමා මේ රටේ කීර්තිමත් රාජ්‍ය නිලධාරියෙක්. අද එතුමා හිර කරලා තිබෙනවා. මේ තත්ත්වය තුළ, මේ පසුබිම තුළ අද රාජ්‍ය ක්ෂේත්‍රයේ ඉන්න රාජ්‍ය නිලධාරීන් පිළිබඳව එහෙම තීන්දු තීරණ අරගෙන ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න පසුබට වන තත්ත්වයක් අද අපේ ක්ෂේත්‍රය තුළ තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යන්නේ මහා අවධානම් තත්ත්වයකට පළාත් පාලන ආයතන තමයි උපතේ සිට මරණය දක්වා අපේ රටේ ජනතාවට සේවාව සපයන ආයතනය. ඒ නිසාම මේ තත්ත්වය ඉතාම හොඳින් අවබෝධ කරගෙන මේ තත්ත්වයට අපි මුහුණ දෙන්නට අවශ්‍යයි. මේ ආණ්ඩුවට අපි කියනවා පාර්ලිමේන්තුවත් විසුරුවන්න. අපි බය නැහැ. අපි ලැහැස්තියි. ප්‍රාදේශීය සභාවත් විසුරුවන්න. හැබැයි කල් දාන්නේ නැතුව ඡන්දය තියන්න. තමුන්නාන්සේලා ඡන්දය තියන්න යන්නේ නැහැ. අපට තියෙන ආරංචිය තමයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද වනකොට තිබෙන ආරංචිය තමයි දින 100 ඉවර වනකොට පාර්ලිමේන්තුව විසුරුවනවා කිව්වා. විසිරෙව්වේ නැහැ. ඒ වාගේම තමයි මේ ප්‍රාදේශීය සභාත් විසුරුවලා විශාල කාල පරිච්ඡේදයක් කොමසාරිස් පාලනයේ තියලා අන්තිමට තමයි ඡන්දය තියන්න යන්නේ. ඒ නිසා මේ රටේ ජනතාවගේ අපේක්ෂා භංගත්වයක් ඇති වන තත්ත්වයක් මේ තුළ ඇති වෙනවා. ඒ නිසා මහජනතාව වෙනුවෙන් ගමේ ඉන්න මහජන නියෝජිතයා හැටියට ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතවරු විශාල සේවාවක් කරපු උදවිය. අද මෙතුමන්ලා ඔක්කෝටම හොරු හොරු කියනවා. අද ප්‍රාදේශීය සභාවල ඉන්න අයට හොරු කියනවා නම් කරුණාකරලා නම් කරලා කියන්න. ඊයේ පෙරේදා මම මාධ්‍ය හරහා දැක්කා හිටපු ජනාධිපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ප්‍රාදේශීය සභා නියෝජිතයෝ පට්ටපල් හොරු හැටියට එතුමිය හැඳින්නුවා. මම කනගාටු වෙනවා. මේ රටේ හිටපු විධායක ජනාධිපතිවරියක් හැටියට එතුමියගේ ප්‍රකාශය බස්නාහිර පළාත් සභාව හැටියට අපි දැඩි ලෙස හෙළා දකිනවා. එතුමිය විතර කම්බ හොරෙක් නැහැ. ඒකත් මම කියනවා. වික්ටර් අයිවන් චෞර රැජිණ කියලා පොතක් ලිව්වා. ඒ චෞර රැජිණ -

[සභාවේ ඝෝෂා]

ඒ පොතේ තිබෙනවා එතුමිය කරපු (බාධා කිරීම්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එදා විහාර මහා දේවි කියලා කිව්වේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

එහෙම හොරකම් කර කර තමයි මේ අහිංසක ප්‍රාදේශීය සභාවල ඉන්න මහජන නියෝජිතයන්ට හොරු කියලා කියන්නේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග නෝනා.

[ගරු ගුණසිරි ජයනාත්]

බස්නාහිර පළාත් සභාව හැටියට එතුමියගේ ප්‍රකාශය දැඩි ලෙස අපි හෙළා දකිනවා. මේ රටේ මහජනතාව වෙනුවෙන් ළඟම සම්බන්ධතාවය පවත්වාගෙන කටයුතු කරන ගමේ මහජන නියෝජිතයා වුණු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට මේ කරපු අපහාසය සම්බන්ධයෙන්. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි ආණ්ඩුවට කියනවා දින 100 දැන් ඉවරයි. දින 100 යි පව 1000 යි. පවම තමයි කෙලින්නේ. ඒ නිසා තමයි දින 100 පාර්ලිමේන්තුව විසුරුවලා මැතිවරණයකට යනවා කිව්වා. ගියාද? අපි අහනවා. තියන්න මැතිවරණයක්. අපි සූදානම්. පාර්ලිමේන්තුව විසුරුවලා මැතිවරණයකට යන්න. අපි අභියෝග කරනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

අපෙත් යෝජනාව විසුරුවා හරින්න කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මැතිවරණයකට බයේ නොවෙයි අපි මේ යෝජනාව ගෙන එන්නේ. මේ යෝජනාව ගේන්නේ ප්‍රාදේශීය සභා විසුරුවලා මාස දෙකක් වාගේ කාල පරිච්ඡේදයක් තුළ මැතිවරණයක් පවත්වන්න කියන යෝජනාවයි අපි මේ කරන්නේ. ඒ නිසා මේ යෝජනාව සම්බන්ධයෙන් තමුන්නාන්සේගේ අවධානය යොමු කරලා මේ යෝජනාවට සහාය දෙන්න කියන කාරණය මතක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.15]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ගැන ලොකු කලබලයක් ඇති කරගත යුතුයි නැහැයි කියලයි මම විශ්වාස කරන්නේ. මේකේ ප්‍රශ්නය තියෙන්නේ (බාධා කිරීම්) ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කාලය මේ යන්නේ. මම විනාඩි 05 න් ඉවර කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලංකාවේ දේශපාලනයේ වත්මන් හැඩ රුව දිහා හැරිලා බැලුවාම ඇත්ත වශයෙන්ම මේ පළාත් පාලන ආයතන විසුරුවා හැරීම පිළිබඳව මහ ලොකු ඉල්ලීමක් එන්නේ සන්ධානයේ අනාගතය ගැන අවධානමක් තිබෙන වෙලාවක. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහත්මයාත් පසුගිය දවසක හම්බ වුණු වෙලාවේ කාරණා 05 ක් පිළිබඳව අවධානය යොමු කෙරුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රධානම කාරණය තමයි මේ අගමැති අපේක්ෂකයා කවුද කියලා නම් කරන එක. මෙතනදී බොහෝ දෙනා අහන ප්‍රශ්නයක් තමයි එදා මහින්ද රාජපක්ෂ මහත්මයා තමන් ජනාධිපතිවරයා ලෙස ඉන්න කාලේ ආදර්ශයක් - එදා අපට මතකයි දි.මු. ජයරත්න මහත්මයා ඇඳුම් මහගෙන විශාල කාලයක් බලාගෙන හිටියා අගමැති වෙන්න. එහෙම කරපු මහින්ද රාජපක්ෂ මහත්මයා අද මෛත්‍රීපාල සිරිසේන මහත්මයා හම්බ වෙලා කියනවා අනේ, අගමැති අපේක්ෂකයා නම් කරන්න. නම් කරන්න ඉඩ දෙන්න. කවුද කියලා කියන්න කියලා. මේක මේ මහා විහිළුවක්. මම මේ කියන්න හදන්නේ දේශපාලන කාරණය. ඊළඟට තවත් ඉල්ලීමක් කරනවා. මොකද, මේ ඉල්ලීම? පළාත් පාලන ආයතන විසුරුවා හරින්න එපා කියන එක. මොකක්ද ඒකට ජනාධිපතිතුමා දුන්නු උත්තරය. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කියනවා දැනටමත් පළාත් පාලන ආයතනවල නිල කාලය අවසන් වෙලා තියෙන්නේ. සන්ධාන මන්ත්‍රීවරුන් මාර්තු මාසේ කරපු ඉල්ලීම නිසා දැනටමත් මාස 1 ½ ක් කල් දාලා තියෙන්නේ. කල් දාපු කාලයත් මැයි 15 වැනිදා අවසන් වෙනවා. ඒක කාගේවත් පෞද්ගලික තීරණයක් නොවෙයි කියලා එතුමා එදා දැනුම් දුන්නා. දැන් මේ කඩ කඩ, පැන පැන ඡන්ද තියපු මහින්ද රාජපක්ෂ මහත්මයලා අද ඡන්දය එපා කියන්නේ ඇයි?

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

එපා කියන්නේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

කවුද එපා කියන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පොඩ්ඩක් ඉන්න කෝ කියන්න. මට කියන්න දෙන්නේ නැහැ නේ? ඡන්දයට විරුද්ධයිද? ඇයි මේ මොකක්ද වෙලා

තියෙන්නේ? මේකේ දේශපාලන හරය තේරුම් ගන්න ඕනෑ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. එකක් තමයි දැන් මේ - අපි කියන්නේ ඡන්දය තියන්න. ඉතාහොඳයි. හැබැයි මේක තවදුරටත් තියා ගත්තොත් තමයි, මේකේ බලය රැක ගත්තොත් තමයි ගම් මට්ටම බිම් මට්ටම රැක ගන්න පුළුවන් වෙන්නේ. ගම් මට්ටමේ, බිම් මට්ටමේ බලය අහිමි වෙයි කියන භය තමුන්නාන්සේලාට තියෙන්නේ. ඇයි මේ අහිමි වෙයි කියලා බය වෙන්නේ. ඇයි එහෙම වෙන්නේ? මේ පළාත් පාලන ආයතන තිබුණොත් තමයි මහින්ද රාජපක්ෂ මහත්මයා ඇතුළු ඒ පිරිසට අර කුරුණෑගල ගියා වාගේ ගමෙන් ගමට ගිහිල්ලා, ඩබල් කැබ් දාලා ඒ ඉන්න පළාත් පාලන ආයතනවල සභාපතිවරු නියෝජිතයෝ පාවිච්චි කරලා -

[සභාවේ ඝෝෂා]

දැන් බය වෙලා ඉන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඊළඟ ඉල්ලීම තමයි පළාත් පාලන ආයතනවල හොරකම් කරපු හොරු ටික අද නිලධාරීන්ට භාර දුන්නොත් පළාත් පාලන ආයතනවල හොරකම් කරපු හොරු ටික ඔක්කෝම එළියට එනවා. මෙතුමා කිව්වා එදා කොළඹ නගර සභාවේ එහෙම කළේ හොරු ටික එළියට ගන්න කියලා. හොරු ටික එළියට ගන්න නොවෙයි. කොළඹ නගර සභාව -

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

තමුන්නාන්සේලාට පළාත් පාලන ආයතනවල එක මන්ත්‍රීවරයෙක්වත් නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒකයි මේක තියාගත්තේ. හොරු ඇල්លුවාද? නමුත් අද ඒක නොවෙයි වෙලා තියෙන්නේ. අද භයයි හොරු ටික එළියට (බාධා කිරීම්) ඒ නිසා මෙන්න මේක හරහා තමයි රාජපක්ෂලාගේ දේශපාලන අනාගතය තීරණය වෙන්නේ. ඒ නිසා තමයි පළාත් පාලන ආයතනවල ඡන්දය තියනවාට භය.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

භය නැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අපි භය නැහැ පළාත් පාලන ආයතන ඡන්දය තියන්න.

[සභාවේ ඝෝෂා]

යෝජනාව හරියට කියවන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔයගොල්ලෝ නොකියපු දේ මම කියන්නේ. ඕක ඇතුළේ -

[සභාවේ ඝෝෂා]

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ ඡන්දය තියන්න. දැනටමත් කල් පහු වෙලා තියෙන්නේ. ගියසැරේ අපට ඡන්දය දුන්නා නම් මේ සැරේත් මේ ඡන්දය තියන්න. අපි කවුරුත් කියලා නැහැ නිලධාරීන්ට යටත් වෙන්න. හැබැයි නිලධාරීන් ගැන කථා කරන්නේ බයට. ඒ නිසා මේ රාජපක්ෂලාගේ දේශපාලන සිතියම අලුතෙන් අඳිනවා. අලුතෙන් අඳින්න දරන උත්සාහයේ පියවරක් තමයි කියලා මේ සභාවේදී අවධානය යොමු කරන්න කැමැතියි.

[අ.භා. 12.20]

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව පිළිබඳව කථා කරන කොට ප්‍රතිපක්ෂයේ මන්ත්‍රීවරු අදහස් කරනවා, අපේ මේ යෝජනාව හරහා පළාත් පාලන මැතිවරණය කල් දාන්න හදනවා කියලා මතයක් ගේන්න හදනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතිහාසයේ රාජ්‍ය නායකයින්ගෙන් පසුගිය කාලයේ -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ජනාධිපතිතුමා හම්බ වුණු වෙලාවේ එහෙම නම් ඉල්ලුවේ ඇයි කල් දාන්න කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

පොඩ්ඩක් ඉන්න කෝ ඔබතුමා. මම ඔබතුමන්ලාට බාධා කළේ නැහැ නේ? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතිහාසයේ මැතිවරණ කලින් තියපු එකම රාජ්‍ය නායකයා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විතරයි. කිසිම නායකයෙක් ඉතිහාසයේ, සිරිමාවෝ මැතිනියගේ ඉඳලා, ජේ.ආර්. ජයවර්ධනගේ ඉඳලා, රනිල් වික්‍රමසිංහගේ ඉඳලා කිසිම නායකයෙක් මේ දේ කරලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද විරුද්ධ පක්ෂය කථා කරන්නේ හරියට මැතිවරණයක් තියලා අගමැතිවරයෙක් පත් වුණා වාගේ. මේ සුළුතරයකින් අගමැතිවරයෙක් පත් කරගෙන රනිල් වික්‍රමසිංහ මහත්මයා -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

29 පාරක් පැරදිලා. ලැජ්ජ නැද්ද?

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 28 ක් පාරක් පරාදයි. පොඩ්ඩක් ඉන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මැතිවරණ ක්‍රමය කොට්ඨාශ ක්‍රමයට ගෙන එන්න පසුගිය කාලයේ කටයුතු කළා. මේ වනකොට ඒ කොට්ඨාශ ක්‍රමය ක්‍රමවත් නැහැයි කියලා වර්තමාන රජය අලුතෙන් මේ කොට්ඨාශ ක්‍රමය වෙනස් විධියට ක්‍රියාත්මක කරන්න හදනවා. හැබැයි, මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙලා එනකොට තව මාස හය හතක් අනිවාර්යෙන්ම ගත වෙනවා. ඒ වනකොට පාර්ලිමේන්තු මැතිවරණයක් යනවා නම්, ඔබතුමන්ලා පාර්ලිමේන්තු මැතිවරණයක් ඉල්ලනවා. මේ වනකොට මැතිවරණ දෙකක් එකට තියන්න බැහැයි කියලා මේකට තව කාලය ගත වෙනවා. එතකොට පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ගෙන් ක්‍රියාත්මක විය යුතු කාර්ය භාරය ජනතා පරමාධිපත්‍ය නැති වෙලා නිලධාරීවාදයට මේක යට වෙනවා. ඒ නිසා තමයි අපි කියන්නේ විසුරුවා හරින්න. අපි එකඟයි. මොකද, විසුරුවා හැරලා මැතිවරණයකට ගියොත් අපේ මේ පළාත් පාලන ආයතන සියල්ලක්ම නැවත ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබෙනවා. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

අද මහින්ද රාජපක්ෂ, මෛත්‍රීපාල සාකච්ඡාවට මේ අය භය වෙලා ඉන්නවා. ඒක තමයි මේ කෑගහන්නේ? ඊළඟ මැතිවරණය පරාජය කරනවා කිව්වේ, ඒ දෙන්නා එකතු වෙලා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒක වෙනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමැතිකම් බේරා ගන්න නොවෙයි. අද මේ මැතිවරණ ක්‍රමයත් එක්ක අපට යන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා නම්, කාලයක් ගත වන නිසා තමයි අපි කියන්නේ. එහෙම නම් මේක නීත්‍යානුකූලව කල් දැමීමේ හැකියාව තිබෙනවා. මේක නීත්‍යානුකූලව කල් දාලා මැතිවරණයකට සූදානම් වනකොට ඒක ප්‍රකාශ කරලා මැතිවරණයකට යන්න කියන එක තමයි කියන්නේ. එහෙම නැත්නම් ජනතාව බලාපොරොත්තු වන දේ, මේ වනකොට පාර්ලිමේන්තු ප්‍රතිපාදන, පළාත් සභා ප්‍රතිපාදන, පළාත් පාලන ආයතන ප්‍රතිපාදන ක්‍රියාත්මක වන අවස්ථාවක්. ඒකේ නිසි ප්‍රයෝජන මහජනතාවට යන්න නම් මේක විය යුතුයි කියන කාරණාවයි අපි කියන්නේ. ඒ නිසා මේක දීර්ඝ කිරීම නොකර එදා මැතිවරණය නිවේදනය කරලා විසුරුවා හැරලා මැතිවරණයක් තිබ්බා නම්, මේ වනකොට අපේ වැඩ කටයුතු අවසන් වෙනවා. යම් හෙයකින් කොට්ඨාශ ක්‍රමයට ඇවිල්ලා මේක කරන්න බැරි නම් පැරණි ක්‍රමයට හරි මේ මැතිවරණය කඩිනමින් තියන්න කටයුතු කරන්න කියන ඉල්ලීම තමයි අපි යෝජනා කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද කථා කරනවා පළාත් පාලන ආයතනවල හොරකම් ගැන. මේ වනකොට සන්ධානයේ පළාත් පාලන ආයතන 07 ක සභාපතිවරු සම්බන්ධව අපි කටයුතු කරගෙන යනවා. අපට මේ වර්තමාන රජය පළි ගන්නවා වාගේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා යටතේ අනු කමිටුවක් දාලා පුද්ගලයෝ බද්ද කරගෙන හොරා කියලා අල්ලලා උසාවි දාලා බන්ධනාගාරගත කරන ක්‍රමයක් මේ පළාත් පාලන ආයතනවල කරන්න බැහැ. ඒක කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ ක්‍රමවේදය මූලික පරීක්ෂණ කරලා නිලධාරීන් හරහා ඒකට ඒත්තු ගැන්නුවාට පස්සේ ඒ අයට විරුද්ධව

කටයුතු කරන්න අපි මේ වනකොට තීන්දු කරලා, පළාත් පාලන ආයතන -

**ගරු ඉෆ්තිකාර් ජෙමිල් මරික්කාර්**
Hon. Ifthikar Jemil Marikkar

පානදුර නගර සභාව ගැන හිටපු මහ ඇමැතිතුමා කිව්වා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඉන්න, ඉන්න. මම තව කාරණාවක් කියන්නම්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මමයි කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමයි ඊයේ ගියා ආණ්ඩුකාරතුමාත් එක්ක සාකච්ඡා කරන්න. කලබල වෙන්න එපා. කියන දේ අහගෙන ඉන්න කෝ? මට ඕනෑ කෙනෙක් එක්ක යන්න පුළුවන් නේ? රාජකාරී මට්ටමින් නොවෙයි. අපි සාක්ච්ඡාවකට ගියා. මම කාත් එක්ක හරි එළියට යනකොට මේ මංජු ඇතාගෙන් අහලා යන්න ඕනෑද? මාර වැඩක් නේ ඒක. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුකාරතුමා කියපු ප්‍රකාශයක් මේ කියන්නේ. එතුමා සාක්ෂි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊයේ ආණ්ඩුකාරතුමා කිව්වා කොළඹ මහ නගර සභාවේ සේවකයෝ බඳවා ගැනීම් කිරීමේදී වැරදි විධියට බඳවාගෙන තිබෙනවා කියලා. JSS එක ඇවිල්ලා ජනාධිපතිතුමාටත්, ආණ්ඩුකාරතුමාටත් Complain කරලා ඒ බඳවා ගැනීම් නවත්වන්න කියලා නියෝගයක් නිකුත් කළා කියලා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ හොරකම් පිළිබඳව කටයුතු කරනවා නම් අපි කියන්නේ, මහ බැංකුවේ අධිපතිතුමා කරපු හොරකම ඉස්සෙල්ලාම හොයන්න ඕනෑ. ඔහුව ආරක්ෂා කරන්න වර්තමාන අගමැතිතුමා කරන කාර්ය භාරය අපි දකිනවා. එහෙම නම් ඒවා ගැන කථා කරන්න ඕනෑ. මම දැක්කා සරත් ෆොන්සේකා මහත්මයා, ෆීල්ඩ් මාෂල්කම ලැබෙන්න ඉස්සෙල්ලා එතුමාගේ කථාවේදී කිව්වා, මම හිතාගෙන හිටියා අගමැතිතුමා කියන්නේ ආර්ථික ඔස්තාර් කෙනෙක් කියලා. බලපුවාම එහෙන් අරන් මෙහෙට දෙනවා මීසක් වෙන දෙයක් කර ගන්න බැහැයි කියලා එතුමා කිව්වා. හැබැයි, ඒ කියලා දවස් දෙකක් යනකොට ෆීල්ඩ් මාෂල්කම දුන්නා. අද සරත් ෆොන්සේකා මහත්මයාත් කට වහගෙන. ඒවා තමයි අල්ලස් එකට යන්න ඕනෑ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ෆීල්ඩ් මාෂල්කම දෙන්නේ අගමැති නොවෙයි. ජනාධිපති. බොරු කියන්න එපා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

හරි, හරි. ඒවා වුණේ කොහොමද කියලා අපි දන්නවා. පිළිගන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හැබැයි කාරණාව කියන්නේ සරත් ෆොන්සේකා මහත්තයාම කියනවා අද යහපාලනයේ ඉන්නෙත් හොරු කියලා. අපි කියනවා නොවෙයි. ඒ නිසා -

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අයියා ඉන්නවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අයියා ඉන්නවා නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යහපාලනයේ හොරු කියලා යහපාලනය ගෙනාපු නායකයෝම කියනවා නම්, මේ මාස තුනට මෙහෙම නම් අවුරුදු 05 යද්දී කොහොම හොරකම් කරයිද? ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා ගැන කල්පනා කරලා මේ වර්තමාන රජය කටයුතු කරන්න ඕනෑ කියලා මම ඉල්ලීමක් කරනවා.

[අ.භා. 12.29]

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ යෝජනාවේ 'ඇ' කොටසට මම නැවතත් අවධානය යොමු කරනවා. මොකද, මේ අය කරපු සමහර කථා එක්ක බලනකොට මම හිතන්නේ විපක්ෂයේ මන්ත්‍රීවරු මේ යෝජනාවවත් හරියට කියවලා නොවෙයි මේ විවාදයට සම්බන්ධ වුණේ. යෝජනාවේ 'ඇ' කොටසේ තිබෙනවා,

*(ඇ) යම් ලෙසකින් පළාත් පාලන ආයතන විසුරුවා හැරීමක් සිදු කරනු ලබන්නේ නම්, එසේ විසුරුවා හැරීමෙන් පසුව මාස 02 ක් ඇතුළත මැතිවරණයක් පවත්වන මෙන්ද ඉල්ලා සිටිමි* කියලා මම මේ යෝජනාවෙන් කියනවා.

ඒ නිසා අනේ දෙවියනේ විපක්ෂයේ මන්ද බුද්ධික සමහර උදවියට ඥානය පහළ වේවා කියලා මම මුලින්ම ප්‍රාර්ථනා කරනවා. ඒවාගේම තමයි විශේෂයෙන්ම මේ යෝජනාවේදී මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා යෝජනාව

[ගරු පියල් නිශාන්ත]

අවබෝධ කරගෙන නොවෙයි කථා කළේ. ඒක නිසා අපි විශේෂයෙන්ම කනගාටු වෙනවා. අපි හැමදාම දන්නවා මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා මේ සභාවේ මාධ්‍යයට කථා කරන්නේ කියලා. එතුමා ගෝඨාභය රාජපක්ෂ අපේ හිටපු ආරක්ෂක ලේකම්තුමා ගැන කථා කළා. කොළඹ ගැන කථා කළා. මට කියන්න තිබෙන්නේ මෙතුමන්ලාට කොළඹ නොවෙයි ඒ අවට කොහේවත් ඉන්න හම්බ වෙන්නේ නැහැ. අද වනකොට කොළඹ අසූචි වළක් වෙලා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා හිටයේ නැත්නම් දුඟද හමන කොළඹක් බවට පත් වෙනවා. ඉතින් ඒ නිසා හෘදය සාක්ෂියට පිටින් තමයි මේ මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමන්ලා කථා කරන්නේ. මම හිතන්නේ ඉන්නේ මුජිබුර් රහුමාන්ලා තවමත් ඉන්නේ අසූචි වළේ. ඒක නිසා ඉතාම කනගාටුයි. ඊළඟට අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට මට දෙන්න තිබෙන උත්තරය තමයි වඳ ස්ත්‍රියකට දරුවෙක් ඉන්න අම්මාගේ මව් ගුණ පිළිබඳව, අම්මා පිළිබඳව වැටහීමක් නැහැ. ඒ නිසා පළාත් පාලන ආයතනවල එක මන්ත්‍රීවරයෙක්වත් ෆොන්සේකා මහත්මයාට නැහැ. ඉතින් ඒ නිසා ඒ අයට හැඟීමක් නැත.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි ඊළඟට එනවා. ඒකයි ඔය බය.

**ගරු පියල් නිශාන්ත**
Hon. Piyal Nishantha

ඒ නිසා අපි ගොඩක් කනගාටු වෙනවා. මේ මන්ත්‍රීතුමන්ලා කථා කිරීම ගැන. මේ පිළිබඳ අවබෝධ කරගෙන මන්ත්‍රීවරු පක්ෂ විපක්ෂ සියලු දෙනාම දුන් සහයෝගයට අපේ ස්තූතිය පුද කරමින් -

[සභාවේ සෝෂා]

පළාත් පාලන ආයතන නියෝජනය කරන සමස්ත ලංකාවේම සියලුම දෙනාගේම ප්‍රණාමය මේ අවස්ථාවේදී මෙය සුභවාදීව දැක්ක සියලු දෙනාට පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවේ විවාදය මේ අවස්ථාවේදී අවසන් වෙනවා. එම යෝජනාව සම්බන්ධව සභාවේ බෙදීමක් තිබෙනවාද?

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 32 යි, විරුද්ධව 17 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***

*Question put and the Council divided as per Rule No 61 (3), 32 for, 17 against and 00 decliners.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II
PRIVATE MEMBERS MOTION: II

# පාර්ලිමේන්තු මැතිවරණය සහ පළාත් පාලන මැතිවරණය
PARLIAMENT ELECTION & LOCAL GOVERNMENT ELECTION

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"පසුගිය ජනාධිපතිවරණ මැතිවරණයේදී දින 100 වැඩ සටහන අවසානයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා එකඟ වූ පරිදි වත්මන් පාර්ලිමේන්තුව විසුරුවා හැර මහ මැතිවරණයක් පවත්වන ලෙසත්,*

*දැනට කල් ඉකුත් වී ඇති පළාත් පාලන ආයතනත විසුරුවා හැර පළාත් පාලන මැතිවරණයකට යා යුතු බවත් මෙම ගරු සභාව අතිගරු ජනාධිපතිතුමාටත්, රජයටත් යෝජනා කර සිටී."*

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[අ.භා. 12.39]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය ජනාධිපතිවරණය පුරාම ජනතාව ඉදිරියට ගිහිල්ලා දුන් පොරොන්දු කිහිපයක් තිබෙනවා. ප්‍රථමයෙන්ම පවතින ක්‍රමය අහෝසි කරලා අලුත් මැතිවරණ ක්‍රමයක් මේ රටේ ස්ථාපිත කරනවා කියන පොරොන්දුව දුන්නා. ඒත් එක්කම ජනාධිපති ක්‍රමය අහෝසි කරලා පාර්ලිමේන්තුවට වග කියන අගමැතිතුමාට බලය ඇති පාර්ලිමේන්තු ක්‍රමයක් යෝජනා කරනවා කියලා මේ ජනාධිපති ඡන්දය පුරාම පක්ෂ විපක්ෂ සියලු දෙනාම කිව්වේ ඒකයි. පාර්ලිමේන්තුවට වග කියන, අගමැතිතුමාට බලය ඇති පාර්ලිමේන්තු ක්‍රමයක් යෝජනා කරනවාය කියලා මේ ජනාධිපතිවරණ ඡන්දය පුරාම පක්ෂ විපක්ෂ සියලු දෙනාම කිව්වේ ඒකයි. ඒකට තමයි මේ රටේ ජනතාව ජන වරමක් දුන්නේ. ඒ නිසා තමයි අපි කියන්නේ, මේ පාර්ලිමේන්තුව අද මේ ජන වරමට පටහැනිව තිබෙන පාර්ලිමේන්තුවක් කියලා. ජනතාවට දුන්න පොරොන්දුවලට පටහැනිව තිබෙන පාර්ලිමේන්තුවක් තමයි අද පවතින්නේ. යහපාලන ආණ්ඩුව කියලා කිව්වාට, අද යහපාලන ආණ්ඩුවක් නැහැ. පසුගිය ජනාධිපතිවරණයේදී ජනතාව අපේක්ෂා කළේ හිටපු රජයත්, ඒ වාගේම ජනාධිපතිතුමාත් දෙන්නාම ඉවත් කරලා අලුත් රජයකුත්, අලුත් ජනාධිපතිවරයෙකුත් පත් කර ගන්නවාය කියන පොරොන්දුව තමයි අපි දුන්නේ. ඒ නිසා අද පසුගිය රජයේ හිටපු සමහර හොරු, සමහර දූෂිතයෝ, ජනතා මුදල් මංකොල්ල කාපු අය අද යහපාලන ආණ්ඩුවටත් ඇවිල්ලා ඒකෙත් ඉන්නවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපිත් කැමැතියි විසුරුවනවාට.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ නිසා තමයි අපි කියන්නේ. අද පවතින යහපාලන ආණ්ඩුවත් ජනතාව ප්‍රතික්ෂේප කරපු අය ඉන්න ආණ්ඩුවක්. ඒ නිසා තමයි අපි ඉල්ලා සිටින්නේ, මේ ආණ්ඩුව විසුරවලා වහාම -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමාගේ පියා කැබිනට් එක නියෝජනය කරනවා. එතුමාට කැබිනට් එකේ යෝජනා කරලා මේක විසුරුවන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකරලා බාධා කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කරුණාකරලා අහගෙන ඉන්න පොඩ්ඩක්. ඔබතුමා කථා කරද්දී මම කෑ ගැහුවේ නැහැ නේ? ඒ නිසා තමයි අපි කියන්නේ මේ රජය විසුරවලා මේ ආණ්ඩුව -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ අගමැතිතුමා ඉල්ලා අස් වුණා නම් හරි. අගමැතිතුමාට ඉල්ලා අස් වෙන්න කියන්න. එතකොට ප්‍රශ්නය විසඳෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනතාවගෙන් අලුත් වරමක් ලබා ගෙන, හොරු දූෂිතයෝ නැති රජයක්, ආණ්ඩුවක් පිහිටුවන්න අපට අවස්ථාව ලබා දෙන්නය කියලා ඉල්ලනවා. ඒත් එක්කම පසුගිය කාල වකවානුව තුළ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ඔය පුටුවෙන් දොට්ට දාන්න ප්‍රධානතම හේතුව වුණේ, මේ පළාත් පාලන ආයතනවල ඉන්න ප්‍රධානියෝ ටික. අපි දැක්කා, විදේශ කාන්තාවන් දූෂණය කරපු හැටි. හොරකම් කරපු හැටි. පිස්තෝල අරන් ගිය හැටි බලන්න. මේ නිසා තමයි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට ගෙදර යන්න

[ ගරු ශ්‍රීනාත් පෙරේරා]

වුණේ. මේ හොරකම්, වංචා, දූෂණ නිසා තමයි එතුමාට ගෙදර යන්න වුණේ. අන්න ඒ නිසා තමයි අපි කියන්නේ. මේ ලංකාවේ ජනවරමට පටහැනිව තමයි අද මේගොල්ලෝත් ඉන්නේ. ඒ නිසා අපි කියන්නේ, ප්‍රාදේශීය සභාත්, නගර සභාත් විසුරුවලා අලුත් ජනවරමකට යන්න ඕනෑ කියලා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ආණ්ඩුව විසුරුවලා ඉවර වෙලා ඊළඟට ප්‍රාදේශීය සභා ඡන්දයට එන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔය ඔක්කොම විසුරුවන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමන්ලාගේ යෝජනාවේ (ඈ) ට මම එකඟයි. විසුරුවනවා නම් ජනවරමකට යන්න ඕනෑය කියන, ඒකට මම එකඟයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු දේ අද ජනතාවට ලැබිලා නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඒක තමයි අපිත් කියන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අද ජනතාව බලාපොරොත්තු වුණේ, පරිප්පු ටික අඩු කර ගන්නවත්, එහෙම නැත්නම් තමන්ගේ බඩට සහනවලට වැඩිය බලාපොරොත්තු වුණේ, මේ රටේ තිබුණු දූෂණය, වංචාව, හොරකම මේක නැති කරන අලුත් ජනාධිපතිවරයෙක් බිහි කරන එක තමයි ජනතාව බලාපොරොත්තු වුණේ. අන්න ඒක අපි ජනතාවට ලබා දෙන්න ඕනෑය කියන එක මම ගරු ඔබතුමා මාර්ගයෙන් මේ සභාවට මතක් කරලා දෙන්න කැමැතියි. ඒ නිසා මේ අයට අද පවතින ආණ්ඩුව, ජනතා වරමක් නැති ආණ්ඩුවක් හැටියට තමයි මම දකින්නේ. අද පවතින ආණ්ඩුව එදා හිටපු දූෂිත, මේ දින 100 ට ජනතාව ලබා දුන්න වරමත් ඉක්මවා ගිහිල්ලා තිබෙන ආණ්ඩුවක් හැටියට තමයි අද දකින්නේ. ඒ නිසා මම යෝජනා කර සිටිනවා. මේ ආණ්ඩුවත්, ඒ වාගේම මේ පළාත් පාලන ආයතන වහාම විසුරුවලා, අලුතෙන් ජන වරමක් අරගෙන, ඒ ජන වරමෙන් ජනතාව කැමැත්ත දෙන රජයකුත්, පළාත් පාලන ආයතන ටිකකුත් පත් කර ගෙන මේ ජනතාව බලාපොරොත්තු වුණු ඉල්ලීම ඉෂ්ට කරලා දෙන්නය කියලා අතිගරු ජනාධිපතිතුමාගෙනුත්, ඒ වාගේම රජයෙනුත් මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.45]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ සහෝදර ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව කාලෝචිත යෝජනාවක් හැටියට මම දකිනවා. මොකද, අද දින 100 වැඩ පිළිවෙළට මේ රටේ වෙනසක් දකින්න, එහෙම නැත්නම් යහපාලනය දකින්න තිබුණු ආණ්ඩුවට වරදක් කළා නම්, ඒ වරදට දඬුවම හැටියට ඒ ආණ්ඩුව පරද්දලා ගෙදර යවලා තිබෙනවා. ඒකට දඬුවමක් ජනතාව දීලා තිබෙනවා. එහෙම නම් ඒ වැරද්දට තව දඬුවම් දීම නොවෙයි. ඒ වරද නිවැරදි කරලා ජනතාවට වඩාත් ප්‍රායෝගික, ජනතාවට වඩාත් සුභදායක වැඩ පිළිවෙළක් ජනතාව බලාපොරොත්තු වෙනවා. අද ඒක සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා තමයි මෙතුමන්ලාට එක්සත් ජාතික පක්ෂයෙන්ම මේ යෝජනාව ගේන්න වෙලා තිබෙන්නේ. අද ඇමතිවරු පත් කරලා තිබෙනවා. ඇමතිවරුන්ට මම හිතන්නේ අමාත්‍යාංශ නැහැ. නම තිබුණාට. අද වන කොට වැඩ භාර නොගත්ත ඇමතිවරු තවම ඉන්නවා. එතකොට විෂයයක් නැහැ. ඒ විෂයයක් නැතිව මහජන පරමාධිපත්‍යයෙන් ජනතාවට සේවය කරන්නේ කොහේ ඉඳන්ද කියන එක ප්‍රශ්නයක් තිබෙනවා. අද ඒ අයටම ගැටළුවක් වෙලා තිබෙනවා. අද මම හිතන්නේ, පාර්ලිමේන්තුවේ ඉන්න එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරයකුගෙන් ඇහුවොත් ඕගොල්ලන්ගේ කණ්ඩායමේ මන්ත්‍රී ආසන කීයද කියලා එක්කෙනෙක් කියනවා, 44 යි කියලා. තව කෙනෙක් කියනවා, 47 යි කියලා. ඒ අය මන්ත්‍රී ආසන ගණනවත් දන්නේ නැහැ. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මොකද, අපි කථා අහලා තිබෙනවා. කථා අහන කොට අපට ඇහිලා තිබෙනවා. සමහරු 44 යි කියනවා. සමහරු 47 යි කියනවා.

ඉතින් ඒ තත්ත්වයට තිබෙනවා. ඉතින් එහෙම නම් මේ ආණ්ඩුව ඇත්තටම විසුරවලා ජනතාවට වැරදුණු යම් තැනක් තිබෙනවා. ඒ වැරදුණු තැන හදා ගන්න ජනතාව බලාගෙන ඉන්නවා. එහෙම නම් කඩිනමින් ඒ කාර්යය විය යුතුයි කියන එක ඇත්තටම අපි විශ්වාස කරනවා. මොකද, ජනතාවට අවුරුදු 20 ක් විතර එක දේශපාලන අධිකාරියක් ඇවිල්ලා, ඒ තුළ කරපු දේවල් අර සාමාන්‍යයෙන් සිංහලයාට කාලයක් යන කොට කොපමණ හොඳ වුණත් සමහර විට කරන රස්සාව වුණත් එපා වෙනවා. එපා වෙලා වෙනත් දෙයකට ගියාම තමයි තේරෙන්නේ, අනේ කරපු රස්සාව කොපමණ හොඳද? කියලා. තිබුණු ආණ්ඩුව කොපමණ හොඳද? කියලා දැන් හොඳට තේරිලා තිබෙන්නේ. අපේ අලුත් නව ඡන්ද තියෙන තරුණ පරපුරේ අයට වෙනසක් දකින්න ආසාව තිබුණාට, ඒ වෙනස කොහොමද කියලා දැකලා තිබෙනවා. එහෙම නම් ඒ අයට නිවැරදි වෙන්න, ඒ අයට ඒ වැරැද්ද හදා ගන්න හොඳ අවස්ථාවක් තමයි මෙතුමා යෝජනා කරන්නේ. මේ පාර්ලිමේන්තුව විසුරවලා, නව මැතිවරණයක් එන කොට ඒ මැතිවරණය තුළින් ඒකට උත්තර දෙන්න ජනතාව බලා ගෙන ඉන්නවා. එදා වෙනසට සහයෝගය දැක්වුවා වාගේම ඒ වෙනස නැවතත් වෙනස් කරන්න ජනතාව බලා ගෙන ඉන්නවා. ඒ නිසා ඒ කාරණාව වෙනුවෙන් අපි එකඟ වෙනවා.

ඒ වාගේම දෙවැනි කාරණාව, මේ පළාත් පාලන මැතිවරණය. ඔබතුමා හරි ඇත්තටම. මැතිවරණය කල් ගිහිල්ලා තිබෙන්නේ. කල් ගිහිල්ලා නම් මැතිවරණය තියන්න ඕනෑය කියන එකයි අපි කියන්නේ. මොකද, විශේෂයෙන් අපි මතක් කරන්න ඕනෑ. මම හිතන්නේ, මේ මැතිවරණය තුන් අවස්ථාවකදී තියලා තිබෙනවා. මම හරියට කාල වකවානුව නොදන්නවා වුණත් සාමාන්‍යයෙන් සැප්තැම්බර්, ඔක්තෝබර් වන කොට මේ ලංකාව තුළ තිබෙන සියලුම පළාත් පාලන ආයතනවල මැතිවරණ කාල සීමාව ඉවර වෙනවා. එහෙම නම් එක්කෝ ඒ ඉවර වන කල් සියලුම පළාත් පාලන ආයතනවල කාලය දික් කරලා, මේ රටේ නාස්තිය නැතිව එක වතාවක මේ සියලු මැතිවරණ තියන වැඩ පිළිවෙළක් ගේන්න ඕනෑ. එහෙම වැඩ පිළිවෙළක් ගේන්න ඕනෑය කියන එකයි මම මතක් කරන්නේ. එහෙම නොගෙන ඉන්නවා නම් අපි කාලය දික් නොකර, අවලංගු වෙන්න හරිනවා නම්. මාස දෙකක් තුළ අවලංගු වෙන පළාත් පාලන ආයතනවලට මැතිවරණයක් ගේන්න. අපි ඇත්තටම මැතිවරණවලට භය නැහැ. ඒක ජනතාව තීන්දු කරයි. විශේෂයෙන්ම මම මොකද එහෙම කියන්නේ. ජනතාවට වඩාත්ම සමීපතම ආයතනය තමයි මේ ප්‍රාදේශීය සභාව. එහෙම නැත්නම් නගර සභාව. මේ ජනතාවගේ උපතේ ඉඳලා මිය යන තෙක්, මිය ගිහිල්ලත් දාන මාන කටයුතුවලටත් උදව් කරන ආයතනය තමයි මේ ප්‍රාදේශීය සභාව. ඒ තුළ ජනතාවත් එක්ක ගොඩක් ගැටෙන්නේ. නොයෙක් අවශ්‍යතාවයන්වල, නොයෙක් උදව් උපකාරවලට ඒ ප්‍රදේශයේ තිබෙන නොයෙකුත් ආයතනත් එක්ක ගැටිලා ජනතාවට සේවය සලසන්නේ. ඒ නිසා ඒ සේවය මහජන පරමාධිපත්‍යය නැතිව නිලධාරී මට්ටමෙන් යනවා නම් ඇත්තටම ඒක ප්‍රායෝගික වෙන්නේ නැහැ. ඒ අපි බලාපොරොත්තු වන සේවය ඉටු වෙන්නේ නැහැයි කියන එක මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම වර්තමාන ආණ්ඩුවේ අද නිලධාරීන්ව කොටු කරන හැටි, දඩයම් කරන හැටි දැක්කාම මොනම විධියකටවත් නිලධාරීන්ගෙන් වැඩක් ගන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරන්නේ නැහැ. මේ ආණ්ඩුව තුළ අද නිලධාරීන් භය වෙලා සිටින්නේ. චක්‍රලේඛවලට, මුදල් රෙගුලාසිවලට වැඩ කරන්නත් පුළුවන්. නොකරන්නත් පුළුවන්. ඔවුන් ඇඟ බේරා ගෙන, පැන්ෂන් එක බේරා ගෙන යන තත්ත්වයකට අද සියලුම නිලධාරීන් පත් වෙලා තිබෙනවා. මේ කරන දඩයම් එක්ක. අද මහාචාර්යවරු, වෛද්‍යවරු මේ රටේ උගත්, බුද්ධිමත්, වෙනත් රටවල්වල සේවය කරලා, ඒ සේවය ලංකාවට ලබා දෙන්න ආපු විශේෂඥයෝ ඒ උපදේශකයෝ අද කූඩු කරලා, කොටු කරන තත්ත්වයට වැටිලා තිබෙනවා. අද ඒ නිසා මම හිතන්නේ නැහැ රාජ්‍ය නිලධාරීන්ගෙන් අපට සේවයක් ලබා ගන්න පුළුවන් වෙයි කියලා. මේ වර්තමානයේ මේ යන වැඩ පිළිවෙළත් එක්ක. ඒ නිසා මේ යෝජනා දෙකටම පෞද්ගලිකව මම මෙතුමාට එකඟයි. ආණ්ඩුව විසුරවන්න ඕනෑ. මැතිවරණයක් තියන්න ඕනෑ. හැබැයි, මැතිවරණයක් තියන කොට මම හිතන්නේ නැහැ පාර්ලිමේන්තුව තුළ මොන ආකාරය තියන්න පුළුවන් වෙයිද කියලා. ඒ දින 100 තුළ පොරොන්දු වුණේ ආසන ක්‍රමයට

[ ගරු ලලිත් වර්ණකුමාර]

තියන්න, මේ තිබෙන මැතිවරණ ක්‍රමය වෙනස් කරලා කරනවාය කියලා. නමුත් මම හිතන්නේ නැහැ, ඒ තැනට යන්න පුළුවන් වෙයිද කියලා. එහෙම තිබෙනවා නම් වඩාත් හොඳයි. මේ තිබෙන අමනාපකම්, මේ තිබෙන වෛරය, ක්‍රෝධය නැතිව ඒ තමන්ට ගැලපෙන මේ සුළු ප්‍රමාණයක් තුළ දුවලා ඒ ජනතාවට සේවය කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් තමයි තිබෙන්නේ. මම හිතන්නේ නැහැ පාර්ලිමේන්තුව තියා පළාත් පාලන මැතිවරණයක් මාස දෙකකින් මේ කොට්ඨාශ ක්‍රමයට තියන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවාද කියලා. අපි මේවා ඔක්කොම කරලා, කථා කරලා ආපහු ගේන කොට මැතිවරණ කොමසාරිස්තුමා කියයි මට කාලය මදී. මට බැහැ මෙහෙමයි කියලා. ඒ නිසා වඩාත්ම උචිත විධියට මේ වැඩ පිළිවෙළ තුළ ක්‍රියාත්මක කරනවා නම් අපි ඒවාට එකඟයි. දැන් මැතිවරණ එන්න එන්න අපි කැමැතියි. ඉක්මණට මැතිවරණ එනවා නම් අපි කැමැතියි. ජනතාව අද සැදී පැහැදී ඉන්නේ. අපට අද සංවිධානය කරන්න දෙයක් නැහැ. අප නියෝජනය කරන පක්ෂයත් එක්ක, අපි නියෝජනය කරන වැඩ පිළිවෙළත් එක්ක ජනතාව සැදී පැහැදී ඉන්නවා. ඒ අයට ඕනෑ ඡන්දය විතරයි. ඒ නිසා ඒ ඡන්දය එන වැඩ පිළිවෙළ පිළිබඳව ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට ස්තුතිවන්ත වෙමින් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වැරදි නිවැරදි කරන්න ලැහැස්ති වෙන්නේ.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

සිදු වුණු වැරදි නිවැරදි කර ගන්න ඒ අය ලැහැස්ති වෙලා ඉන්නවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව - විශේෂයෙන්ම ජනවාරි 08 වැනිදා මේ රටේ ජනතාව ඓතිහාසික තීන්දුවක් ලබා දුන්නා. ඒකට ප්‍රධාන වශයෙන් මේ දින 100 වැඩ පිළිවෙළ සඳහා විශ්වාසය තබලා මේ ජනතාව ලබා දුන්න තීන්දුවේ ප්‍රධාන අංගයක් හැටියට තමයි මේ පාර්ලිමේන්තු මැතිවරණය දින 100 ක් අවසන් වුණාට පස්සේ විසුරවනවා කියන පොරොන්දුව විශේෂ කාර්යයක් හැටියට අපි දකින්නේ. ඒ වාගේම පසුගිය කාල සීමාවේදී අපි දැක්කා, මේ දින 100 තුළ මේ රටේ ඉතිහාසයේ ආණ්ඩුවක් දින 100 කින් කරලා තිබෙන වැඩ දිහා බලන කොට සංසන්දනය කරලා බලන කොට මේ දින 100 තුළදී විශාල ප්‍රමාණයක් සිදු කරලා තියෙනවා. එක පැත්තකින් ජනතාවට සහනය ලබා දෙමින්, අනෙක් පැත්තෙන් මේ රටේ නීතිය නැවතත් ක්‍රියාත්මක කරන එක, මේ ස්වාධීන කොමිෂන් සභා හදපු එක,

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ගරු සංවිධායකතුමා, තවම සමෘද්ධිය 200% ක් වැඩි කරලා නැහැ.

[අ.භා. 12.51]

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මේ දින 100 කින් මම හිතන්නේ නැහැ කිසිම ආණ්ඩුවක් මේ රටේ ඉතිහාසයේ මේ ආකාරයට වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළා කියන එක. මේ රටේ ජනතාව ඡන්ද ලක්ෂ 62 ක් ලබා දුන්නා, මේ දින 100 ට පස්සේ මේ පාර්ලිමේන්තුවත් අලුත් කරන්න ඕනෑය කියන එකට. මොකද, පසුගිය කාල සීමාවේදී ජනතාව මේ ආණ්ඩුවට විරුද්ධව, මහින්ද රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව ඡන්දය දෙනවාත් එක්කම විශාලම කලකිරීමක් වුණා, එතුමා පත් කරපු ඇමති මණ්ඩලයටත්, ඒ පාර්ලිමේන්තුවේ නියෝජනයටත්. ඒ ආණ්ඩුවටත් විරුද්ධව තමයි ජනතාව ඡන්දය දුන්නේ. එහෙම නම් ඒ අවස්ථාවේදී ජනතාවගේ බලාපොරොත්තුව වුණා, ජනාධිපති කියන පුද්ගලයාගේ වෙනසත් එක්කම ආණ්ඩුව, පාර්ලිමේන්තුව නියෝජනය කරන ඒ පුද්ගලයනුත් වෙනස් විය යුතුයි කියන එක. අන්න ඒකට අවස්ථාවක් සලසමින් තමයි අපි ඒ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පොරොන්දු වුණේ දින 100 කට පස්සේ පාර්ලිමේන්තු මැතිවරණයකට යා යුතුයි කියලා. දැන් දින 100 අවසන් වෙලා තිබෙනවා. එහෙම නම් දින 100 අවසන් වුණාට පස්සේ දැන් පවතින රජය ජනතාව පත් කරලා තිබෙන රජයක් නොවෙයි. ජනතාව මේ ආණ්ඩුව පත් කළේ දින 100 කට. එහෙම නම් දින 100 කට පස්සේ දැන් පත් කරලා තිබෙන මේ ආණ්ඩුව ජනතාවගේ සිතුම් පැතුම් දිනා

ගෙන ඇවිත් තිබෙන ආණ්ඩුවක් නොවන නිසා අපි ජනාධිපතිතුමාගෙනුත්, අගමැතිතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා, පුළුවන් තරම් ඉක්මණින් පාර්ලිමේන්තු මැතිවරණයක් පවත්වලා පාර්ලිමේන්තුව අලුත් කරන්න අවශ්‍යයි කියලා. ඒ මොකද, දැන් දන්නවා. අපට හැමදාම දකින්න ලැබෙනවා. හැමදාම අහන්න ලැබෙනවා. අල්ලස් කොමිසමට, එහෙම නැත්නම් කට උත්තරයක් දෙන්න යන කොට යන්නේ මාංචු දා ගෙන වීරයෝ වාගේ. එදා වීරයෝ වාගේ හිටපු අය අද හොරකම් කරලත් වීරයෝ වාගේ මාංචු දා ගෙන යනවා. මේවාට අහු වෙලා තිබෙන්නේ වෙන මොනවත් නිසා නොවෙයි. නෙල්සන් මැන්ඩෙලා හිරේ දැම්මා වාගේ නොවෙයි. නෙල්සන් මැන්ඩෙලා හිරේ දැම්ම කථාවයි, මෙතැන ඉන්න පසුගිය කාලයේ ඇමතිකම් දරලා හොරකම් කරලා මේ හිරේට යන විධියයි ආකාර දෙකක්. නමුත් මේගොල්ලෝ මේ වීරයෝ වාගේ යන්නේ පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය නියෝජනය කරලා, ජනතාව රවට්ටලා පාර්ලිමේන්තුවට ගිය අය. දැන් මේගොල්ලෝ පාර්ලිමේන්තුවේ නොවෙයි. දැන් හිරේ ඉන්න ඕනෑ. ඒ හිරේ ඉන්න හින්දා දැන් අපට අවශ්‍ය වෙලා තිබෙනවා අලුත් පාර්ලිමේන්තු මැතිවරණයක්. මේ රටට, මේ රටේ ඉන්න ජනතාවට වග කියන, මේ රටේ අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති කරන්න ජනතාව තීන්දුවක් අර ගෙන තිබෙනවා. පුළුවන් තරම් ඉක්මණට පාර්ලිමේන්තු මැතිවරණයක් තියන්න අවශ්‍යයි. ඒ නිසා අපි අපේ ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ රටේ ඡන්ද ලක්ෂ 62 ක් අරගෙන මේ රටේ ජනාධිපතිවරයෙක් වුණු එතුමාටත්, මේ නව රජයට අග්‍රාමාත්‍යතුමාටත් මේ සඳහා සාකච්ඡා කරලා - මේක අගමැතිතුමාටවත්, ආණ්ඩුවටවත් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. රටේ ජනාධිපතිතුමාටයි මේ පාර්ලිමේන්තුව විසුරවන්න බලය තිබෙන්නේ. එහෙම නම් පුළුවන් තරම් ඉක්මණට මේ පාර්ලිමේන්තුව විසුරවලා මේ ජනතාව නියෝජනය කරන වැදගත් පාර්ලිමේන්තුවක් පුළුවන් තරම් ඉක්මණින් පවත්වන්නය කියන ඉල්ලීම කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.56]

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු දින 100 වැඩ සටහනේ - අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත්, එක්සත් ජාතික පක්ෂයත් ඇතුළු පක්ෂ 47 ක් ඒකරාශී කරලා ඉදිරිපත් කරපු මැතිවරණ පොරොන්දු අනුව දින 100 ඉක්මවා දැන් මැතිවරණයකට යන්න කියලා යෝජනාවක් අද සභාවට ගෙනාවා. මම කනගාටු වෙනවා. එතුමා පාර්ලිමේන්තුවේ ඉන්නේ. අද කැබිනට් ඇමතිවරයෙක්. එතකොට එතුමාගේ පුතා මේ පළාත් සභාවට කියනවා, දින 100 අවසානයි. පාර්ලිමේන්තුවේ යහපාලනය අවසානයි. දැන් ඒ නිසා පාර්ලිමේන්තුව විසුරවලා මැතිවරණයකට යන්නය කියලා පුතා කියනවා. තාත්තා කැබිනට් එකේ ඉන්නවා. පුදුම ලෝකයක් මේක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මම කියන්න කැමැතියි, එක්සත් ජාතික පක්ෂය ඇතුළු මේ යහ පාලනයට කතිරය ගහන්න උදව් කරපු පක්ෂ 47 ටම අද පාරට බැහැලා, පුළුවන් නම් මේ මැතිවරණය හෙට තියලා පාර්ලිමේන්තුවේ ඊළඟ මැතිවරණය ඡන්දයක් ඉල්ලන්න වේදිකාවට ගිහිල්ලා කියූ පොරොන්දු ගැන ඉෂ්ට කරලා පෙන්වන්න. හාල් සේරුව 110 යි. පරිප්පු 190 යි. අල 120 යි. බොම්බයි ලූණු 110 යි. කොත්තමල්ලි සහන දීලා -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඇයි පෙට්‍රල්, ඩීසල්. ඒවත් කියන්නකෝ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එතකොට මේ පොරොන්දු දීලා, අද රාජ්‍ය සේවයේ පඩිය වැඩි කරලා - මහින්ද රාජපක්ෂ මැතිතුමා ජීවන වියදම් දීමනා වැඩි කරලා, ඒ වාගේම 5000 ක් දීලා 7200 ක් වැඩි කරපු රාජ්‍ය සේවකයාට 5000 දීලා, 3000 දී ගන්න බැරිව අද මේගොල්ලෝ දින 100 වැඩ සටහන ගැන කථා කරනවා.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

බයිසිකල් ගේන්නත් සල්ලි නැහැයිලු.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අද අපි කැමැතියි. අපි කැමැතියි පාර්ලිමේන්තුව විසුරවලා, පාර්ලිමේන්තුවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 44 යි. නියෝජ්‍ය ඇමතිවරු, රාජ්‍ය ඇමතිවරු 44 ම ඉන්නවා. මේක පුදුම ලෝකයක්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඒ බොරු කථාවක්. මන්ත්‍රීවරු ඉන්නවා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අපේ මාධ්‍ය මිතුරෝ මේවා ලියන්න ඕනෑ. (බාධා කිරීම්) මේක විසුරුවලා හැරලා අපි අත් දෙකම උස්සලා සම්පූර්ණයෙන්ම අපේ එකඟතාවය දෙනවා මේක කරන්න කියලා. නමුත් දින 100 වැඩ සටහන යන ගමන් පළාත් පාලන ආයතන ගැනත්, රටේ ජනාධිපති අපේක්ෂකයා හැටියට කටයුතු කරපු විපක්ෂ නායකවෙලා හිටපු රනිල් වික්‍රමසිංහ මහත්මයා දන්නවා. අලුත් පළාත් පාලන ක්‍රමයක් ගෙනැල්ලා ඒක පාර්ලිමේන්තුව අනුමත කරලා, කොට්ඨාශ ක්‍රමයට ගෙනැල්ලා, මේ කොට්ඨාශ මැතිවරණයකට යන්න ඕනෑ කියලා මේ දින 100 තුළ දැන ගෙන හිටියා. නමුත් මැතිවරණ කොමසාරිස්වරයාව ගෙන්වලා, පළාත් පාලන ආයතනවල තිබෙන ඒ මැතිවරණවල කොට්ඨාශ නිර්නය කරලා, ඒවා ගැසට් කරලා, මේ දින 100 තුළ වැඩ කරන්න මේ අයට ශක්තියක් තිබුණේ නැහැ. එතකොට ඒ අනුව පළාත් පාලන ආයතනවල ඡන්දයකට යනවා නම් අපි කියන්නේ, කල් දානවා නම් මැතිවරණය තියන්න. මැතිවරණය තියලා මේකේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එදා එක්සත් ජාතික පක්ෂයේ නායකවරයා හැටියට හිටපු ආර්. ප්‍රේමදාස මැතිතුමා 1991 දී පළාත් පාලන ආයතනවල මැතිවරණය කල් දාලා ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ඡන්දය තියන්නේ නැති කොට, මැතිවරණය තියපු නිසා අපි වාගේ තරුණයන්ට එදා ඉස්සරහාට එන්න ලැබුණා. මේ සභාවේ ඉන්න 50% කට වැඩිය මන්ත්‍රීවරු එදා පළාත් පාලන ආයතනවල පෙනී සිටලා තමයි ආවේ. එතකොට ඒ අනුව අපි කියන්නේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේක තේරුම් අරන් කටයුතු කරලා මේක කල් දානවා. මායිම් ගැසට් කරලා ඒ පළාත් පාලන ආයතනවල මැතිවරණය තියන්න කටයුතු කරන්න කියලා තමයි අපි කියන්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තු මැතිවරණයේ අද මේ සභාවේදී මම අභියෝගයක් කරනවා. ආපහු නැවත මහින්ද රාජපක්ෂගේ කණ්ඩායම දිනලා, රටේ අගමැති වෙන්නේ මහින්ද රාජපක්ෂ කියන එක අපි මේ අවස්ථාවේ කියන්න ඕනෑ. අනිවාර්යයෙන් එය වෙනවා. අද යන යන තැන මහින්ද. ලක්ෂ 62 ක් ඡන්දය දුන්නේ - සිංහල බෞද්ධ ප්‍රදේශවල 68% ක් ඡන්දය දුන්නා මහින්ද රාජපක්ෂට. දෙමළ මුස්ලිම් ප්‍රදේශවල ඡන්ද 74% ක් දුන්නේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. එතකොට මේ දෙක සංසන්දනය කළාම මේ 68 යි 58 යි අතර බැලුවාම එදා උතුරු නැගෙනහිරට ස්වයං පාලනයක් දෙන්න හිටපු ඒ කොටි සංවිධානය, බෙදුම්වාදී සංවිධාන ඒ ත්‍රස්තවාදී සංවිධාන කරපු සටන අද නිකම්ම මේ යහපාලන ආණ්ඩුව යටතේ දෙන නිසා තමයි අද මේගොල්ලන්ට ඡන්දයක් ඇවිල්ලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට රටේ ජනාධිපතිවරයා වෙන්න පුළුවන්කම ලැබුණේ. ඒ නිසා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට දුන්න උපදෙස් අනුව රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට හොඳ දීර්ඝ දැක්මක් තිබෙන කෙනෙක් හැටියට තමයි එදා යහපාලනයට ගිහිල්ලා ඡන්දය ඉල්ලලා, නැවත ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා බවට (බාධා කිරීම්) මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පත් වුණේ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරලා දෙනවා. ඒ ගැන මතක් කරමින්, දින 100 ට විසුරුවා හැරලා පාර්ලිමේන්තු මැතිවරණය තියන්න කටයුතු කරනවාට අපේ සම්පූර්ණ සහය ලබා දෙනවාය කියලා ප්‍රකාශ කරමින්, මගේ කථාව මම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.03]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ කාරණයට අදාළව ජනවාරි මාසේ අටවැනිදා මේ රටේ ජන මතයේ යම් වෙනසක් ඇති වෙලා හිටන් ඒ වෙනස් වුණු ජන මතය මත මේ රටේ ජනාධිපතිවරයාගේ ඉඳලා පාර්ලිමේන්තුවේ ආණ්ඩු බලය දක්වා වෙනස් වීමක් සිද්ධ වුණා. දැන් ජනවාරි 08 වැනිදා ඇති වන වෙනසත් එක්ක 2010 වර්ෂයේ අප්‍රේල් මාසේ 08 වැනිදා පවත්වපු පාර්ලිමේන්තු මැතිවරණයෙන් තේරී පත් වුණු මන්ත්‍රීවරු තමයි මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ. හැබැයි, 2010 අප්‍රේල් මාසේ 08 වැනිදා පවත්වපු මැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ සන්ධානයට මන්ත්‍රී ධූර 144 ක් ලැබෙනවා. එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රී ධූර 60 ක් ලැබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණට මන්ත්‍රීධූර 07 ක් ලැබෙනවා. මේ ආකාරයට පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ආසන 225 ක් තවත් සුළු පක්ෂ සංඛ්‍යාවක් එක්ක එකතු වෙලා ලැබෙනවා. හැබැයි,

2010 ජන මතය නොවෙයි, අද 2015 වන කොට මේ රටේ තිබෙන්නේ කියන කාරණය අපට පැහැදිලි වෙනවා. මේ ජනවාරි 08 වැනිදා තිබුණු මේ රටේ මහා බල පෙරළියත් එක්ක අපට ඒ කාරණය පසක් වෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තුව තුළ ඉන්න සන්ධාන ආණ්ඩුවේ, සන්ධානය තුළ මන්ත්‍රීවරුන්ගේ හැසිරීම දිහා බැලුවාමත් ඒ ජන මතය රටේ ජන මතයේ වෙනස පිළි අරගෙන තිබෙන බව අද අපට හොඳින්ම පැහැදිලි වෙනවා, මේ ආණ්ඩුවට දීලා තිබෙන අවස්ථාව පිළිබඳව සලකලා බලන කොට. ඒ නිසා රටේ ජන මතය වෙනස් වෙලා තිබෙන වෙලාවක මේ වෙලාවේ කළ යුතුව තිබෙන්නේ, ඒ ජන මතයට අනුගත වෙමින් මේ රටේ ජනතාවගේ වර්තමාන ජනමතය උරගා බලන එකට අවස්ථාවක් ලබා දෙන මැතිවරණයකට යන එකයි. ඒ තමයි මේ රටේ මිනිස්සු බලාපොරොත්තු වන දේ. මේ රටේ ජනාධිපතිවරයා විසින් ජනාධිපතිවරණ වේදිකාවේදී මේ රටේ මිනිස්සු ඉස්සරහා ප්‍රතිපත්තියක් හැටියට තැබූ මතයත් ඒක තමයි. ඒ නිසා මේ සියලු කාරණා අරගත්තාම ඉතාමත්ම සුදුසු ක්‍රමවේදය වෙන්නේ කඩිනමින් මැතිවරණයකට යන එක.

අද මේ යෝජනාව මේ ශ්‍රීනාත් මන්ත්‍රීතුමා ගේන කොට ඒ යෝජනාව ස්ථිර කරන්නේ අපේ ප්‍රධාන අමාත්‍යතුමා. ඒ කියන්නේ, ඒ යෝජනාව සහ ස්ථිර කිරීම අතර පෙනෙනවා මේ දෙපාර්ශවයේම එකඟත්වයක් තිබෙනවා. නව මැතිවරණ ක්‍රමයකට යන්නේ නැතිව තිබෙන මැතිවරණ ක්‍රමය තුළ කඩිනමින්ම මේ මැතිවරණය පැවැත්වීම සුදුසුයි කියන කාරණයත් ඒ යෝජනා ස්ථිරත්වය තුළ අපට හොඳින්ම පැහැදිලි වෙනවා. ඒකයි ඒ පැහැදිලි වුණේ. ඒ නිසා පාර්ලිමේන්තුවේ සහ එළියේ ඉඳගෙන මොන කාරණා කිව්වත් මේ යෝජනාව ස්ථිර කළේ මහ ඇමතිතුමා නිසා ඒ කියන්නේ තිබෙන මැතිවරණ ක්‍රමය තුළ මේ ඡන්දයට යන්න කියන ඉඟියයි මහ ඇමතිතුමා ඒ දෙන්නේ. හැබැයි, එක කාරණයක් තිබෙනවා. ඊට කලින් කථා කරපු නිමල් ලාන්සා ඇමතිතුමා කිව්වා, අපි ඉල්ලන්නේ මේ තියන මැතිවරණය, මේ තියන පාර්ලිමේන්තුව ඉදිරි කාලයට යන්න කියලා කිව්වා. මහ ඇමතිතුමා යෝජනාව ස්ථිරව කරනවා. ලාන්සා ඇමතිතුමා කියනවා ඉදිරි කාල සීමාවත් පාර්ලිමේන්තුව යන්න ඕනෑ කියලා. මේ සන්ධානය ඇතුළේ පළාත් සභාවේත් අවම වශයෙන් එකඟත්වයක් නැහැ. මැතිවරණයකට යනවාද නැද්ද කියන කාරණය පිළිබඳව එකඟත්වයක් නැහැ මේ ඇතුළෙත්. ඒ කියන්නේ ඒක ඇතුළේ කල්ලි දෙකක්. එකක් නුගේගොඩ කල්ලිය. අනික මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ සභාපතීත්වයෙන් යුතු කල්ලිය. නුගේගොඩ කල්ලියට තිබෙන ඕනෑකම තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට පිටින් ක්‍රියා කරන හොඳ හෝ නරක දේවල්වලට ඒ පිටින් විරුද්ධව ක්‍රියා කිරීමේ ඕනෑකමයි ඒකෙන් අපට පෙනෙන්නේ. හැබැයි, එක දෙයක් තිබෙනවා. බොහොම පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ දේ. මේ මොන ආකාරයේ ප්‍රතිඵල මත වුණත් හරි මේ රටේ මිනිස්සු යහපත්, පැහැදිලි තීන්දුවක් ජනවාරි 08 වැනිදා ගත්තා. ඒ ගත්තේ පාර්ලිමේන්තුවේ ඉඳලා, රාජ්‍ය තන්ත්‍රයේ ඉඳලා නිලධාරීන් දක්වාම මේ රටේ දූෂණය, වංචාවට මුල් වුණු හොරුන් එළවන්න මිසක් වෙන දෙයකට නොවෙයි කියන එක මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ප්‍රතිඵලය තුළ පැහැදිලි වෙනවා. මහ ඇමතිතුමා කිව්වා, මේකේ ජනාධිපතිතුමා ප්‍රජාතන්ත්‍රවාදී විධියට හිතපු ජනාධිපතිතුමා මැතිවරණ කලින් තිබ්බා කියලා. එතුමා මැතිවරණ කලින් තිබ්බේ නැහැ. සුමනදාස අබේසේකරයි මැතිවරණ කලින් තිබ්බේ. නක්ෂත්‍රකරුවන් විශ්වාස කරලයි මැතිවරණ තිබ්බේ. මහින්ද රාජපක්ෂ මහත්මයා ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කළා නොවෙයි. සුමනදාස අබේසේකර තමයි මැතිවරණ කලින් තියන්න මහින්ද රාජපක්ෂ මහත්මයාට මග පෙන්නුවේ. නැත්නම් ප්‍රජාතන්ත්‍රවාදයක් ඒක ඇතුළේ නැහැ. ඒක ඇතුළේ තිබුණේ නොපෙනෙන ගුප්ත බලවේගවලට රටේ රාජ්‍ය නායකයා ඇහුම්කන් දීම හා ඒවා දැඩි ලෙස විශ්වාස කිරීම නිසා රට අයාලේ යන්න ගත්තා. ඒ අයාලේ යන රටට එහෙම යන්න නොදී මිනිස්සු විසින් ගත්ත තීරණය ජනවාරි 08 වැනිදා ප්‍රදර්ශනය වුණේ.

ඒ වාගේම ඊළඟ මහ ඇමතිතුමා විසින් තව කාරණයක් කිව්වා, සරත් ෆොන්සේකා මැතිතුමා පිළිබඳව. තමුන්නාන්සේලා සන්තෝෂ වෙන්න ඕනෑ, අපේ පක්ෂයේ නායකයා පිළිබඳව. හොරාට හොරාය කියන්න, ඉන්න තැන ඉඳගෙන හරි ප්‍රතිපත්ති මත හැකියාව තිබෙන නායකයෙක් අපිත් එක්ක ඉන්නේ. සරත් ෆොන්සේකා මැතිතුමා යහපාලනය තුළ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා මහින්ද රාජපක්ෂ මහත්මයාව පන්නලා, මේ රටේ හිතන්න නිදහස නැති වෙලාවේ, ජීවිතවලට අරුතක් නැති වෙලාවේ, ජීවිතවලට වටිනාකමක් නැති වෙලාවේ ජීවිත වංචනිකව රවට්ටලා තිබෙන රටේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ගෙනැල්ලා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලනය අවසන් කරන්න තීන්දු ගත්තා වාගේම ඒකෙන් පත් වුණු,

[ ගරු **කේ.ඩී. අරුණ දීපාල්**]

වෙනස් වුණු ආණ්ඩුව තුළ ඉන්න මිනිස්සු පිළිබඳව කෙළින් කථා කරන්න හැකියාවක් තිබෙන නායකයෙක් කියන එකයි අර මහ ඇමතිතුමාගේ කථාව තුළ අපේ නායකයාට දුන්න චරිත සහතිකයක් මිසක් ඒක වෙන එකක් නොවෙයි කියන එකයි හොඳින්ම පැහැදිලි වෙන්නේ. මම අවසාන වශයෙන් කියන්නේ, දැන් මේ පක්ෂ විපක්ෂ දෙපැත්තම. යෝජක සහ යෝජනාවට ප්‍රතිවිරුද්ධ පක්ෂයක් නැති වුණත් යෝජනාව ස්ථිර කළ අයත් කියනවා, පාර්ලිමේන්තුව විසුරවන්නය කියලා. ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළේ ක්‍රම දෙකක් තිබෙනවා පාර්ලිමේන්තුව විසුරුවන්න. ඒ ක්‍රම දෙක තමයි එකක් ජනාධිපතිවරයාට මීට ඉස්සෙල්ලා තිබුණා අවුරුද්දක් ගත වුණාට පස්සේ පාර්ලිමේන්තුව විසුරුවන්න පුළුවන්ය කියලා. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ ඒක සංශෝධනය වෙනවා, වසර 4 ½ කට පස්සේ පාර්ලිමේන්තුව විසුරුවන්න පුළුවන්ය කියලා. දැන් අවුරුදු 4 ½ ගත වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ පාර්ලිමේන්තුව විසුරුවන්න ජනාධිපතිවරයාට බලයක් තිබෙනවා. එහෙම නැත්නම් තව එක ක්‍රමයක් තිබෙනවා. ඒ ක්‍රමයට අපට පුළුවන් මේ ක්‍රමය යන්න. කිසිම අපහසුතාවයක් නැහැ. ජනාධිපතිතුමාගෙන් පිට පාර්ලිමේන්තුව විසුරුවන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන පරිච්ඡේදයේ 70(1)(අ) යටතේ සඳහන් කරනවා, පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රීවරුන්ගේ යෝජනා සම්මතයකින් පාර්ලිමේන්තුව විසුරවීමේ බලය තිබෙනවාය කියලා.

පාර්ලිමේන්තුවේ අපේ ඉන්නවා එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛව ආණ්ඩුව ඇතුළේ ඉන්න මන්ත්‍රීවරු සහ ඇමතිවරුත්, තමුන්නාන්සේලාගේ පැත්තේ මේ යෝජනාව සම්මත කරනවා වාගේම ඒ නුගේගොඩ කල්ලිය හැම තැනම අපි දැක්කා කියනවා, අනික් අය මොනවා කිව්වත් නුගේගොඩ කල්ලියේ උදවිය හැම තැනම කිව්වා මැතිවරණයකට යන්නය කියලා. එහෙම නම් නුගේගොඩ කල්ලියත් එක්ක අවසාන වශයෙන් 08 වැනිදා කුරුණෑගලදී ස්ටේජ් එකට නැග්ග උදවියයි, මේ කට්ටියයි දෙගොල්ලෝ එකතු වුණුම 113 හරි යනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන පරිච්ඡේදයේ 70(1)(අ) අනුව බහුතර මන්ත්‍රී යෝජනාවක් තුළ පාර්ලිමේන්තුව විසුරුවන්න බලය තිබෙනවා. එහෙම කරලා හරි මේ පාර්ලිමේන්තු මැතිවරණය ඉතාමත්ම කඩිනමින් ගෙනැල්ලා 2015 ජන මතයට ගැලපෙන විධියට නව පාලනයක් සහිත පාර්ලිමේන්තුවක් පත් කර ගන්නට හැකියාව ලැබේවායි කියලා ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.10]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනැල්ලා තිබෙන යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක්. අපි ස්තුතිවන්ත වෙනවා. හැබැයි, ඒ ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගේන කොට එතුමාගේ ආදරණීය පියාණන් මේ රටේ පාර්ලිමේන්තුව නියෝජනය කරන කැබිනට් ඇමතිවරයෙක්. තාත්තායි පුතායි ගෙදර කථා කරන්න බැරි ප්‍රශ්න මම හිතන්නේ, අද අගමැතිතුමාටත්, ජනාධිපතිතුමාටත් එකට කථා කරන්න බැරි ප්‍රශ්නයක් වාගේ. මම හිතන්නේ ඒ නිසා තමයි මේක පළාත් සභාවට ගෙනැල්ලා අපට ආලා මේක ස්ථිර කරපු යෝජනාවක් කර ගෙන මම හිතන්නේ මේක ඉක්මණින් තියන්න කියලා තමුන්නාන්සේ මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. බොහොම හොඳයි. අපි අත් දෙකම උස්සලා එකඟ වෙනවා. අපිටත් අවශ්‍ය වෙලා තිබෙන්නේ පාර්ලිමේන්තු මැතිවරණයක්. දින 100 වැඩ සටහන ආරම්භ කරලා මේ වන කොට දින 100 ඉවරයි. හැබැයි, ඊට පහුවෙනිදාට පාර්ලිමේන්තුව විසුරවනවා කිව්වත්, අද වන තුරුත් නැහැ. මොකද හේතුව, තියන්න භයයි. තිබ්බොත් දන්නවා කොයි පැත්තටද යන්නේ කියන එක. ඒ නිසා මම හිතන්නේ, අද දින 100 ට පොරොන්දු වුණු දේවල් ගැන කරපු දේවල් ගැන කියන්න ගියොත් මෙතැන ඉන්න මන්ත්‍රීවරු සියල්ල කථා කළා. ආපහු කථා කරලා වැඩක් නැහැ. අපි අත් දෙක උස්සලා මේකට එකඟ වෙනවා. කරපු දෙයක් නැහැ. අද මේ වන කොට තමුන්නාන්සේලාගේ පැත්තෙන්, තමුන්නාන්සේලා පාර්ලිමේන්තුව විසුරවන්න.

ඊළඟට යෝජනාවේ තිබෙනවා, පළාත් පාලන ආයතන විසුරවලා හැරලා ඉක්මණින් ඡන්දය තියන්න කියලා. අපිත් කියන්නේ ඒක තමයි. අපිටත් අවශ්‍ය කරන්නේ පළාත් පාලන ආයතන කියන්නේ මේ කථා කරන මමත්, පළාත් පාලන ආයතනය තුළ විපක්ෂයේ මන්ත්‍රීවරයා, උප සභාපතිවරයා දෙපාරක් සභාපති වෙලා. අවුරුදු දහයකට දොළහකට ආසන්න කාලයක් ප්‍රාදේශීය සභාව තුළ සභාපතිවරු හිටියා. ඇමතිවරු හිටියා. සංවිධායකවරු

හිටියා. ඒක කරන්න කාටවත් බැරි වුණු දේවල් කරපු සභාපතිවරයෙක් තමයි මේ කථා කරන බේරුවල ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා. එහේ ඉඳලා තමයි අද පළාත් සභාව නියෝජනය කරන්න ශක්තිය, ධෛර්යය ලැබුණේ. අපි දන්නවා. බේරුවල ආසනයේ තිබෙන ප්‍රශ්න ටික විසඳන්න ගියොත් සිංහල, මුස්ලිම්, දෙමළ කියන හැම තුන් වර්ගයක්ම එකට ජීවත් වෙනවා. ආගම්වලින් බැලුවොත් කතෝලික, ඒ වාගේම මුස්ලිම් ආගම අදහන, හින්දු ආගම අදහන, නොයෙකුත් ආකාරයේ ජාතීන් අතර ජීවත් වන ස්ථානයක්. අද අපි කියන්නේ, මේ පළාත් පාලන ආයතන ටික කරන කාර්ය භාරය, වැඩ කොටස ගැන කථා කළොත් මම හිතන්නේ, මෙතැන ඉන්නවා විශාල ප්‍රමාණයක්. අද පුදුමාකාර වැඩ සටහනක් ක්‍රියාත්මක වෙනවා. සමහර මන්ත්‍රීවරු කියනවා, පළාත් පාලන ආයතනවල හොරු ඉන්නවාය කියලා. සමහර ආයතනවල ඉන්නවා. නැතිව නොවෙයි. ඉන්නවා. හැබැයි, ඒකට අවශ්‍ය කරන නීතිය හදා කර ගෙන කටයුතු කරලා තිබෙනවා. ඒවාට නඩු නිමිත්ත තිබෙනවා. නඩු ක්‍රියාත්මක වෙනවා. වැරදිකාරයා වෙන්නේ අද ද හෙටද කියන එක අපි දන්නේ නැහැ. ඒක තීරණය කරන්නේ උසාවිය. ඒ නඩුව අහන කොට. නමුත් කාටවත් හොරා කියලා එක පාරට චෝදනා කරන්න බැහැ.

ඒ නිසා මම හිතන්නේ, උදාහරණයක් හැටියට අද උදේ පාන්දර රූපවාහිනිය බැලුවත්, පත්තරය බැලුවත් අල්ලලා ගිහිල්ලා හැම කෙනාම රිමන් කරන තත්ත්වය පත් කරලා තිබෙනවා. ඒ මොකද හේතුව. මේක තමයි පළිගැනීම. ඒ නිසා තමුන්නාන්සේලාට අපි කියන්නේ, පළාත් පාලන ආයතන පිළිබඳව පමණක් නොවෙයි. අද මේක විසුරුවලා අපි ඕනෑම වෙලාවක ඡන්දයට ලැහැස්තියි. නමුත් මේක විසුරුවලා ඉවර වෙලා කොමසාරිස් පාලනයට හෝ ලේකම්වරයකුගේ පාලනයට දුන්නොත් මේකේ කෙරෙන්නා වූ කටයුත්ත හරියාකාරව කෙරෙන්නේ නැහැයි කියන එකයි අපි කියන්නේ. එහෙම විසුරුවනවා නම් මාස දෙකක් ඇතුළත ඡන්දය තියන්න ඕනෑ. ඒ කාල වකවානුව තුළ රාජ්‍ය නිලධාරියෙක් පත් කරලා ඒ අවශ්‍ය කටයුතු කරන්න ඕනෑ. මොකද හේතුව, කැළි කසල ප්‍රශ්නය. ඒ වාගේම කාණු පද්ධති පිරිසිදු කිරීම. මංමාවත් සෑදීම. ඒ වාගේම නොයෙකුත් ආකාරයේ අනෙකුත් පොදු යටිතල පහසුකම් ක්‍රියාත්මක කරන්න ගියාම මේ ඉන්න නිලධාරීන් දන්නේ නැහැ මෙතැන වෙන දේවල්. ප්‍රාදේශීය සභා සීමාව බැලුවාම හතර කොණ බැලුවාම මහා පුදුමාකාර විශාලත්වයකින් පිහිටලා තිබෙන්නේ. එහෙම නම් එන ලේකම්වරයා නැත්නම් නිලධාරියා දන්නේ නැහැ. අහවල් තැන කියලා කිව්වාට එතුමාට යන්න වෙලාවක් නැහැ. හේතුව, රාජ්‍ය නිලධාරියා කියන්නේ ඒ පුටුවේ ඉඳගෙන ඔහුට කරන්න මහා විශාල ප්‍රමාණයක් තිබෙනවා. මහජන නියෝජිතයා කියන්නේ, එතැන තිබෙන මුළු ඔක්කොම වපසරිය ගැන හඳුනාගෙන තමයි අද ඒ පුටුවේ වාඩි වෙලා සභාපතිවරයා හෝ මන්ත්‍රීවරයා වෙලා ඉඳගෙන කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියනවා අද දවසේත් මේ වන කොට දින 100 වැඩ සටහන ක්‍රියාත්මක කරලා කරපු දෙයක් නැහැ. අද දවසෙත් බේරුවල ආසනයේ මෛත්‍රීපාල සිරිසේන අතිගරු ජනාධිපතිතුමා ගිහිල්ලා විවෘත කරන්නේත් මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමාගේ රජය කාලයේ දීපු ප්‍රතිපාදන තමයි අද දවසෙත් මහා පරිමාණයෙන්, කෝටි ගණන් මුදල් ගෙවලා අද විවෘත කරලා අද ජනතාවට ලබා දෙන්නේ. ඒ නිසා අපි කියනවා, එතුමා ගෙනාපු යෝජනාවට අපි අත්දෙකම උස්සලා කැමැත්ත ප්‍රකාශ කරනවා. පළාත් පාලන විසුරුවනවා නම් මාස දෙකක් ඇතුළත කාලයක ඡන්දය තියන්න. ඊට ඉස්සෙල්ලා අපට අවශ්‍ය වෙන්නේ පාර්ලිමේන්තු මැතිවරණයක්. අපි ඒකට ඉතාම කැමැත්ත සභාවට ඉදිරිපත් කරමින්, තමුන්නාන්සේගේ යෝජනාවට සුභ පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.14]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**

Hon. U. George Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම පාර්ලිමේන්තුව විසුරුවලා කඩිනමින් මහ මැතිවරණයක් තියන්න කියන යෝජනාව තමයි අප විසින් ගෙනාවේ. අපි කවුරුත් දන්නවා, ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ප්‍රතිපත්ති ප්‍රකාශයක් ඉදිරිපත් කළා. එතැනදී ඒ ප්‍රතිපත්ති ප්‍රකාශයේ දින 100 වැඩ පිළිවෙළ තුළ කෙළින්ම කියලා තිබෙනවා, අප්‍රේල් 23 වැනිදා අපි මැතිවරණයකට යනවා කියලා. එහෙම නම් අපි ජනමතය ගත්තේ ඒ වකවානුවට. ඒ නිසා ඇත්තටම අප්‍රේල් මාසේ 23 වැනිදායින් පස්සේ අපට ජනමතයක් නැහැ. හැබැයි, පාර්ලිමේන්තු කාලය තිබෙනවා. ඇත්තටම අපට ජන මතයක් නැහැ. එහෙම නම් අපි අවංකව ඉල්ලීමක් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව තුළ මේ කටයුත්ත කරන්නය කියලා.

[ගරු යූ. ජෝර්ජ් පෙරේරා ]

ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා 19 වැනි සංශෝධනය කිරීම නිසා තමයි මේ කල් දැමීම කෙරුනේ. දැන් 20 වැනි සංශෝධනයත් අවශ්‍යයි කියලා යම් යම් පාර්ශවයන් ගෙනාවත් අපි කඩිනමින් මේ යෝජනාව ඉෂ්ට කරන්නය කියන ඉල්ලීම කරනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ අවස්ථාවේදී පළාත් පාලන ක්ෂේත්‍රය විසුරවන්න එපාය කියන යෝජනාව ගෝලයා ළඟට යන්නේ. දැන් ඉන්න ජනාධිපතිතුමා ගෝලයා. හිටපු ජනාධිපතිතුමාගේ ගෝලයා. ලේකම් ළඟට ගිහිල්ලා ඉල්ලීම කරන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. හැබැයි, කල්පනා කරලා බලන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මමත් පාර්ලිමේන්තු මැතිවරණයක් පරාද වුණු මන්ත්‍රීවරයෙක්. මම දැන් මේ පාර්ලිමේන්තු මැතිවරණයට හෙට අනිද්දා ඉදිරිපත් වෙන්න යන්නේ. මම මොකක්ද කරන්නේ. එදා පාර්ලිමේන්තු මැතිවරණයේදී මට ඡන්ද 6500 ක් අඩු වුණා නම් ඒ 6500 වැඩි කර ගන්න මම උත්සාහ කරනවා. අපි අවුරුදු 20 ක් විපක්ෂයේ හිටියේ. හැබැයි, දැන් අපට ආණ්ඩු බලයක් එන්න යන්නේ. එතැනදී මම ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද? මළ ගෙවල් 10 කට ගියා නම් දැන් දවසකට 12 කට යනවා. මගේ වැඩ පිළිවෙළ විධිමත් කරනවා. හැබැයි, හිටපු ජනාධිපතිතුමා දැන් පැරදුණා. පැරදිලා දැන් මහර ආසනයේ ගිහිල්ලා ගැඩුමාන ප්‍රදේශයේදී කියනවා, මමත් මගේ කණ්ඩායමත් වැරදි කළාය කියලා පිළිගන්නවා. එහෙම තිබෙද්දී එතුමා ගමෙන් ගමට ගිහිල්ලා, අර ප්‍රාදේශීය සභාවල ඩබල් කැබ් 225 අරගෙන ඒ ජනතාව නැත්නම් ඒ සභාපතිවරු අරගෙන මේ ගමනක් යනවා. හැබැයි, මොකක්ද වෙන්න යන්නේ? මමත් මේ පාර්ලිමේන්තුවට යන්න දඟලන්නේ. මේ ජනාධිපතිතුමා මොකක්ද මේ කරන්න යන්නේ. මේ ජනාධිපතිතුමා රෝදයෙන් හරි ටයර් එකෙන් හරි ඉල්ලලා පාර්ලිමේන්තු යන්නයි දඟලන්නේ. එතුමාට විපක්ෂ නායකකම ලැබෙන්නෙත් නැහැ. ඒක මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා දෙන්නේ නැහැ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

හීන. අගමැති වෙන්නේ. විපක්ෂ නායක වෙන්නේ නැහැ. ඕගොල්ලන්ට තමයි විපක්ෂ නායකකම හම්බ වෙන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

එතුමාගේ හොරකම්වලින් බේරෙන්න තමයි - (බාධා කිරීම්)

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඕගොල්ලන්ගේ හොරකම් ටික බලන්න. දින 100 ඇතුළේ කොපමණ හොරකම්ද? දින 100 ට මුළු රටම ඉවරයි. දින 100 ට රට කාලා දැන් ඡන්දයකට යන්න බැහැ නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

මැයි පෙළපාලි ගියා. මේ වාගේ මැයි පෙළපාලියක් මම පොඩි කාලේ ගියේ. 1977 එක්සත් ජාතික පක්ෂයේ නියම මැයි පෙළපාලියක්. රු 9.00 ටත් පෙළපාලිය කැම්බල් පිටියට එනවා. මේකයි යථාර්ථය. මේ තුළ භය වෙලා මේ යන ගමනේදී -

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපි භය නැහැ. ඡන්දය හෙට තියන්න කියන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඉදිරියේදී පාර්ලිමේන්තු මැතිවරණයක් අරගෙන, අපේ අගමැති කෙනෙක් පත් කර ගෙන අපි ජනාධිපතිතුමාට - (බාධා කිරීම්) එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් පත් කරන බවට මේ වෙලාවේ ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මහින්ද රාජපක්ෂ මහත්මයා අගමැති වෙන්න එන්නේ. නැතිව ඔබතුමන්ලා වාගේ හීන දකින්න නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ජගත් අංගගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 01.17]

**ගරු ජගත් අංගගේ**
**Hon. Jagath Angage**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි අතිශයින්ම සන්තෝෂ වෙනවා, වත්මන් රටේ තත්ත්වය නිවැරදිව අවබෝධ කර ගනිමින් අපේ ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව පිළිබඳව. රටක ජනතාවට, රටේ දේශපාලන ක්‍රියාවලියේ විධිමත්භාවය, අනාගත දැක්ම පිළිබඳව යථාවබෝධයක් තිබෙනවා නම්, කවදාවත් මැතිවරණ ඉල්ලන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටේ දේශපාලන අස්ථාවරය, රටේ අනාගතය පිළිබඳව තිබෙන අවිනිශ්චිතභාවය, රටට පැහැදිලි දැක්මක් නැතිකම, රටේ ස්ථාවරයක් නැති බව දැක්කාම තමයි සාමාන්‍යයෙන් රටක ජනතාව මැතිවරණයක් ඉල්ලලා කෑගහන්නේ. ඔබතුමාත් මමත් මේ තත්ත්වය දැකලා නිවැරදි තැනකට ප්‍රවේශ වීම පිළිබඳව මම විපක්ෂයේ වුණත් ඔබතුමාට මගේ ගෞරවය සහ ස්තුතිය පුද කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක පසුගිය දවස්වල වුණු සිදු වීම ගමරාළ දිව්‍ය ලෝකයේ ගියා වාගේ වැඩක්. ගමරාළ දිව්‍ය ලෝකයේ යන්න බලාපොරොත්තුවෙන් වල්ගේ එල්ලුනා. අතරමඟ බලාගෙන ගියාම දෙයියනේ දිව්‍ය ලෝකයට යන්න බැරි වුණා. අතරමගදී ඇදගෙන වැටුණා. මේකත් අපේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ කබායේ එල්ලිලා දිව්‍ය ලෝකයේ යන්න ගිය ගමනක ප්‍රතිඵල මේ ලැබිලා තිබෙන්නේ. දින 100 ට කලිනුත් දැන් අත ගිලිහිලා මහා ප්‍රපාතයකට ඇදගෙන වැටෙන්න තිබෙන පෙර ලකුණු පහළ වෙලා. දැන් හරි අවිනිශ්චිත තැනක ඉන්නේ. මොකක්ද දැන් මේකට අපි ගන්නා, දෙන උත්තරය කියලා බොහොම අමාරු තැනකට අපි ඉන්නේ. ජනවාරි 08 වැනිදා වන කොට නම් බැලුවා ජනතාවගේ ඉස්සරහාට ගේන්න හොඳ මුහුණක් මොකක්ද තිබෙන්නේ කියලා. පොදු අපේක්ෂකයා කවුද කියලා මාස ගණනක් ලත වෙවී කල්පනා කර කර හිටියා. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට තිබුණු ප්‍රසාදයත් එක්ක එතුමාව ඉස්සරහාට දාගෙන දැන් ගමන පටන් ගත්තා. එතුමා ගමන ගියා. හැබැයි, පුංචි වැරදීමක් වෙලා තිබෙනවා. මේ දවස්වල හරි හයෙන් සැකෙන් දේවාල ගණනේ, කෝවිල් ගණනේ යන තත්ත්වයකට ඇවිල්ලා තිබෙන්නේ. මොකද හේතුව, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ හා හිටපු ජනාධිපතිවරයාගේ සාකච්ඡා වටය. මේ සාකච්ඡා වටය තුළදී පුදුමූ භීතියක් ඇති වෙලා තිබෙන්නේ. මේ දෙපාර්ශවය එක තැනකට ඇවිල්ලා වැඩි යෝජනා ප්‍රමාණයකට එකඟතාවය පළ වුණොත් එහෙම මොකක්ද මේ වෙන්නේ කියලා. මේ අවිනිශ්චිතභාවය තිබෙනවා. දැන් දැන් මේ ඡන්දයක් ඉල්ලලා කෑ ගහන එකේ ප්‍රතිඵලය පිළිබඳව වැඩියෙන් අවබෝධ කර ගන්න පුළුවන් පරිසරය අපට නිර්මාණය වෙලා තිබෙනවා. අපි ඒ පිළිබඳව අතිශයින්ම සන්තෝෂ වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රට බහු ජාතීන් ජීවත් වන රටක්. බහු ආගමිකයන් ජීවත් වන රටක්. පසුගිය කාලයේ අපි දැන ගත්තා එක තැනකට කේන්ද්‍රගත වන කොට තිබෙන්නේ ඒ සංවිධානයේ සම්පාදන. ඒ වාගේම හකීම්ගේ මුස්ලිම් කොංග්‍රසය. ඒ වාගේම හෙළ උරුමයේ අතුරලියේ රතන හාමුදුරුවෝ, චම්පික රණවක මහත්තයලා එක තැනකට ගොනු වෙන කොට මේ ජාතිවාදය, ආගම්වාදය, කුලවාදය මේ සියල්ලම ගොනු වුණු රජයක් බිහි වීමේ ලක්ෂණ අපි දැක්කා. ඒ තුළ කවදාවත් මේක ඉස්සරහාට යන්න බැහැයි කියලත් අපි දැක්කා.

දැන් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාට කියනවා රට බේරා ගැනීම ජාතිවාදී අරගලයක ජයග්‍රහණයක් හැටියට. දැන් ඒ ජයග්‍රහණය පිළිබඳව සමරන කොට කියනවා, ඔය ජාතිවාදී සමරනවා කියලා. මේක තමයි අද මේ රටේ කථා කරන දේ. බෝම්බයකට ගොදුරු නොවී නිදහසේ මේ රට තුළ ජීවත් වීමේ අයිතිය භුක්ති විඳින මේ රටේම ජනතාව තමන්ගේ මුඛය විවර කරලා මෙවැනි ප්‍රකාශන කිරීම තුළ ගම්‍ය වන්නේ කිනම් තත්ත්වයක්ද? නපුංසක භාවය පමණයි. ඒ කථා කරන වචනවල ගැබ් වෙලා තිබෙන්නේ නපුංසකභාවය. තමන් භුක්ති විඳින නිදහසට නිගරු කිරීම. මේක මේ වාගේ රටක මිනිස්සුත් එක්ක තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දවස වන කොට අපට ජීවත් වෙලා ඉන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඉතින් ඒ නිසා දැන් අපට මේ දින 100 ඇතුළත මේ රටේ ජනතාවට වුණු යහපත් දේවල් තිබෙනවා. අපි ඒවා බොහොම ගෞරවයෙන් පිළිගන්න ඕනෑ. මේ දින 100 ට ඉස්සෙල්ලා මේ රටේ තරුණ පරපුර ඉතාමත් අවාසනාවන්ත ඉරණමකට ගොදුරු වෙලා හිටියේ. ඔවුන්ට මේ රටේ යථාර්ථවාදී තත්ත්වයන් අවබෝධ කර ගන්න බැරි වෙලා හිටියේ. මේ රටේ මේ විපක්ෂයක් හැටියට ඉන්න කට්ටියට මේ රටේ විශාල වැඩ කරන්න පුළුවන් පිරිසක්, බොහෝම දක්ෂයින් පිරිසක්, ජාති හිතෛෂීන් පිරිසක් ඉන්නවා විපක්ෂය කියලා. ඒ අය විශ්වාස කර ගෙන ආණ්ඩු පක්ෂයේ තමයි රට විනාශ

**[ගරු ජගත් අංගගේ ]**

කරන අය ඉන්නේ කියලා හිතාගෙන හිටියා. දැන් මේ යකා කලු ද සුදු ද කියලා පොඩි එවුන් ටික දැන ගෙන හිටියේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් යකා මල්ලෙන් එළියට ආවා. එළියට ඇවිල්ලා දැන් යකා සැරිසරනවා මේ දින 100 ඇතුළත. දැන් පොඩි එවුන් ටික, කොල්ලෝ කුරුට්ටෝ සේරම යකා දකිනවා. දැන් යකාගේ ස්වරූපය දැක්ක පොඩි එවුන් අවස්ථාවක් දෙන්න ඕනෑ, මේ රටේ තමන්ගේ අනාගතය පිළිබඳව තීන්දුව ගන්න. ඒ නිසා දැන් මැතිවරණයක් ඕනෑ. මේ මැතිවරණය තුළ මේ රටේ බහුතරයක් තරුණ පිරිස - අද වන කොට අපි ඒ දවස්වල කථා කරපු Face book එක දැන් බැලුවාම පේනවා, කොල්ලෝ කුරුට්ටෝ දැන් මොනවාද තේරුම් අරගෙනද නැද්ද කියලා. රවට්ටගෙන හිටියා. ඒ රැවටීම මොන තරම් ගැඹුරුද? තමන්ගේ අනාගතය මොකක්ද? මේ අල්ලක් වාගේ පුංචි රට තුළ ඇති වෙන්න යන විනාශය මොකක්ද? තමන්ගේ ජනතා පරමාධිපත්‍ය කියන එක වචනයක් බවට පත් වෙයිද? භෞමික අඛණ්ඩතාවය වචනයක් බවට පත් වෙයිද? රටට හෙට යන කල මොකක්ද? අපේ අයියලා අක්කලා දහස් ගණනක් ජීවිත පූජා කරලා අපට ගෙනැල්ලා දීපු දායාදය අපට අහිමි වෙලා යනවාද? මේවා ටික සේරම මේ දින 100 තුළ වන කොට බොහෝ කරුණුවලින් දැක ගන්න ඒ අයට පුළුවන් වුණා. ඒ නිසා අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කියන කාරණාව හරි. දැන් මනෝ මූල තත්ත්වය සහ විෂය මූල තත්ත්වය මෘදු වෙලා. දැන් මැතිවරණයක් ඕනෑ. ඒ මැතිවරණය තුළින් රටේ අනාගතයට මේ වෙන්න යන මහා විනාශය වළක්වා ගන්න පුළුවන්.

ඒ නිසා ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාව අපි හිස නමා ආචාර කොට පිළිගන්නවා. අපේ සහයෝගය ඉතසිතින්ම ලබා දෙනවා. ඒ නිසා මේක අපට කිසිම ගැටළුවක් නොවෙයි. හැබැයි, එක දෙයක් තිබෙනවා. ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා නියම මහත්මයෙක්. එතුමා ඉතාමත් නිවැරදි දැකීමක් ඇති කෙනෙක්. මම එහෙම කියන්නේ. එතුමා මේ පැත්තෙන් ආපු යෝජනාවට, පියල් නිශාන්ත ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවට ඡන්දය නොදී වාඩි වෙලා ඉන්නයි හැදුවේ. මේගොල්ලෝ බලෙන් එතුමාගේ ආත්ම ගරුත්වය කෙළසුවා නැගිට්ටලා. මේ යෝජනාවෙත් කොටසක් තිබෙනවා, ඒකම. ඉතින් මේකට කොහොමද දැන් එතුමා තමන්ගේ ඡන්දය පාවිච්චි කරන්නේ. ඇයි? මේ වාගේ අපහසුතාවයකට මේ මන්ත්‍රීවරුන්ව පත් කරන්නේ. මේක මහා නරක ක්‍රියාවක්. එතුමාගේ ආත්ම ගෞරවය ආරක්ෂා කර ගන්න මේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු එතුමාට ඉඩ තිබ්බේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නමුත් අපි එතුමාව අතරමං කරන්නේ නැහැ. එතුමාව අපි අතරමං කරන්නේ නැහැ. ඒ නිසා අපි ඉතාමත් පැහැදිලිව මේ පවතින තත්ත්වය තුළ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ කාලෝචිත යෝජනාවට අපේ සම්පූර්ණ එකඟතාවය පළ කරනවා. ඒ වාගේම සහයෝගය ලබා දෙනවා. ඔබතුමාට විරාත් කාලයක් යහපත්ව මෙවැනි යහපත් යෝජනා ඉදිරිපත් කිරීමට ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.24]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මෙම යෝජනාවට අදහස් දැක්වූ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට මගේ ගෞරවනීය ස්තුතිය පුද කර සිටිනවා. ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අලුත් ජනවරමකට යා යුතුයි කියලා අදහස් කරන්නේ, දින 100 කට ඉල්ලා ගත්තු රජයක් දිගටම කර ගෙන යන්න බැහැ. මේ රටේ විදේශ ආයෝජකයන්, එහෙම නැත්නම් මේ රටේ ආයෝජනය කරන්න බලාපොරොත්තු වන අය බලාපොරොත්තු වන්නේ ස්ථාවර ආණ්ඩුවක්. කෙටි කාලීන ආණ්ඩුවක ආයෝජනය කරන්න කවුරුවත් කැමැත්තක් දක්වන්නේ නැහැ. ඒ නිසා තමයි අවුරුදු පහක ආණ්ඩුවක් පත් කර ගන්න පුළුවන් අවස්ථාවක අලුත් ජනවරමක් අරගෙන ඒ ජනවරම තුළින් ජනතාවට වැඩ කරන්න නම්, විදේශ ආයෝජනය මේ ලංකාවට ලබා ගන්න නම්, එහෙමත් නැත්නම් මේ රටේ ඉන්න ධනවත් පන්තියේ මුදල් නැවත ආයෝජනය කරන්න නම් දේශපාලන වශයෙන් රටේ ස්ථාවරභාවයක් තිබෙන්න ඕනෑ. අද වන කොට මේ එකතු කර ගත්තු ආණ්ඩුවක් තිබෙන්නේ. මේ බහුතර ආණ්ඩුවකුත් නොවෙයි. සුළුතර ආණ්ඩුවක්. නමුත් එකතු කර ගත්ත ආණ්ඩුවක්. දින 100 කට අපි ඉල්ලා ගත්ත ආණ්ඩුවක් තිබෙන්නේ. ඒ නිසා තමයි අපි කියන්නේ, මේ ආණ්ඩුව විසුරවලා නැවත ජනවරමකට යන්න ඕනෑය කියලා. ඒකෙන් අපි අදහස් කරන්නේ නැහැ අපට මේක කර ගෙන යන්න බැහැයි කියලා. අපට එක්සත් ජාතික පක්ෂය වශයෙන් තව බහුතර

බලයක් ගන්න පුළුවන්. අරගෙන මේ රටේ සංවර්ධනය කරා ගෙන යන්න පුළුවන් ආණ්ඩුවක් බිහි කරන්න අපට හැකියාව තිබෙන නිසා තමයි අපි කියන්නේ, අපි ඡන්දයකට ගිහිල්ලා, ජනතාවගේ වරම අරගෙන මේ වරම තුළින් ජනතාවට වැඩ කරන්න අවස්ථාවක් ලබා දෙන්නය කියලා. මොකද, දැන් ඉන්නේ, ජනතාව ප්‍රතික්ෂේප කරපු මන්ත්‍රීවරු ඉන්න ආණ්ඩුවක් තමයි අද තිබෙන්නේ. අද වන කොට. විශේෂයෙන්ම අපි දන්නවා. ඔය කවුරු මොනවා කිව්වත්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ජයග්‍රහණය කරන්න ඒ පැත්තේ ඉඳන් මේ පැත්තට පැන්න කට්ටියගෙත් ඉන්නවා ප්‍රශ්න තිබෙන අය. හොරකම්, දූෂණ, වංචා කරපු අය ගොඩක් මේකටත් එකතු වෙලා ඉන්නවා. ඉතින් මේක සුද්ද කරලා, පිරිසිදු කරලා අරගෙන ජනතාව අපේක්ෂා කරන -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒවා වහ ගන්න නේ ඇවිල්ලා ඉන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වෙන්න පුළුවන්. ඒක වහ ගන්න වෙන්න පුළුවන් කියලා අපි දන්නවා. ඉතින් ඒක තමයි අපි ඉල්ලන්නේ. ජනතාව අපේක්ෂා කරන පිරිසිදු අලුත් පාලකයෝ ටිකක්, මේ රටට අලුත් පාර්ලිමේන්තුවක් හරහා ගෙනැත් දෙන්න. මේ පාර්ලිමේන්තුවේ අපි නොවෙයි. ආණ්ඩු පක්ෂයයි, විපක්ෂයයි දෙකම කථා කරද්දී කිව්වේ කුඩුකාරයෝ ඉන්නවා. එතනෝල්කාරයෝ ඉන්නවා. හොරු ඉන්නවා. දූෂකයෝ, මංකොල්ලකාරයෝ, වංචාකාරයෝ. ඉතින් මේගොල්ලන්ව පිරිසිදු කරලා ගන්න පුළුවන්. ජනතාව කැමැති පාර්ලිමේන්තු මන්ත්‍රී කණ්ඩායමක් පත් කරලා, අලුත් ජනවරමක් තුළින් මේ රට ඉදිරියට ගෙන යන්න පුළුවන් අවුරුදු පහකට ස්ථාවර ආණ්ඩුවක් පිහිටුවන්න පුළුවන් ජනවරමක් ලබා ගෙන මේ රටේ ජනතාවට සේවය කරන්න ඒ අවස්ථාව ලබා දෙන්න තමයි අපි කියන්නේ, අලුතෙන් ඡන්දයකට යන්න ඕනෑය කියලා. නැත්නම් මේක අපි මේ හයෙන් ඉක්මණට තියා ගන්නවත්, එහෙම නැත්නම් අපේ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා වාගේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජනතා නිදහස් සන්ධානයත් දෙකට කැඩිලා ඉන්න අවස්ථාවක අපට මේකේ ලාභ ප්‍රයෝජන ගන්න නොවෙයි. නමුත් ස්ථාවර ආණ්ඩුවක් මේ රටට අවශ්‍යයි. නැත්නම් මේ රටේ තව මාස හයක් මෙහෙම ඇදගෙන ගියොත් මේ රටට ආයෝජකයෝ එන්නේ නැහැ. ඉතින් ඒ නිසා මේ රට දියුණු කරන්න සියලුම දෙනාගේ කැමැත්ත තිබෙනවා නම්, ස්ථාවර ආණ්ඩුවක් පිහිටුවන්න අපට අවශ්‍යයි. ඒ වාගේම ප්‍රාදේශීය සභා, නගර සභා අර ඉස්සෙල්ලා කිව්වා වාගේ ප්‍රශ්න ගොඩක් තිබෙන ආයතන තිබෙනවා. ඉතින් මේ ආයතනත් එක්ක තමයි පසුගිය ජනාධිපතිවරණයට මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා ගියේ සහයෝගයත් ඇතිව. ඉතින් ඒකත් අද වන කොට ප්‍රතික්ෂේප වෙලා තිබෙනවා. කල් ඉක්මවලා තිබෙනවා. ඉතින් ඒකත් අද අලුත් ජනවරමකට යන්න කාලය ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා ගමටත්, ප්‍රදේශයටත්, පළාතටත්, රටටත් අලුත් මන්ත්‍රී කණ්ඩායමක් පත් කර ගෙන අලුත් ජනතා අපේක්ෂාවක් එක්ක ඉස්සරහාට යන්න ඒ කටයුත්ත ඉෂ්ට කරලා දෙන්නය කියලා අතිගරු ජනාධිපතිතුමාගෙනුත්, ඒ වාගේම රජයෙනුත් අපි ඉල්ලා සිටිනවා. ඒ එක්කම මගේ යෝජනාවට සහයෝගය දුන්න ඔබ සියලුම දෙනාට, පක්ෂ විපක්ෂ දෙගොල්ලෝම මේ කරුණ අවබෝධ කර ගෙන ඒ ලබා දුන්න සහයෝගයට මගේ ස්තුතිය පුද කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් මම මෙම සභාව කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.29 ට, 2015 මැයි මස 26 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 01.29 p.m till 09.30 a.m, on 26.05.2015.*